207 වන කාණ්ඩය - 6 වන කලාපය
தொகுதி 207 - இல. 6
**Volume 207 - No. 6**

2012 මාර්තු 09වන සිකුරාදා
2012 மார்ச் 09, வெள்ளிக்கிழமை
**Friday, 09th March, 2012**

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු


**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**නොපැමිණීමේ අවසරය:**
ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා
ගරු ආර්. දුමින්ද සිල්වා මහතා

**වරප්‍රසාද :**
අධිකරණයේදී පාර්ලිමේන්තු වරප්‍රසාද ලත් සන්නිවේදන භාවිත කිරීම

**පෞද්ගලික මන්ත්‍රීන්ගේ යෝජනා:**
අය වැය සම්මත කිරීමට පෙර පූර්ව අය වැය විවාදයක් පැවැත්වීම
වෛද්‍ය ක්ෂේත්‍රයේ වෘත්තීමය වටිනාකම සුරැකීම
කාදි අධිකරණ පද්ධතියට නිසි ස්ථානය ලබා දීම

**රණ කලා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත:**
දෙවන වර කියවා "බී" ස්ථාවර කාරක සභාවට පවරන ලදී

**සත්ව සුභසාධන පනත් කෙටුම්පත:**
දෙවන වර කියවා "බී" ස්ථාවර කාරක සභාවට පවරන ලදී

**ආචාර්ය මාලිනී ෆොන්සේකා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත:**
දෙවන වර කියවා "බී" ස්ථාවර කාරක සභාවට පවරන ලදී

**මොනරාගල දිස්ත්‍රික් කාන්තා මහා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත:**
දෙවන වර කියවා "බී" ස්ථාවර කාරක සභාවට පවරන ලදී

**ද.මු. දසනායක සමාජ සත්කාරක හා පුණ්‍යාධාර පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත:**
දෙවන වර කියවා "ඒ" ස්ථාවර කාරක සභාවට පවරන ලදී

**ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු**


# பிரதான உள்ளடக்கம்


**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**வராதிருக்க அனுமதி:**
மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல
மாண்புமிகு ஆர். துமிந்த சில்வா

**சிறப்புரிமை:**
பாராளுமன்ற சிறப்புரிமைசார் தகவலை நீதிமன்றத்தில் பயன்படுத்தல்

**தனிநபர் பிரேரணைகள்:**
வரவு செலவுத்திட்டம் நிறைவேற்றப்படுவதற்கு முன்னர் பூர்வாங்க வரவு செலவுத்திட்ட விவாதமொன்று நடத்துதல்
மருத்துவத் துறையின் தொழில்சார் பெறுமதியினைப் பேணல்
காதி நீதிமன்ற முறைமைக்கு உயர்ந்த இடத்தைப் பெற்றுக்கொடுத்தல்

**தற்காப்புக் கலைகளுக்கான நிறுவகம் (கூட்டிணைத்தல்) சட்டமூலம்:**
இரண்டாம்முறை மதிப்பிடப்பட்டு நிலைக்குழு 'பி' க்குச் சாட்டப்பட்டது

**விலங்கின நலம்பேணல் சட்டமூலம்:**
இரண்டாம்முறை மதிப்பிடப்பட்டு நிலைக்குழு 'பி' க்குச் சாட்டப்பட்டது

**கலாநிதி மாலினி பொன்சேகா மன்றம் (கூட்டிணைத்தல்) சட்டமூலம்:**
இரண்டாம்முறை மதிப்பிடப்பட்டு நிலைக்குழு 'பி' க்குச் சாட்டப்பட்டது

**மொனறாகல மாவட்ட கான்த்தா மஹா சங்கமய (கூட்டிணைத்தல்) சட்டமூலம்:**
இரண்டாம்முறை மதிப்பிடப்பட்டு நிலைக்குழு 'பி' க்குச் சாட்டப்பட்டது

**த.மு. தசநாயக்க சமூக சேவைகளும் அறக்கட்டளை தர்மஸ்தாபனமும் (கூட்டிணைத்தல்) சட்டமூலம்:**
இரண்டாம்முறை மதிப்பிடப்பட்டு நிலைக்குழு 'ஏ' க்குச் சாட்டப்பட்டது

**வினாக்களுக்கு எழுத்துமூல விடைகள்**


# PRINCIPAL CONTENTS


ORAL ANSWERS TO QUESTIONS

LEAVE OF ABSENCE:
Hon. Keheliya Rambukwella
Hon. R. Dumindha Silva

PRIVILEGE:
Use of Privileged Communications of Parliament in Court

PRIVATE MEMBERS' MOTIONS:
Pre-Budget Debate Prior to Passing of Budget
Protecting the Professional Dignity of the Medical Field
Granting a Higher Position to the Quazi Court System

INSTITUTE OF MARTIAL ARTS (INCORPORATION) BILL:
Read the Second time and allocated to Standing Committee"B"

ANIMAL WELFARE BILL:
Read the Second time and allocated to Standing Committee "B"

(DR.) MALANI FONSEKA FOUNDATION (INCORPORATION) BILL:
Read the Second time and allocated to Standing Committee "B"

MONERAGALA DISTRICT KANTHA MAHA SANGAMAYA (INCORPORATION) BILL:
Read the Second time and allocated to Standing Committee "B"

D.M. DASSANAYAKE SOCIAL SERVICES AND CHARITY FOUNDATION (INCORPORATION) BILL:
Read the Second time and allocated to Standing Committee "A"

WRITTEN ANSWERS TO QUESTIONS

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2012 මාර්තු 09වන සිකුරාදා***
*2012 மார்ச் 09, வெள்ளிக்கிழமை*
*Friday, 09th March, 2012*

***අ. භා. 1.30ට පාර්ලිමේන්තුව රැස් විය. කථානායකතුමා [ගරු චමල් රාජපක්ෂ මහතා] මූලාසනාරූඪ විය.***
*பாராளுமன்றம் பி. ப. 1.30 மணிக்குக் கூடியது. சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சமல் ராஜபக்ஷ] தலைமை வகித்தார்கள்.*
*The Parliament met at 1.30 p. m.*, MR. SPEAKER [THE HON. CHAMAL RAJAPAKSA] *in the Chair.*

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - நீர்வழங்கல், வடிகால மைப்பு அமைச்சரும் அரசாங்கத் தரப்பின் முதற்கோலாசானும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Water Supply and Drainage and Chief Government Whip)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම 2009 වර්ෂය සඳහා මාර්ග සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව වරාය හා මහාමාර්ග කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමා වෙනුවෙන් මම 2010 වර්ෂය සඳහා ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු මහින්ද අමරවීර මහතා (ආපදා කළමනාකරණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த அமரவீர - அனர்த்த முகாமைத்துவ அமைச்சர்)
(The Hon. Mahinda Amaraweera - Minister of Disaster Management)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) දොඩම්ගස්ලන්ද, අදාපොල, කපුරු බණ්ඩාර ස්ටෝර්ස් යන ලිපිනයෙහි පදිංචි ටී.එච්. ලේකම්ගේ මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) තිස්සමහාරාමය, විජිතපුර, කැලණිතිස්ස මාවත, "නිසංසලා" යන ලිපිනයෙහි පදිංචි එන්.ටී. පියසේන මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා (විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரஞ்ஜித் சியம்பலாபிட்டிய - தொலைத் தொடர்புகள், தகவல் தொழில்நுட்பவியல் அமைச்சர்)
(The Hon. Ranjith Siyambalapitiya - Minister of Telecommunication and Information Technology)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් තුන පිළිගන්වමි.

(1) රඹුක්කන, කොටගම යන ලිපිනයෙහි පදිංචි ආර්.එම්.පී. අබේසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) මාවනැල්ල, බදුරියා පාර, 1/9 යන ලිපිනයෙහි පදිංචි එස්.එම්.එච්.කේ.එස්.ජේ. හසිනි මහත්මියගෙන් ලැබුණු පෙත්සම; සහ

(3) කැගල්ල, පොල්ගහවෙල පාර, අංක 137 යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්.එම්.එන්. විජේසේකර මහතාගෙන් ලැබුණු පෙත්සම.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ගරු නන්දිමිත්‍ර ඒකනායක මහතා - පැමිණ නැත.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු කථානායකතුමනි, මම රාගම මත්තුමගල, මීගමුව පාර, අංක 658/12 යන ලිපිනයෙහි පදිංචි ජගත් චම්පික රණසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**ගරු පොන්. සෙල්වරාසා මහතා**
(மாண்புமிகு பொன். செல்வராசா)
(The Hon. Pon. Selvarasa)

கௌரவ சபாநாயகர் அவர்களே, மட்டக்களப்பு, திமிலதீவு, டானியல் சதுக்கம், 10 ஆம் இலக்க இல்லத்தில் வசித்துவரும் திரு.கணபதிப்பிள்ளை தவராசா என்பவரிடமிருந்து கிடைத்த மனு ஒன்றையும், மட்டக்களப்பு, நாவற்குடா, படுகாட்டார் வீதி, 10 ஆம் இலக்க இல்லத்தில் வசித்துவரும் எம் பரமேஸ்வரன் என்பவரிடமிருந்து கிடைத்த மனு ஒன்றையும் சமர்ப்பிக்கின்றேன்.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) කුලියාපිටිය,පඩිවෙල,අනුක්කන යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්.එම්.ගුණරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) කුලියාපිටිය, ගයියාල යන ලිපිනයෙහි පදිංචි එස්.එච්. ජුවානිස් මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) අනුරාධපුර, යසපාල හේරත් මාවත, හේනවත්ත යන ලිපිනයෙහි පදිංචි ගාමිණී අබේසිරි සමරනායක මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) පානදුර, වත්තල්පොල, තොටවත්ත පාර, අංක 6 ඒ යන ලිපිනයෙහි පදිංචි විජයරත්න විතාන මහතාගෙන් ලැබුණු පෙත්සම.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු කමලා රණතුංග මෙනෙවිය - පැමිණ නැත.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 1-0598/'10 - (4), ගරු රවි කරුණානායක මහතා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා (මුදල් හා ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன - நிதி, திட்டமிடல் பிரதி அமைச்சர் )
(The Hon. Gitanjana Gunawardena - Deputy Minister of Finance and Planning)
ගරු කථානායකතුමනි, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක් කල් ඉල්ලනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 2 -1082/11- (2), ගරු බුද්ධික පතිරණ මහතා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා (අධ්‍යාපන අමාත්‍යතුමා)**
(மாண்புமிகு பந்துல குணவர்தன - கல்வி அமைச்சர்)
(The Hon. Bandula Gunawardane - Minister of Education)
ගරු කථානායකතුමනි, කින්නියා ප්‍රදේශයේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමා එවා තිබෙන පිළිතුර තවදුරටත් පරීක්ෂා කර බලා, වඩා නිවැරදි පිළිතුරක් විස්තරාත්මකව ලබා දෙන්න සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## කොළඹ හිල්ටන් හෝටලය විකිණීම : විස්තර
### கொழும்பு ஹில்டன் ஹோட்டல் விற்பனை : விபரம்
### SALE OF COLOMBO HILTON HOTEL : DETAILS

1316/'11

3. **ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) (i) කොළඹ හිල්ටන් හෝටලය රජයට පවරා ගනු ලැබූ දිනය කවදාද;

(ii) එය රජයට පවරා ගැනීමට හේතුවූ කරුණු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රජය නැවත එම හෝටලය විකිණීමට සැලසුම් කර තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා තීරණය කර ඇති වටිනාකම කොපමණද;

(iii) එය මිලදී ගනු ලබන පුද්ගලයා හෝ ආයතනය කවරේද;

(iv) එම ගනුදෙනුව සිදු කරනු ලබන්නේ බදු පදනම යටතේද; නැතහොත් ස්ථිර පදනම යටතේද;

(v) එම මිලදී ගැනීම බලපවත්නා කාල වකවානුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

நிதி திட்டமிடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கொழும்பு ஹில்டன் ஹோட்டல் அரசாங்கத் தினால் சுவீகரிக்கப்பட்ட திகதி யாதென் பதையும்;

(ii) இதை அரசாங்கம் சுவீகரித்தமைக்கான காரணம் யாதென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) அரசாங்கம் இந்த ஹோட்டலை மீண்டும் விற்பதற்கு நடவடிக்கை எடுக்கின்றதா என்பதையும்;

(ii) ஆமெனில், இதற்காக தீர்மானிக்கப்பட்டுள்ள பெறுமதி எவ்வளவென்பதையும்;

(iii) இதனை கொள்வனவு செய்கின்ற நபர் அல்லது நிறுவனம் யாதென்பதையும்;

(iv) மேற்படி கொடுக்கல்வாங்கல் இடம்பெறுவது குத்தகை அடிப்படையிலா அல்லது நிரந்தர அடிப்படையிலா என்பதையும்;

(v) மேற்படி கொள்வனவு எவ்வளவு காலத்திற்கு நடைமுறையிலிருக்குமென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Finance and Planning:

(a) Will he inform this House-

(I) of the date on which the Colombo Hilton hotel was taken over by the Government; and

(ii) of the reasons that led to this hotel being taken over by the Government?

(b) Will he inform this House-

(i) whether the Government is planning to sell that hotel again;

(ii) if so, the value of it;

(iii) the individual or institution that purchases the hotel;

(iv) whether the transaction is going to be executed on lease or permanent basis; and

(v) the period during which this purchase will be valid?

(c) If not, why?

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன )
(The Hon. Gitanjana Gunawardena)

ගරු කථානායකතුමනි, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) 2011 නොවැම්බර් 09වන දින කොළඹ හිල්ටන් හෝටලයේ කළමනාකරණ සමාගම වන හොටෙල් ඩිවලොපර්ස් ලංකා පීඑල්සී සමාගමේ රජය සතුව තිබූ සියයට 65ක කොටස් ප්‍රමාණයට අමතරව සුළුතර කොටස් හිමියන් සතුව තිබූ ඉතිරි සියයට 35ක කොටස් 2011 අංක 43 දරන ඌන ක්‍රියාකාරි ව්‍යවසායන් සහ ඌන උපයෝජිත වත්කම් පුනරුදය කිරීමේ පනත මඟින් රජයට පවරා ගනු ලැබීය.

(ii) හොටෙල් ඩිවලොපර්ස් ලංකා පීඑල්සී සමාගමේ කළමනාකරණයේ පහත සඳහන් කරුණු ඇතුළු ඌන ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම.

01. හොටෙල් ඩිවලොපර්ස් ලංකා පීඑල්සී සමාගම විසින් 2011 මාර්තු 31 දින වන විට පොලී මුදලත් සමඟ පොරොන්දු පත්‍ර සඳහා රජය වෙත ගෙවිය යුතු මුදල රුපියල් මිලියන 12,908ක් පමණ වීම.

02. හෝටලය තදබල ලෙස මූල්‍ය දුෂ්කරතාවන්ට මුහුණ දී ඇති බැවින් සමාගම් පනත යටතේ දිගු කාලීන පැවැත්ම අවිනිශ්චිත බව විගණකවරුන් විසින් මත පළ කිරීම.

(ආ) (i) නැත.

(ii) පැන නොනඟී.

(iii) පැන නොනඟී.

(iv) පැන නොනඟී.

(v) පැන නොනඟී.

(ඇ) පැන නොනඟී.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු කථානායකතුමනි, හිල්ටන් හෝටලය සම්බන්ධව තිබුණ වාතාවරණයත් එක්ක එහි සියයට 56ක කොටස් තිබුණේ කෝනල් පෙරේරා මහත්මයාගේ සම්බන්ධකම් තිබිච්ච පිරිස්වලට. විශේෂයෙන් පසු ගිය මාර්තු මාසයේ ජපානයේ සමාගමට ගෙවන්න තිබිච්ච ප්‍රමාණයත් ගෙවලා අවසන් කරලා තිබෙනවා. ගරු කථානායකතුමනි, සුප්‍රිම් උසාවියෙන් දුන්නු නඩු තීන්දුව මා ළඟ තිබෙනවා. ඒ නඩු තීන්දුවේ ගෞරවණීය විනිශ්චයකාරතුමන්ලා බොහොම පැහැදිලිව කියන්නේ, අවශ්‍ය කරන settlement එකට ඇවිල්ලා, කෝනල් පෙරේරා මැතිතුමාඇතුළු පිරිසට හෝටලය පවත්වා ගෙන යන්න නැවත භුක්තිය භාර දෙන්න කියලායි. ඒ නඩුවේ නීතිඥවරයා විධියට වැඩ කටයුතු කළේ ඩී.එස්. විජේසිංහ මැතිතුමායි. එතුමා එවකට හිටපු නීතිපති, මොහාන් පීරිස් මැතිතුමාත් එක්ක දිගින් දිගටම ඒ සම්බන්ධව සාකච්ඡා කළා.නමුත් රජය පැත්තෙන් - නීතිපතිතුමාගේ පැත්තෙන්- මේක දිගින් දිගටම කල් දමමින් සිටියා මිසක් මේ සම්බන්ධයෙන් කිසිදු තීන්දුවක් ගත්තේ නැහැ, ගරු කථානායකතුමනි. ඒ නිසා තමයි මේ පවරා ගැනීම සම්බන්ධයෙන් සමථයකට එන්න තිබෙද්දී ඌන ක්‍රියාකාරී ව්‍යවසායන් සහ ඌන උපයෝජිත වත්කම් පුනරුදය කිරීමේ පනත් කෙටුම්පත යටතට හිල්ටන් හෝටලයත් තල්ලු කර ගත්තේ. ඒ නිසා මම බොහොම පැහැදිලිව ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් අහන්න කැමැතියි, 2011 මාර්තු මාසයේදී මේ අවසන් තීරණය ඇවිල්ලා, මේ හිල්ටන් හෝටලය නැවත පෙර අයිතිකරුවන්ට බාර දෙන්නය කියා නියෝගයක් ලැබුණේ නැද්ද කියා?

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)

මම දන්නා හැටියට නම් ඉතා පැහැදිලිවම මෙය පවරා ගැනීමට කටයුතු කරලා තිබෙන්නේ 2011 නොවැම්බර් 9වැනි දා විවාදයට ගත් පනත් කෙටුම්පත අනුවයි. එදින හැන්සාඩ් වාර්තාවේ 1029 සහ 1030 යන columnsවල ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමා දින වකවානු සහිතව ඒ කාරණය පැහැදිලි කර තිබෙනවා. මම ආපසු එය කියවන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. ගරු මන්ත්‍රීතුමනි, මම හිතන්නේ ඔබතුමාත් ඒ විවාදයට සම්බන්ධ වුණා කියලායි. මේ කාරණය එහිදී පැහැදිලි කළා. මේ පනතේ පළමුවැනි උප ලේඛනය අනුව මේ හෝටලය පවරා ගැනීමට විධිවිධාන සලස්වා තිබුණා. ඒ අනුව දැන් එය පවරා ගැනීමට කටයුතු යොදා තිබෙනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, එතුමා ඒ සම්බන්ධයෙන් දැන ගෙන හිටියේ නැහැ. එතුමා ඒ සම්බන්ධයෙන් උත්තරයක් දේවිය කියා මම බලාපොරොත්තු වුණා. නමුත් ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා එදා කළ පිළිතුරු කථාවේ කරුණුයි එතුමා උත්තරය සඳහා පාවිච්චි කළේ.

ගරු කථානායකතුමනි, දෙවන අතුරු ප්‍රශ්නය විධියට මා මේ කාරණය අහන්නට කැමැතියි. ගරු කථානායකතුමනි, මේ හිල්ටන් හෝටලය ලංකාවට එනකොට කිසිදු වැදගත්ය කියා පිළිගන්නට පුළුවන් හෝටලයක් ලංකාවේ තිබුණේ නැහැ. අද ෂැන්ග්‍රි-ලා එක ඇවිත් තිබෙනවා. මේ ඇති වෙලා තිබෙන වාතාවරණයත් එක්ක තව තවත් ඒවා ඇවිත් තිබෙනවා. නමුත් එදා බොහොම අමාරුවෙන් මේ ආයෝජනය ලංකාවට ගෙනාවේ. එහෙම ගෙනැවිත් ඒ අවශ්‍ය ටික කර අවසාන වෙලා තමයි මේ වැඩ කටයුතු ටික කළේ. මේ lease agreement එක අවසාන වෙන්නේ 2022 වර්ෂයේදීයි. එතකොට තමයි අදාළ කරන ප්‍රමාණයන් අවුරුද්දෙන් අවුරුද්ද ගෙවා ගෙන යන්නට තිබුණේ. එම නිසා මා බොහොම පැහැදිලිව කියන්නේ ඇත්ත වශයෙන්ම කෝනල් පෙරේරා වැනි ලංකාවේ ව්‍යාපාරිකයෙකු ජපානයේ ඉන්න ජපන් ජාතිකයෙකුත් එක්ක එකට එකතු වෙලා මේ වැඩ පිළිවෙළ සකස් කළායින් පස්සේ මේ කළ අපරාධයෙන් -මේ පවරා ගැනීමෙන්- සිද්ධ වෙන්නේ වෙන දෙයක් නොවෙයි, ගරු කථානායකතුමනි. ලංකාවේ ව්‍යාපාරිකයෙකුට වුවත් අද පිට රට ගිහින් පිට රට ඉන්න ව්‍යාපාරිකයෙකුට කථා කරන්නට බැරි තත්ත්වයකට පත් වී තිබෙනවා. එම නිසා මා අහන්නට කැමතියි, මේ ආයතනය නැවත පවරා දෙන්න Delta කියන කොම්පැනියත් එක්ක - මා මෙය උපුටා ගන්නේ ජයදේව මුකුන්ඩා මූඩි- [බාධා කිරීමක්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අතුරු ප්‍රශ්නය කියන්න. ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා, ඔය විස්තර ඕනෑ නැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒකත් එක්ක තමයි මම කිව්වේ. මේ ආයතනය නැවත පවරා දීමට මේ ආණ්ඩුව ජයදේව් මුකුන්ඩා මූඩි නැමැති ව්‍යාපාරිකයාට පොරොන්දු වෙලා තිබෙනවා ද කියන එක තමයි මම අහන්නේ. මොකද මේ ගැන දිගින් දිගටම සාකච්ඡා වෙලා තිබෙන නිසා මම මේ කියන්නේ.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා දීර්ඝ ප්‍රශ්නයක් මතු කළා. මේ ගරු සභාවත්, ජනතාවත් නොමඟ යවන්නට නොදී ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා එදා මේ සභාවට කළ ප්‍රකාශය නැවත වරක් කියවන්නටය කියා මා ඔබතුමාගෙන් අවසර ඉල්ලනවා.

2011 නොවැම්බර් 09 වන දා හැන්සාඩ් වාර්තාවේ 1030 තීරුවේ එතුමාගේ කථාවේ මේ විධියට තිබෙනවා:

"මේ ගනුදෙනුව කළේ කොහොමද කියන එක ගැන වාර්තා වෙන විධියට මම පොඩි සඳහනක් කරන්නම්. මේ ඉඩමේ ප්‍රමාණය අක්කර 6.6ක්. මෙහි ආයෝජනය කරන්න කොනල් පෙරේරා නමැත්තාට දුන්නා, 1984 පෙබරවාරි මස 7 වෙනි දා. නාගරික සංවර්ධන අධිකාරියෙන් ඒකේ වටිනාකම ලෙස දැම්මේ මිලියන 136යි. ඒ, 7 වෙනි දා. හරියටම දින 8කට පසුව, එනම් 15 වෙනි දා කොනල් පෙරේරා මේක Hotel Developers Lanka PLC වෙත දුන්නා, මිලියන 250කට Value කරලා. දවස් හතකදී මිලියන 114කින් අගය වැඩි කළා. එහෙම කරලා ඒ කොටස් අරගෙන අර රුපියල් මිලියන 136 ගෙව්වේ නැහැ."

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මම එතුමාගෙන්-

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
මේ, ඔබතුමා අහපු ප්‍රශ්නයට මම දෙන පිළිතුර. [බාධා කිරීමක්] අවසරයි කථානායකතුමනි, ඒක මගේ අයිතිය. [බාධා කිරීමක්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා, අහගෙන ඉන්න. ගරු නියෝජ්‍ය ඇමතිතුමා විස්තර කරලා දෙයි. ඔබතුමා දීර්ඝව තොරතුරු කිව්වා නම් එතුමාටත් අයිතිය තිබෙනවා දීර්ඝව පිළිතුරු දෙන්න.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
එයා ගෙව්වේ රුපියල් මිලියන 28යි. [බාධා කිරීමක්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, ඒක නොවෙයි මම ඇහුවේ. [බාධා කිරීමක්]

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
ඔබතුමාට අහපු ප්‍රශනයට උත්තරය දෙන්නයි මම උත්සාහ කරන්නේ. ඔබතුමා අහනවා කොනල් පෙරේරා මහත්මයාට වන්දි ගෙවන්නේ නැත්තේ මොකද කියලා. ඒ ප්‍රශ්නයට උත්තරය මේ කථාවේ තිබෙනවා. [බාධා කිරීමක්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා, අහපු ප්‍රශ්නයට දීර්ඝව පිළිතුරු දෙනවා. ඔබතුමාත් දීර්ඝව ප්‍රශ්නය ඇහුවා නේ. ගරු නියෝජ්‍ය ඇමතිතුමා පිළිතුර කෙටියෙන් කිව්වා නම් හොඳයි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
හරි, හරි. කියන්න.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
එම හැන්සාඩ් වාර්තාවේම තව දුරටත් මේ විධියට සඳහන්ව තිබෙනවා:

"එයා ගෙව්වේ මිලියන 28යි. මුලින් ගෙව්වේ මිලියන 28යි. අනෙක් ටික කොටස් වශයෙන් ගෙවන්න ගත්තා. හැබැයි, ඊට පසුව එකම වාරිකයක්වත් ගෙව්වේ නැහැ. යම් යම් ගනුදෙනු කළත් මේක ආණ්ඩුව නැවත පැවරුවේ නැහැ. ජපන් සමාගමක් එක්ක කොන්ත්‍රාත් ගිවිසුමක් ගහලා ණයක් ගත්තා. ආයෝජනය කරනවාය කියපු ප්‍රමාණය ආයෝජනය කළේ නැහැ. ඊ ළඟට, ආණ්ඩුවෙන් මේකට guarantee එකක් දුන්නා. ණය නොගෙවපු නිසා ඒ guarantee එකට අදාළ සියල්ලක්ම ගෙවන්න රජයට සිද්ධ වුණා. ඒකට පෙනී සිටියේ කේ.එන්. චොක්සි මහතායි."

ගරු කථානායකතුමනි, ඒකයි මම කිව්වේ මේ ගනුදෙනුවේ ණය හැටියට තිබෙන මිලියන 12,098ක් අද රජයේ වගකීමක් බවට පැවරිලා තිබෙනවා කියලා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මේ සම්බන්ධව උසාවිය නඩු තීන්දුවක් දීලා තිබෙනවා.[බාධා කිරීමක්] ඒක තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේ ප්‍රශ්නයක්. තමුන්නාන්සේලා ඒක බේරා ගන්න. 2011 මාර්තු මාසයේ මේ සම්බන්ධව තීන්දුවක් දීලා තිබෙනවා. ඩී.එස්. විජේසිංහ නීතිඥතුමා බොහොම පැහැදිලිව දහ පාරකට වැඩිය කිව්වා මේකට-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
තීන්දුවක් දීලා තිබෙනවාද කියලා අහන්න. ඒ ඇති.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඉන්න කෝ. මම කියන්නම්. මම ඒ ප්‍රශ්නය අහන්නයි හදන්නේ. කරදර කරන්න එපා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
තමුන්නාන්සේ ඔහොම ප්‍රශ්න අහනවා නම් ඒකට ඉඩ දෙන්න බැහැ. තමුන්නාන්සේ කෙටියෙන් අතුරු ප්‍රශ්නය අහන්න කෝ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මේ ප්‍රශ්නයටම අදාළ ප්‍රශ්නයක් ගරු කථානායකතුමනි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අදාළ ප්‍රශ්නය විතරක් අහන්න, විස්තර නැතිව.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
එහෙම එකඟතාවක් තිබෙද්දී ආණ්ඩුව මේ ව්‍යාපාරය පවරා ගත්තා, ආණ්ඩුවේ වුවමනාව මත.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒ කථා අනවශ්‍යයි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මම අහන්න කැමැතියි, මේ ව්‍යාපාර කොටස් නැවත ලබා දෙන්න ආණ්ඩුව කටයුතු කරන කොට, ඒ පුද්ගලයන් පිළිබඳව යම් කිසි විධියේ ප්‍රමුඛතාවක් ඔබතුමන්ලා දෙනවාද කියලා. මොකද, මේ සම්බන්ධයෙන් දැවැන්ත වියදමක් කොනල් පෙරේරා මැතිතුමා කරලා තිබෙනවා. ඒ නිසා එතුමා පාරට වැටිලා ඉන්නේ.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
මම ඒක දැන් සඳහන් කළා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මම හිතන හැටියට ප්‍රශ්නයට පැහැදිලිව පිළිතුරු දුන්නා.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
ගරු කථානායකතුමනි, තව එක වචනයක් කියන්න ඕනෑ. මේ පනතේ 2 වන වගන්තිය ප්‍රකාරව අභියාචනා මණ්ඩලයක් තිබෙනවා. ඒ කොටස් පිළිබඳව ගෙවීම් කරන කොට, එහි යම් කිසි ප්‍රශ්නයක් තිබෙනවා නම්, එම අභියාචනා මණ්ඩලයට කරුණු ඉදිරිපත් කරන්නට පුළුවන්. එතකොට අභියාචනා මණ්ඩලය තීරණය කරයි ඒ ඉල්ලීම සාධාරණද, නැද්ද කියලා. ඒ අවස්ථාව මේ පනත මඟින් දීලා තිබෙනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි, පැහැදිලියි.

ප්‍රශ්න අංක 7-1847/'11- (2), ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ගරු කථානායකතුමනි, මා ඒ ප්‍රශ්නය අහනවා.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
ගරු කථානායකතුමනි, මෙම ප්‍රශ්නය ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය වෙත යොමු කරන ලෙස ඉල්ලා සිටිනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හම්බන්තොට ලුණු ලේවායේ සුළු සේවකයන්ට නිවාස ලබා දීමේ වැඩ පිළිවෙළක් තිබෙනවාද කියලායි එතුමා අහන්නේ.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ඔව් ගරු කථානායකතුමනි, මෙතුමාගේ අමාත්‍යාංශය යටතේ තමයි ලුණු කර්මාන්තයේ කටයුතු එන්නේ.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
ලුණු ලේවායේ සේවකයන් කියලායි අහන්නේ.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ලේවායේ වුණාට නිවාස ගැනයි අහන්නේ.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
ප්‍රශ්නය පැහැදිලි නැති නිසා ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය වෙත යොමු කරනවා.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
එහෙම නම් ඔබතුමා මේ ප්‍රශ්නය ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය වෙත යොමු කරලා පිළිතුරක් ලබා දෙනවාද?

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
අපි මේ ප්‍රශ්නය එම අමාත්‍යාංශයට යොමු කරනවා.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
බොහොම ස්තුතියි.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 9-2028/'11 -(2), ගරු සජිත් ප්‍රේමදාස මහතා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## දේශීය පොල් වගාවේ ඉහළ ඵලදාව : ක්‍රියා මාර්ග
## உள்ளூர் தெங்கு உற்பத்தியில் உயர் விளைச்சல்: நடவடிக்கை
## HIGH YIELD IN LOCAL COCONUT CULTIVATION : ACTION TAKEN

1529/'11

11. **ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ වත්මන් වාර්ෂික පොල් නිෂ්පාදනය කොපමණද;
(ii) වත්මන් වාර්ෂික පොල් ඵලදාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ලෝක පොල් නිෂ්පාදනය කොපමණද;
(ii) ජාත්‍යන්තර පොල් වෙළඳ පොළේ ශ්‍රී ලංකා වෙළඳ පොළ කොටස කොපමණද;
(iii) පොල් නිපදවන අනෙකුත් රටවල නම් කවරේද;
(iv) එම රටවල එක් හෙක්ටෙයාරයක් සඳහා පොල් ඵලදාව සහ වාර්ෂික පොල් නිෂ්පාදනය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහළ ඵලදාවක් ඉලක්ක කරමින් දේශීය පොල් වගාව සඳහා සැලසුම් යළි සකස් කිරීමට කිසියම් ක්‍රියා මාර්ගයක් ගෙන තිබේද;
(ii) 2017, 2022, 2027 සහ 2030 වර්ෂ සඳහා ශ්‍රී ලංකාවේ නිපදවීමට අපේක්ෂිත පොල් ප්‍රමාණය අනුපිළිවෙළින් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

தெங்கு அபிவிருத்தி, மக்கள் தோட்ட அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையில் தற்போதைய வருடாந்த தெங்கு உற்பத்தியையும்;
(ii) தற்போதைய வருடாந்த தெங்கு விளைச்சலையும் அவர் கூறுவாரா
(ஆ) (i) உலகளாவிய தெங்கு உற்பத்திகளையும்;
(ii) தெங்குச் சந்தையில் இலங்கையின் சந்தைப் பங்கையும்;
(iii) தெங்கு உற்பத்திசெய்யும் ஏனைய நாடுகளின் பெயர்களையும்;
(iv) அந்நாடுகளில் ஹெக்ரெயருக்கான தெங்கு விளைச்சல் மற்றும் வருடாந்த தெங்கு உற்பத்தி ஆகியவற்றை வெவ்வேறாகவும் அவர் கூறுவாரா?
(இ) (i) உயர் விளைச்சலை இலக்காகக்கொண்டு, உள்ளூர் தெங்குப் பயிர்ச்செய்கையை மறுசீரமைப்பதற்கு ஏதாவது நடவடிக்கை மேற் கொள்ளப்பட்டுள்ளதா என்பதையும்;

(ii) முறையே 2017, 2022, 2027 மற்றும் 2030 ஆகிய வருடங்களில் இலங்கையில் உற்பத்தி செய்ய எதிர்பார்க்கப்பட்டுள்ள தேங்காய்களின் அளவை யும் அவர் தெரிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Coconut Development and Janatha Estate Development:

(a) Will he state -

(i) the present annual production of coconut; and

(ii) the present annual yield of coconut in Sri Lanka?

(b) Will he also state -

(i) the global production of coconut;

(ii) the market share of Sri Lanka in coconut market;

(iii) the names of the other countries producing coconut; and

(iv) the coconut yield per hectare and annual coconut production of those countries, separately?

(c) Will he inform this House -

(i) whether any action has been taken to reschedule the local coconut cultivation aiming a high yield; and

(ii) the quantity of coconut expected to be produced in Sri Lanka for the years 2017, 2022, 2027 and 2030 respectively?

(d) If not, why?

**ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා (පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஏ.பீ. ஜகத் புஷ்பகுமார - தெங்கு அபிவிருத்தி, மக்கள் தோட்ட அபிவிருத்தி அமைச்சர்)
(The Hon. A.P. Jagath Pushpakumara - Minister of Coconut Development and Janata Estate Development)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ගෙඩි මිලියන 2808 (දෙදහස් අටසියඅට)යි. (2011 වර්ෂය)

(ii) හෙක්ටයාරයකට පොල් ගෙඩි 7112 (හත්දහස් එකසියදොළහ)යි.

(ආ) (i) ගෙඩි මිලියන 64,850 (හැටහතරදහස් අටසියපණහ) යි.

(ii) 4.26% (හතරයි දශම දෙකයි හය)යි.

(iii) ඉන්දියාව

වියට්නාමය

තායිලන්තය

පිලිපීනය

ඉන්දුනීසියාව

මැලේසියාව

(iv)

| රට | හෙක්ටයාරයක පොල් ඵලදාව (ගෙඩි) | වාර්ෂික පොල් නිෂ්පාදනය (ගෙඩි මිලියන) |
|---|---|---|
| ඉන්දියාව | 8300 (අටදහස් තුන්සියය) | 15730 (පහළොස්දහස් හත්සියතිහ) |
| වියට්නාමය | 5685 (පන්දහස් හයසියඅසූපහ) | 813 (අටසිය දහතුන) |
| තායිලන්තය | 4619 (හාරදහස් හයසියදහනවය) | 1104 (එක්දහස් එකසිය හතර) |
| පිලිපීනය | 4605 (හාරදහස් හයසියපහ) | 15668 (පහළොස්දහස් හයසිය හැටඅට) |
| ඉන්දුනීසියාව | 4285 (හාරදහස් දෙසිය අසූපහ) | 16498 (දාසයදහස් හාරසිය අනූඅට) |
| මැලේසියාව | 3790 (තුන්දහස් හත්සිය අනූව) | 379 (තුන්සිය හැත්තෑනවය) |

(ඇ) (i) ඔව්.

(ii) 2017- ගෙඩි මිලියන 4100 (හාරදහස් එකසියය)යි. 2022, 2027 සහ 2030 වර්ෂ සඳහා අපේක්ෂිත පොල් නිෂ්පාදන ඉලක්ක මේ වන විට සකස් කර නොමැත.

(ඈ) ඉහත පිළිතුර අනුව පැන නොනඟී.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙසේයි. ගරු ඇමතිතුමනි, ඔබතුමා දන්නවා ඇති ලෝකයත් එක්ක සසඳන කොට මීට අවුරුදු විස්සකට පමණ පෙර අපට සියයට 9.5ක විතර market share එකක් තිබුණු බව. දැන් ඒක සියයට 2.4ට අඩු වෙලා තිබෙනවා. ඒක යථා තත්ත්වයට පත් කරන්න ඔබතුමා මොනවාද කරන්නේ?

**ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා**
(மாண்புமிகு ஏ.பீ. ஜகத் புஷ்பகுமார)
(The Hon. A.P. Jagath Pushpakumara)
ගරු කථානායකතුමනි, එතුමා කියන එක බොහොම නිවැරදියි. දැනට අවුරුදු විස්සකට පමණ පෙර මේ රටේ පොල් ඉඩම් කට්ටි කරලා, වෙන්දේසි කරලා විශාල විනාශයක් කරලා තිබුණා. එතුමා කියන එක බොහොම නිවැරදියි. පනත අනුව අක්කර 10කට අඩු ඉඩම් කැබලි කිරීම නතර කර තිබෙනවා. ගරු කථානායකතුමනි, අක්කර පහට අඩු ඉඩම් කැඩීම වළක්වන්න, ඉදිරියේදී මේ උත්තරීතර සභාවේදී නීතිරීති, අණපනත් සම්මත කර ගන්නට අපි බලාපොරොත්තු වනවා. ඒ විතරක් නොවෙයි, අපි පළමුවරට 2011 වර්ෂයේ සිට 2016 දක්වා ක්‍රමෝපාය සැලසුමක් සකස් කර තිබෙනවා.

ගරු කථානායකතුමනි, අතිගරු ජනාධිපතිතුමා මේ ගරු සභාවේ දී ප්‍රකාශ කළ ආකාරයට 2011 වර්ෂයේ අපි දස ලක්ෂ හතරක ඉලක්කය ඉක්මවලා පොල් පැළ සිටුවලා තිබෙනවා. 2012 වර්ෂයේ පොල් පැළ මිලියන 6ක් වගා කරන්න සැලසුම් කර තිබෙනවා. අවශ්‍ය බීජ තවාන් සකස් කර තිබෙනවා. ඒ අනුව ඉදිරි අවුරුදු පහ තුළ පොල් පැළ මිලියන 32ක් සිටුවන්න අපි කටයුතු කරනවා.

ඊට අමතරව අතිගරු ජනාධිපතිතුමනි, රුපියල් හාරදහසක් වූ පොහොර හොණ්ඩරය ජනතාවට සහනයක් වශයෙන් රුපියල් 1,200ට ලබා දීලා තියෙනවා. ආයෝජනයක් හැටියට සලකලා එය ලබා දීමේ ප්‍රතිඵලයක් හැටියට ගිය පසු ගිය වසරේ ජනවාරි

[ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා]

මාසයත්, මේ වසරේ ජනවාරි මාසයත් එක්ක සංසන්දනය කරන කොට පොල් නිෂ්පාදනය සියයට 20 සිට සියයට 40 දක්වා වැඩි වෙලා තියෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමා සතුටෙන් උත්තර දීලා හිතුවා, ඒක එක්සත් ජාතික පක්ෂය කාලයේ වුණාය කියලා.

**ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා**
(மாண்புமிகு ஏ.பீ. ஜகத் புஷ்பகுமார)
(The Hon. A.P. Jagath Pushpakumara)
මම එහෙම කිව්වේ නැහැ නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මතක නේ. අවුරුදු 20කට ඉස්සෙල්ලා -

**ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා**
(மாண்புமிகு ஏ.பீ. ஜகத் புஷ்பகுமார)
(The Hon. A.P. Jagath Pushpakumara)
ඔබතුමා තොප්පිය දා ගත්තාට මට කරන්න දෙයක් නැහැ. මම කිව්වේ අවුරුදු විස්සකට එහා පැත්තේ කියලායි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමා අවුරුදු විස්සකට ඉස්සෙල්ලා කියලායි කියන්නේ. එක්සත් ජාතික පක්ෂය රට භාර දුන්නේ 1994දියි. අවුරුදු 20ක් කියලා කියන කොට ඔබතුමන්ලාගේ කාලයේ තමයි ඒක නැති කරලා තියෙන්නේ. එංගලන්තයේ පොල් ගෙඩියක් වැටුණත් ලංකාවේ account එකෙන් යූඑන්පී එකට බණින්න එපා. ඔබතුමන්ලාගේ - [බාධා කිරීමක්] කවුද එතැනට පනින මන්ත්‍රීතුමා? මම මේ ප්‍රශ්නය අහන්නේ ඇමතිවරයකුගෙන්. එතුමා නිකරුණේ එතැනට පනින්න ඕනෑ නැහැ නේ. ගරු ඇමතිතුමා, ඔබතුමා හැම එකටම එක්සත් ජාතික පක්ෂයට බණින්නේ නැතිව ඉන්න. අවුරුදු 20කට පාලනය කරලා තියෙන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය. කෘෂිකර්මයේදී "අපි වවමු - රට හදමු" කියලා ඔන්න රට නැති කරලා තියෙන තැන. දැන් "මහින්ද චින්තන"ය කියලා කිව්වා නේ "භාරදහසක් දුන්නා"ය කියලා. මහින්ද චින්තනයත් 2005 ඉඳලා පාලනය කරලා තියෙන්නේ. ඉතින් කෝ පොල් වැඩි වීම?

**ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා**
(மாண்புமிகு ஏ.பீ. ஜகத் புஷ்பகுமார)
(The Hon. A.P. Jagath Pushpakumara)
ගරු කථානායකතුමනි, මම බොහොම වගකීමෙන් ප්‍රකාශ කරන්න කැමැතියි, මේ උත්තරීතර සභාවේදී මම එක්සත් ජාතික පක්ෂයක් ගැන සඳහන් කළේ නැහැයි කියන එක. මේ ගරු මන්ත්‍රීතුමා තොප්පිය දා ගත්තාට මට කරන්න දෙයකුත් නැහැ. එතුමා අවුරුදු 20කට පමණ පෙර කියා සඳහනක් කළා. බොහොම හරි, අවුරුදු 20කට පෙර තත්ත්වය ඒකයි. දැන් තිබෙන්නේ මේ තත්ත්වයයි කියන එකයි මම පැහැදිලි කළේ. අපි 2016 වර්ෂය වන කොට පොල් ඵලදාව ගෙඩි මිලියන දසලක්ෂ 3,650ක් දක්වා ගෙනෙන්න අවශ්‍ය පියවර අරගෙන තියෙනවා. ඒ සඳහා සැලසුම් සහගතව අපි අවශ්‍ය කටයුතු කරනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඵලදාව සම්බන්ධයෙන් තව ප්‍රශ්නයක් තියෙනවා. ඔබතුමා සඳහන් කර තිබෙනවා, වාර්ෂික පොල් ඵලදාව හෙක්ටෙයාර් එකකට පොල් ගෙඩි 7,100ක් කියලා. නමුත් COPE එක ඉදිරියට කැඳෙව්වාම අපට දැනුවත් කර තිබෙන්නේ ලංකාවේ පොල් ඵලදාව වියට්නාමයටත්, ඉන්දුනීසියාවටත් වඩා අඩුයි කියලායි.

ඔබතුමා මෙතැන කියනවා, හෙක්ටයාර් එකකින් පොල් ගෙඩි 7,100ක් ගන්නවා කියලා. මම දන්නේ නැහැ, මම අහ ගත්ත හැටි හෝ ලියා ගත්ත හැටි වැරදිද කියලා. ඉන්දියාවේ තමයි වැඩියෙන්ම පොල් තිබෙන්නේ. ඊට පසුව පිලිපීනය, ඉන්දුනීසියාව. ඊට පසුව තමයි ලංකාව තිබෙන්නේ. මෙතැන තිබෙන දත්ත අනුව හෙක්ටයාර් එකකින් පොල් ගෙඩි 7,100ක් ගන්නවා. ඒක හරිද? ඔබතුමා දුන්නේ පොළොන්නරුවේ වාගේ drip irrigation තුළින් ලැබෙන ඒ yield එකද, නැත්නම් ලංකාවේ සමස්තයක් වශයෙන් තිබෙන ඵලදායිතාවද?

**ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා**
(மாண்புமிகு ஏ.பீ. ஜகத் புஷ்பகுமார)
(The Hon. A.P. Jagath Pushpakumara)
ගරු කථානායකතුමනි, අප මේ ගරු සභාවට ඉදිරිපත් කරන්නේ මුණ්ඩා ගැස් ගෙනාවා වාගේ නොවෙයි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
දොඹකරය උඩට ගිහින් ගංජා ගැහුවා වාගේද?

**ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා**
(மாண்புமிகு ஏ.பீ. ஜகத் புஷ்பகுமார)
(The Hon. A.P. Jagath Pushpakumara)
මම ඉදිරිපත් කරන්නේ The Asian and Pacific Coconut Community එකේ වාර්තාව අනුවයි කියන එක මම මේ සභාවට ප්‍රකාශ කරන්න කැමැතියි.

## මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සුහදපුර ගම්මානය : විදුලිය
மெதிரிகிரிய பிரதேச செயலாளர் பிரிவின் சுஹதபுர கிராமம்: மின்சாரம்
SUHADAPURA VILLAGE IN MEDIRIGIRIYA DS DIVISION : ELECTRICITY

1580/'11

12. **ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) පොලොන්නරුව දිස්ත්‍රික්කයේ, මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, යාය එක, සුහදපුර ගම්මානයට විදුලිය සැපයීම සඳහා විදුලි කණු සිටුවා, නිවෙස්වල විදුලි මීටර්ද සම්බන්ධ කර මාස හයක් ගතව ඇතත් මෙතෙක් විදුලිය ලබා දී නොමැති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම විදුලි ව්‍යාපෘතිය අතරමඟ නවතා දැමීමට හේතු කවරේද;

(ii) එම ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත මුළු මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) සුහදපුර ගම්වාසීන්ට විදුලිය ලබා දීම සඳහා ඉහත ව්‍යාපෘතිය කඩිනමින් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඊට ගතවන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

மின்வலு, எரிசக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) பொலனறுவை மாவட்டத்தின் மெதிரிகிரிய பிரதேச செயலாளர் பிரிவில் யாய ஒன்று சுஹதபுர கிராமத் திற்கு மின்சாரம் வழங்குவதற்காக மின் கம்பங்கள் நடப்பட்டு, வீடுகளில் மின்மானிகளும் பொருத்தப் பட்டு ஆறு மாதங்கள் கடந்துள்ளபோதிலும் இதுவரை மின்சாரம் பெற்றுக்கொடுக்கப்படவில்லை என்பதை அவர் அறிவாரா?

(ஆ) (i) மேற்படி மின்சாரக் கருத்திட்டத்தை இடையில் நிறுத்துவதற்கான காரணங்கள் யாவையென் பதையும்;

(ii) மேற்படி கருத்திட்டத்திற்காக மதிப்பிடப்பட்ட மொத்தப் பணத்தொகை எவ்வளவென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) (i) சுஹதபுர கிராம மக்களுக்கு மின்சாரம் வழங்கு வதற்காக மேற்படி கருத்திட்டத்தைத் துரிதமாக நடைமுறைப்படுத்துவதற்கு நடவடிக்கை எடுப் பாரா என்பதையும்;

(ii) ஆமெனில், இதற்காக எடுக்கப்படும் காலம் யாதென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Power and Energy:

(a) Is he aware that though six months have lapsed after electricity poles have been erected and houses fitted with electricity metres to provide electricity to Suhadapura Village in track one in the Medirigiriya Divisional Secretary's Division in the Polonnaruwa District, electricity has not yet been provided ?

(b) Will he State-

(i) the reasons for abandoning this project halfway; and

(ii) the estimated sum of money for this project?

(c) Will he inform this House-

(i) whether the above project will be implemented speedily to provide electricity to the residents of Suhadapura; and if so, the time that will be taken for that?

If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) ඔව්.

(ආ) (i) මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සුහදපුර ගම්මානය සඳහා, සීඩා ව්‍යාපෘතිය යටතේ අනුමත තිස්සපුර විදුලි ව්‍යාපෘතිය මඟින් විදුලිය ලබා දීමට අවශ්‍ය කටයුතු කර තිබුණි. නමුත් පසු ගිය වර්ෂයේ -2011- පැවති අධික වර්ෂාව හා ගංවතුර හේතුවෙන් එම ව්‍යාපෘතියට අදාළ අඩුසැර මාර්ගයක මැද කොටසක් විනාශ විය. එකී කොටසේ විදුලිය ලබා ගැනීමට පාරිභෝගිකයන් නොසිටි නිසා ඉතිරි වූ කොටස සඳහා විදුලිය ලබා දීමට කඩිනම් පියවර ගත්තෙමි.

(ii) රුපියල් මිලියන 12.1

(ඇ) (i) ඔව්.

(ii) මසක පමණ කාලයකින් නිම කිරීමට හැකිය.

(ඈ) අදාළ නොවේ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ස්තුතියි, ගරු ඇමතිතුමනි. ඔබතුමා විෂය භාර අමාත්‍යතුමා නොවුණත් මේ කියපු කාරණාවලට අදාළව අතුරු ප්‍රශ්න මා ඔබතුමාගෙන් අහන්න කැමැතියි. පසු ගිය වකවානුවේ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ඇති වුණු වර්ෂාවත් එක්ක විදුලි මාර්ගයේ මැද ස්ථානයක සිදු වූ විනාශයක් මුල් කර ගෙනයි මේ ප්‍රමාදය සිද්ධ වුණේ කියා සඳහන් කළා. නමුත් මාතර දිස්ත්‍රික්කයත් ඇතුළුව දිවයිනේ මේ වාගේම ස්ථාන බොහෝ තිබෙනවා. කොන්ත්‍රාත්කරුවන්ගේ නොහැකියාව නිසා, විදුලි යෝජනා ක්‍රම අතරමඟ දමා යාම නිසා අත් හිටවුණු විදුලි යෝජනා ක්‍රම බොහොමයක් තිබෙනවා. එවැනි විදුලි යෝජනා විධිමත්ව කඩිනමින් අවසන් කරන්න අමාත්‍යාංශයේ අවධානය යොමු කරන්න ගරු ඇමතිතුමා කටයුතු කරනවාද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ඒ පිළිබඳව ගරු ඇමතිතුමාට වාර්තා කරලා ඉක්මන් කිරීමට අපි කටයුතු කරන්නම්.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මම දෙවන අතුරු ප්‍රශ්නය අහනවා. සමහර විදුලි යෝජනා ක්‍රියාත්මක කර ගෙන ගිහින් මාසයකින් දෙකකින් අතරමඟ නතර වනවා. අහපුවාම කියන්නේ විදුලි කම්බි අඩුයි; මීටර් අඩුයි එහෙම නැත්නම් අනෙකුත් මෙවලම් අඩුයි කියා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

මෙයට අදාළ නැහැ නේද?

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, අතරමඟ නතර කිරීමක් පිළිබඳව අහන්නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මේක ගැන අහන්න. ඒ විදුලි ව්‍යාපෘතිය ගැන විතරක් අහන්න.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
එහෙම හිඟයක් තිබෙනවාද? හිඟයක් නැත්නම් මෙහෙම ප්‍රකාශ නිකුත් වන්නේ ඇයි?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඒ ප්‍රකාශ කවුරු නිකුත් කරනවාද කියලා දන්නේ නැහැ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ඒ එන කොන්ත්‍රාත්කරුවන් සහ සමහර වෙලාවට මණ්ඩලයේ අය තමයි කියන්නේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මේ යෝජනා ක්‍රමයේ තිබෙන්නේ ගං වතුර හා ඇති වුණු තත්ත්වය නිසා සිදු වුණු විනාශයක්. එහෙම නැතුව වෙනත් බඩුබාහිරාදිය අඩු වීමක් නොවෙයි. ඒ නිසා මෙය නිම කිරීමට දැන් කටයුතු කර ගෙන යනවා. ඔබතුමා කියන කාරණාව ගැන තොරතුරු ඔබතුමා ළඟ තිබෙනවා නම් ඒවා අපට ඉදිරිපත් කරන්න. එතකොට අමාත්‍යතුමාගේ අවධානයට යොමු කළ හැකියි.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මම තුන් වන අතුරු ප්‍රශ්නය අහනවා.

2009 වසරේ අවසාන කාර්තුවේත් 2010, 2011 කියන වසර දෙක තුළත් අවසන් නොවුණු විදුලි යෝජනා ක්‍රම මේ වසර තුළ අවසන් කිරීම සඳහා අමාත්‍යාංශයට දැක්මක්, වැඩ පිළිවෙළක් සහ කාල නිර්ණ රාමුවක් තිබෙනවාද?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒක ඔබතුමා අහලා තිබෙන ප්‍රශ්නයට අදාළ නැහැ. ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමනි, ඔබතුමා අහලා තිබෙන්නේ මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අදාළ ප්‍රශ්නයක් නේ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ඔව්, ඒ වාගේ රටේ තවත් තැන්වලත් මේ ප්‍රශ්නය තිබෙනවා ගරු කථානායකතුමනි. ඒකයි මම අහන්නේ.

## නුසුදුසු ඖෂධ වර්ග ආනයනය කිරීම : විස්තර
## பொருத்தமற்ற மருந்து வகை இறக்குமதி : விபரம்
## IMPORT OF UNSUITABLE DRUGS : DETAILS

1855/'11

13. **ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1) :

(අ) (i) ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් නුසුදුසු යැයි තීරණය කරන ලද ඖෂධ වර්ගයක් හෝ වර්ග කිහිපයක් මෙම වර්ෂයේදී මෙරටට ආනයනය කර තිබේද;

(ii) එසේ නම්, එම ඖෂධ වර්ගයේ හෝ වර්ගවල නම් කවරේද;

(iii) එම ඖෂධ ගෙන් වීම සඳහා අනුමතිය ලබා දුන් බලධාරියා කවුරුන්ද;

(iv) ගෙන්වන ලද ඖෂධ තොගයේ වටිනාකම කොපමණද;

(v) එම ඖෂධ සඳහා මුදල් ගෙවා තිබේද;

(vi) එසේ නම්, මුදල් ගෙවීම සඳහා නිර්දේශ කළ අය කවුරුන්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම ඖෂධ රෝගීන්ගේ භාවිතය සඳහා නිදහස් කර තිබේද;

(ii) එසේ නම්, නිදහස් කර ඇති ප්‍රමාණය කොපමණද;

(iii) මේ වන විට එම ඖෂධ නිදහස් කර නොමැති නම්, ඒවා සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

(iv) එම ඖෂධ ගෙන්වීමට රජයට දරන්නට සිදු වූ සමස්ත වියදම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதார அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) உலக சுகாதார அமைப்பினால் பொருத்தமற்ற தென தீர்மானிக்கப்பட்ட மருந்து வகை யொன்றோ அல்லது மருந்து வகைகளோ இவ் வாண்டில் இந்நாட்டுக்கு இறக்குமதி செய்யப் பட்டுள்ளதா என்பதையும்:

(ii) ஆமெனில், மேற்படி மருந்துவகையின் அல்லது மருந்துவகைகளின் பெயர்கள் யாவை என்ப தையும்;

(iii) மேற்படி மருந்துவகைகளை வரவழைக்க அனுமதி வழங்கிய அதிகாரி யார் என்பதையும்;

(iv) வரவழைக்கப்பட்ட மருந்துத் தொகையின் பெறுமதி யாது என்பதையும்;

(v) மேற்படி மருந்துகளுக்காக பணம் செலுத்தப் பட்டுள்ளதா என்பதையும்;

(vi) ஆமெனில், பணம் செலுத்துவதற்கு விதந்துரைத் தவர் யார்

என்பதையும் அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) மேற்படி மருந்துகள் நோயாளிகளின் பாவனைக் காக விடுவிக்கப்பட்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், விடுவிக்கப்பட்டுள்ள தொகை எவ் வளவு என்பதையும்;

(iii) இதுவரை மேற்படி மருந்துகள் விடுவிக்கப்பட வில்லையெனின் அது சம்பந்தமாக மேற் கொள்ளப்படும் நடவடிக்கை யாது என்பதையும்;

(iv) மேற்படி மருந்துகளை வரவழைக்க அரசாங்கம் ஏற்க நேரிட்ட மொத்தச் செலவு யாது

என்பதையும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Health:

(a) Will he state-

(i) whether a type of drug or a number of types of drugs prescribed as unsuitable by the World Health Organization have been imported to this country during this year;

(ii) if so, the name/s of the type of drug or types of drugs;

(iii) as to who authorized the import of those drugs;

(iv) the value of the stock of the drugs imported;

(v) whether payments have been made in relation to those drugs; and

(vi) if so, as to who recommended those payments?

(b) Will he inform this House-

(i) whether those drugs have been released for the use of the patients;

(ii) if so, the amount so released;

(iii) if those drugs have not been released so far, the steps to be taken regarding those drugs; and

(iv) the total cost incurred by the government for importing those drugs?

(c) If not, why?

**ගරු ලලිත් දිසානායක මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லலித் திசாநாயக்க - சுகாதார பிரதி அமைச்சர்)
(The Hon. Lalith Dissanayake - Deputy Minister of Health)
ගරු කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) නැත.
(ii) පැන නොනඟී.
(iii) පැන නොනඟී.
(iv) පැන නොනඟී.
(v) පැන නොනඟී.
(vi) පැන නොනඟී.

(ආ) (i) පැන නොනඟී.
(ii) පැන නොනඟී.
(iii) පැන නොනඟී.
(iv) පැන නොනඟී.

(ඇ) පැන නොනඟී.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
පැන නඟින දෙයක් නැද්ද?

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
නැහැ. ගරු කථානායකතුමනි, මෙම ප්‍රශ්නයෙන් අසා තිබෙන්නේ, "ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් නුසුදුසු යැයි තීරණය කරන ලද ඖෂධ වර්ගයක් හෝ වර්ග කිහිපයක් මෙම වර්ෂයේදී මෙරටට ආනයනය කර තිබේද?" කියලායි. එහෙම දෙයක් ආනයනය කරලා නැහැ. එතකොට ඒ යටතේ අසන ලද අනික් සියලු ප්‍රශ්නවලට උත්තර නැති විධියට තමයි ගණන් ගන්නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මම මේ අතුරු ප්‍රශ්නයක් අහන්නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔබතුමාට අතුරු ප්‍රශ්නයක් තිබෙනවාද අහන්න?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔව්. එතුමාට පැන නැඟුණේ නැති වුණාට මට ප්‍රශ්නයක් පැන නැඟිලා තිබෙනවා ගරු කථානායකතුමනි. ඒ නිසා මේක අහන්න ඕනෑ. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, 2011 අගෝස්තු මාසයේ 05වැනි දා ඔබතුමාගේම ගරු අමාත්‍යතුමා කොළඹ වෛද්‍ය පර්යේෂණ ආයතනයේ පැවැත්වුණු සම්මන්ත්‍රණයකදී තමයි මේ ප්‍රකාශය කෙරුවේ. එතුමා කිව්වා, "මෙවැනි කටයුතු හේතුවෙන් තමා ඉතාම බරපතළ ලෙස අපහසුතාවකට පත් වෙනවා" කියලා. වෙලා තිබෙන්නේ මේකයි. ගරු කථානායකතුමනි, මේ ඖෂධ වර්ගය විදේශයකින් මිලදී ගැනීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ තාක්ෂණික කමිටුව අවසර දීලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, ටෙන්ඩර් මණ්ඩලයත් මේක අනුමත කරලා තිබෙනවා. සෞඛ්‍ය ඇමතිතුමාම -මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා- තමයි කියන්නේ එතුමා බලවත් අපහසුතාවට පත් වෙලා තිබෙනවා කියලා. හැබැයි සෞඛ්‍ය නියෝජ්‍ය ඇමතිතුමාට දීලා තිබෙන උත්තරයේ සඳහන් වන්නේ, මේක "පැන නොනඟී" කියලායි. මම අහන්න කැමැතියි මේ අණ්ඩර දෙමළයේ තේරුම මොකක්ද කියලා. මොකද ගරු ඇමතිතුමා මේ ගැන බලවත් අපහසුතාවට පත් වෙලා කථා කරනවා. ගරු සෞඛ්‍ය නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට දුන්න උත්තරයේ - මම දන්නේ නැහැ නිලධාරින් ඔබතුමා නොමඟ යවලාද කියලා- "පැන නොනඟී" කියලා සඳහන් වෙනවා. මම ඔබතුමාට ගෞරවයෙන් කියන්න කැමැතියි, කරුණාකරලා මේ ගැන හොයා බලන්න කියලා. මොකද ඔබතුමාගේ ඇමතිතුමා කරපු ප්‍රකාශය මම ළඟ දැන් තිබෙනවා.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ගරු කථානායකතුමනි, මෙතුමා අහලා තිබෙන ප්‍රශ්නය තමයි ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් නුසුදුසු යැයි තීරණය කරන ඖෂධ වර්ගයක් හෝ වර්ග කීපයක් මෙම වර්ෂයේදී මෙරටට ආනයනය කර තිබේද කියන එක. එහෙම නුසුදුසු ඖෂධ වර්ගයක් අප ආනයනය කරලා නැහැ. එතුමාත් නීතිඥ මහත්මයෙක්. ගරු මන්ත්‍රීතුමනි, එහෙම නම් ඒ ඖෂධ ලැයිස්තුව ඔබතුමා අපට දෙන්න. ලෝක සෞඛ්‍ය සංවිධානය තහනම් කරපු ඖෂධ අප ගෙනැල්ලා නැහැ. ඒකයි පිළිතුර. ඇමතිතුමා කරපු ප්‍රකාශයක් නොවෙයි අහලා තිබෙන ප්‍රශ්නය. ඉතින් ඒකට උත්තරය දුන්නා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්නයට පිළිතුරු ලැබුණා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
නැහැ, ගරු කථානායකතුමනි, මෙහි ගෙන්වපු ඖෂධ පිළිබඳව බලවත් අපහසුතාවට පත් වුණා කියලා සෞඛ්‍ය අමාත්‍ය මෛත්‍රීපාල සිරිසේන අමාත්‍යතුමා කියන කොට, රටේ පුරවැසියෙක් විධියට මම දැන ගන්න කැමැතියි මොකක්ද -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒ ප්‍රකාශය ඔබතුමා කොහෙන්ද අහුලා ගත්තේ?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මා ළඟ ඒ ප්‍රකාශය තිබෙනවා. "ලංකාදීප"ාවත් පතේ පළ කර තිබෙනවා, "භාවිතයෙන් ඉවත් කළ ඖෂධ තොගය ඇණවුමෙන් කෝටි ගණනක පාඩුවක්" කියලා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
කවදා පත්තරේද?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
2011 අගෝස්තු මාසයේ 06වැනි සෙනසුරාදා "ලංකාදීප" පුවත් පතේ headline එක. "ලංකාදීප" පුවත් පතේ එහෙම බොරු දමන්නේ නැහැ නේ. මේ නියෝජ්‍ය අමාත්‍යතුමා මේක ගැන කියන්නේ නැහැ. මම දැන ගන්න කැමැතියි, මොනවාද මේ ඖෂධ කියලා. මම ප්‍රශ්නය අහලා තිබෙන්නේ එහෙමයි. මම අහන්නේ, මේ ඖෂධ මොනවාද, ඒවා ලංකාවට ගෙනාවාද, නැද්ද කියන එකයි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
නියෝජ්‍ය ඇමතිතුමා එයට පිළිතුර දුන්නා නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මම අහන්නේ, එහෙනම් එක්කෝ -

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ගරු කථානායකතුමනි, එතුමා අහන්නේ, ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් නුසුදුසු යැයි තීරණය කරන ලද ඖෂධ වර්ග ගැනයි. පත්තරේ තිබුණු එකක් ගැන මේ ප්‍රශ්නයේ අහලා නැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දැන් එතුමා අහන්නේ, ගරු ඇමතිතුමාගේ ප්‍රකාශය සම්බන්ධයෙන් පිළිතුරක්.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මේ "ලංකාදීප" පුවත් පත කියන්නේ රටේ ප්‍රධාන වැදගත් පුවත් පතක්.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්නයට දුන්නු පිළිතුර හරි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
එම පුවත් පතේ headline එක මේ තිබෙන්නේ. මා කියන්නේ මෙය වැරැදි නම් කරුණාකරලා සෞඛ්‍ය අමාත්‍යාංශය මේ පුවත් පතට විරුද්ධව නඩු දමන්න කියලායි.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
මන්ත්‍රීතුමා උසාවියේදීත් ප්‍රශ්න අහන්නේ ඔහොමද දන්නේ නැහැ. එතුමා ගොනු කර තිබෙන ප්‍රශ්නය වෙන එකක්, අහන්නේ වෙනත් ප්‍රශ්නයක්.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔබතුමාට ඒක තේරෙන්නේ නැතිවාට මම මොනවා කරන්නද?

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ප්‍රශ්නය අහන්නේ ලෝක සෞඛ්‍ය සංවිධානයෙන් තහනම් කරපු බෙහෙත් වර්ග සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් මේ රටට ගෙන්වා තිබෙනවාද කියලායි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, ඒකම තමයි මේ අහන්නේ. මේ පුවත් පතේ කියන්නේ මොකක්ද? ලෝක සෞඛ්‍ය සංවිධානය පවා - [බාධා කිරීමක්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
පොඩ්ඩක් ඉන්න කෝ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ලෝක සෞඛ්‍ය සංවිධානය පවා නුසුදුසු බවට තහවුරු කර ඇති ඖෂධ වර්ගයක් මෙරටට ආනයනය කිරීමට සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිලධාරීන් පිරිසක් කටයුතු කර තිබෙනවා කියන කාරණය තමයි ඇමතිතුමා කියන්නේ.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
මෙම ප්‍රශ්නයට අදාළ නම් මා උත්තර දෙන්නම්.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඉතින් ඒකම තමයි මේ අහන්නේ.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
එතුමා අහන ප්‍රශ්නයට අදාළව ලෝක සෞඛ්‍ය සංවිධානයෙන් තහනම් කරන ලද ඖෂධ අපේ ලංකාවේ සෞඛ්‍ය අමාත්‍යාංශයට ගෙනැල්ලා නැහැ. [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි. මේ ගැන ගරු ඇමතිතුමා සිටින වෙලාවක උපදේශක කාරක සභාවේ දී පැහැදිලි කර ගන්න.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ගරු කථානායකතුමනි, මෙතුමා එහෙම ලියවිල්ලක් ඉදිරිපත් කළා නම් මම උත්තර දෙනවා. එහෙම ලියවිල්ලක් නැහැ. [බාධා කිරීමක්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මා එහෙනම් තුන්වැනි කාරණාව විධියට කියන්නම් -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
කියන්න නොවෙයි, මොනවා හරි තිබෙනවා නම් අහන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
කරුණාකර මේ සම්බන්ධව සොයා බලා - [බාධා කිරීමක්]

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා (පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர - புனர்வாழ்வளிப்பு, சிறைச்சாலைகள் மறுசீரமைப்பு அமைச்சர்)
(The Hon. Chandrasiri Gajadeera - Minister of Rehabilitation and Prison Reforms)
Sir, I rise to a point of Order.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒ ගමන තව සෞඛ්‍ය ඇමති කෙනෙක් නැඟිටලා. චන්ද්‍රසිරි ගජදීර ඇමතිතුමනි, ඔබතුමාගේ සෞඛ්‍ය හොඳ නැහැ. ඔබතුමාත් ගිහින් පෙති ටිකක් ගන්න.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන්නේ පුවත් පතක පළ වූ විස්තරයක්.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, එහෙම නම් මා නියෝජ්‍ය අමාත්‍යතුමාට කියනවා, කරුණාකර එතුමාගේ ඇමතිතුමාගෙනුත් අහලා මේ සම්බන්ධව වහාම පරීක්ෂණයක් කරලා, ඒ වාගේ බෙහෙත් වර්ග ගෙනත් තිබෙනවාද කියලා -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
පරීක්ෂණයක් කරනවාද කියන එක නේ අහන්නේ?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔව්, පරීක්ෂණයක් කරන්න කියලා ඉල්ලනවා. මේ "ලංකාදීප" පුවත් පත බොරු කියන්නේ නැහැ නේ. එහෙම නැත්නම් මේ පුවත් පතට විරුද්ධව තමුන්නාන්සේලා ක්‍රියා මාර්ගයක් ගන්න.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ගරු කථානායකතුමනි, මෙතුමා අහපු ප්‍රශ්නයට මා පිළිතුරු දුන්නා. ලෝක සෞඛ්‍ය සංවිධානයෙන් තහනම් කරපු බෙහෙත් ගෙනල්ලා නැහැ. එච්චරයි.

## බන්ධනාගාර රැඳවියන්ට වෘත්තීය පුහුණු පාඨමාලා : සහතික
கைதிகளுக்கான தொழிற்பயிற்சிப் பாடநெறிகள் : சான்றிதழ்கள்
VOCATIONAL TRAINING PROGRAMMES FOR PRISON INMATES : CERTIFICATES

2013/’11

14. **ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

[ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා]

(අ) (i) බන්ධනාගාර රැඳවියන් සඳහා දැනට ක්‍රියාත්මක කරනු ලබන වෘත්තීය පුහුණු පාඨමාලා කවරේද;

(ii) එම පාඨමාලා අවසානයේදී රැඳවියන්ට පිළිගත් වෘත්තීය පුහුණු සහතිකයක් ලබා දීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

புனர்வாழ்வளிப்பு, சிறைச்சாலைகள் மறுசீரமைப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) சிறைச்சாலைக் கைதிகளுக்காக தற்போது நடைமுறைப்படுத்தப்படுகின்ற தொழிற்பயிற்சிப் பாடநெறிகள் யாவையென்பதையும்;

(ii) இப்பாடநெறிகளின் இறுதியில் கைதிகளுக்கு அங்கீகரிக்கப்பட்ட தொழில்சார் தகைமைச் சான்றிதழ்களை வழங்குவதற்கு நடவடிக்கை எடுப்பாரா என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Rehabilitation and Prison Reforms:

(a) Will he inform this House-

(i) of the Vocational Training Programmes conducted for the inmates in prisons ; and

(ii) whether action will be taken to issue them with a recognized vocational training certificate at the end of those programmes?

(b) If not, why?

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) භූමි අලංකරණය/ රූප ලාවණ්‍ය/ කෘෂි කර්මාන්තය/ දැව කැටයම් කලාව/ මනාලියන් හැඩ ගැන්වීම/ කොන්ඩ කැපීම/ චිත්‍ර කලාව/ විසිතුරු භාණ්ඩ නිෂ්පාදනය යනාදිය හා ඊට අමතරව 2011.09.05 දින යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යතුමා සමග අත්සන් කළ අවබෝධතා ගිවිසුම යටතේ පහත සඳහන් පුහුණු පාඨමාලා.

විදුලි කාර්මික පාඨමාලා
අධිවේගී මැහුම් පාඨමාලා
ඇඳුම් මැසීමේ පාඨමාලා (කාන්තා, පිරිමි)
වඩු කාර්මික ශිල්පී පාඨමාලා
පෑස්සුම් ශිල්පී පාඨමාලා
මේසන් ශිල්පී පාඨමාලා
ඉංග්‍රීසි පාඨමාලා
සාක්ෂරතා පාඨමාලා
සංගීත පාඨමාලා
නැටුම් පාඨමාලා
ස්වර්ණාභරණ හා මැණික් කැපීමේ පාඨමාලා
ඇලුමිනියම් ශිල්පීය පාඨමාලා
රේන්ද මැසීමේ පාඨමාලා
සම්භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ පාඨමාලා
ගෘහස්ථ විදුලි රැහැන් ඇදීමේ පාඨමාලා
පහත රට නර්තන පාඨමාලා
බතික් පාඨමාලා
බේකරි නිෂ්පාදන පාඨමාලා
මුද්‍රණ ශිල්පය පිළිබඳ පාඨමාලා

(ii) ඔව්.

මෙහිදී අවසානයේ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) තත්ත්වයේ සහතිකයක් ලබා දීමට කටයුතු කර ඇත. එය ජාත්‍යන්තර මට්ටමේ ඉහළ සහතිකයක්. ගරු මන්ත්‍රීතුමනි, ඊට අමතරව මා කියන්න කැමැතියි, විධිමත් සහ නොවිධිමත් අධ්‍යාපනය සාර්ථක කරන්න මේ මාසයේ 16 වන දා වටරැක පාසලක් පටන් ගන්න බව. එය ලෝකයේ පළමුවන බන්ධනාගාර පාසලයි. එහි සෞන්දර්යය, සංස්කෘතිය, කලාව හා චිත්‍ර ශිල්පය ඇතුළු පාඨමාලා පැවැත්වෙන බව ඔබතුමාගේ දැන ගැනීම සඳහා වැඩිදුරටත් ප්‍රකාශ කරනවා.

(ආ) අදාළ නොවේ.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මේකයි. මේ පාඨමාලාවට රැඳවියන් කී දෙනෙක් සහභාගි වනවාද?

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
මෙම පාඨමාලා හැම බන්ධනාගාරයකම පවත්වා ගෙන යනවා. ඒ සඳහා රැඳවියන්ගෙන් සුදුසු අය, කැමැති අය තෝරා ගෙන මේ පාඨමාලා පවත්වා ගෙන යනවා. සිටින රැඳවියන්ගෙන් බහුතර සංඛ්‍යාවක් මේ පාඨමාලා සඳහා සම්බන්ධ වනවා.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මේකයි. දෙමළ භාෂාව කථා කරන රැඳවියනුත් මෙයට සම්බන්ධ කර තිබෙනවාද?

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
ඔව්, ඔව්. සියලු දෙනාම සම්බන්ධ කර ගන්නවා.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
තුන්වන අතුරු ප්‍රශ්නය මේකයි. මෙම පාඨමාලාව පිළිබඳව ඔබතුමා ගෙන හැර දැක්වූ පැහැදිලි කිරීමට ස්තුතිවන්ත වන අතර රූප ලාවණ්‍ය පාඨමාලා පවත්වනු ලබන්නේ කාන්තාවන් විසින්ද කියා දැන ගන්න කැමැතියි.

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
ඔව්.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
බොහොම ස්තුතියි.

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
උසස් අධ්‍යාපන අමාත්‍යාංශය, අධ්‍යාපන අමාත්‍යාංශය, යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය යන අමාත්‍යාංශ තුන සමඟ අවබෝධතා ගිවිසුම්වලට ඇවිල්ලා තිබෙනවා. අමාත්‍යාංශ තුනේම අය මේකට සම්බන්ධ වනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 15-2053/'11- (1), ගරු සජිත් ප්‍රේමදාස මහතා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු සී.බී. රත්නායක මහතා (පුද්ගලිකප්‍රවාහන සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சீ. பி. ரத்நாயக்க - தனியார் போக்குவரத்துச் சேவைகள் அமைச்சர்)
(The Hon. C.B. Rathnayake - Minister of Private Transport Services)
දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ බලය බෙදීමත් එක්ක මෙය පළාත් සභා විෂයයක් හැටියටයි යන්නේ. එම නිසා මේ කාරණය සඳහා පිළිතුර දීමට මාසයක කාලයක් අවශ්‍යයි කියා ප්‍රකාශ කරනවා. ඒ වාගේම සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමාගෙන් අහනවා, "13 plus කියන කථාන්දරයත් එක්ක අද ජිනීවා නගරයට ගිහින් මේ රට අකර්මණ්‍ය කරන්න කටයුතු කරන්න ඔබතුමාට පුළුවන්ද?" කියන එක.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශයේ උපදේශකයන් : විස්තර
### கலாசார, கலை அலுவல்கள் அமைச்சின் ஆலோசகர்கள்: விபரம்
### ADVISERS UNDER MINISTRY OF CULTURE AND THE ARTS : DETAILS

1439/'11

4. **ගරු ජෝන් අමරතුංග මහතා (ගරු අජිත් කුමාර මහතා වෙනුවට)**
(மாண்புமிகு ஜோன் அமரதுங்க - மாண்புமிகு அஜித் குமார சார்பாக)
(The Hon. John Amaratunga on behalf of the Hon. Ajith Kumara)
සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) (i) සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශයේ මේ වන විට සේවය කරන උපදේශකයින් සංඛ්‍යාව;

(ii) ඔවුන්ගේ නම්, අධ්‍යාපන සුදුසුකම් සහ වගකීම්;

(iii) ඔවුන්ට ගෙවනු ලබන වැටුප් සහ දීමනා;

(iv) පසු ගිය මාසය සඳහා ගෙවන ලද සියලු දීමනාවල එකතුව;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) නිල රථ ලබා දී ඇති උපදේශකයින්ගේ නම්, ලබා දී ඇති නිල රථ සංඛ්‍යාව සහ ඒවායේ විස්තර කවරේද;

(ii) ඔවුන්ට ඉන්ධන දීමනා ලබා දෙන්නේ නම්, එක් එක් උපදේශකවරයාට ලබා දෙන ඉන්ධන දීමනාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඔවුන්ට දුරකථන පහසුකම් ලබා දෙන්නේ නම්, මේ වන විට දුරකථන පහසුකම් ලබා දී ඇති උපදේශකයන්ගේ නම් කවරේද;

(ii) දුරකථන දීමනාවක් ගෙවන්නේ නම්, එක් එක් උපදේශකවරයාට ලබා දී ඇති දීමනාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

கலாசார, கலை அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கலாசார, கலை அலுவல்கள் அமைச்சில் தற்போது சேவையாற்றுகின்ற ஆலோசகர்களின் எண்ணிக்கை எத்தனையென்பதையும்;

(ii) இவர்களின் பெயர்கள், கல்வித் தகைமைகள் மற்றும் பொறுப்புகள் யாவையென்பதையும்;

(iii) இவர்களுக்குச் செலுத்தப்படும் சம்பளம் மற்றும் கொடுப்பனவுகள் யாவையென்பதையும்;

(iv) கடந்த மாதத்திற்காக செலுத்தப்பட்ட அனைத் துக் கொடுப்பனவுகளினதும் கூட்டுத்தொகை எவ்வளவென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) உத்தியோகபூர்வ வாகனங்கள் வழங்கப் பட்டுள்ள ஆலோசகர்களின் பெயர்கள், வழங்கப்பட்டுள்ள வாகனங்களின் எண்ணிக்கை மற்றும் அவற்றின் விபரங்கள் யாவையென் பதையும்;

(ii) இவர்களுக்கு எரிபொருள் கொடுப்பனவு வழங்கப்படும் எனின், ஒவ்வொரு ஆலோசக ருக்கும் வழங்கப்படுகின்ற எரிபொருள் கொடுப் பனவு தனித்தனியாக யாதென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) இவர்களுக்குத் தொலைபேசி வசதிகள் வழங்கப் படுமெனின், தற்போது தொலைபேசி வசதிகள் வழங்கப்பட்டுள்ள ஆலோசகர்களின் பெயர்கள் யாவையென்பதையும்;

(ii) தொலைபேசிக் கொடுப்பனவுத் தொகை யொன்று வழங்கப்படுமெனின் ஒவ்வொரு ஆலோசகருக்கும் வழங்கப்பட்டுள்ள கொடுப் பனவுத் தொகை தனித்தனியாக எவ்வள வென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

[ගරු ජෝන් අමරතුංග මහතා]

asked the Minister of Culture and the Arts :

(a) Will he state-

(i) the number of advisers who serve under the Ministry of Culture and the Arts at present;

(ii) their names, educational qualifications and responsibilities;

(iii) the salaries and allowances paid to them;

(iv) the total of all the allowances paid during the previous month?

(b) Will he inform this House-

(i) of the names of the advisers to whom official vehicles have been provided, the number of official vehicles provided and the details of those vehicles;

(ii) separately of the fuel allowance provided to each adviser, if they are provided with a fuel allowance?

(c) Will he state-

(i) the names of the advisers to whom telephone facilities have been provided by now if telephone facilities are provided to them;

(ii) separately of the amount of the telephone allowance paid to each adviser, if they are paid a telephone allowance?

(d) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) දෙකයි.

(ii) i. නවරත්න රවිබන්දු විද්‍යාපති මහතා

ii. සිරිනිමල් ලක්දුසිංහ මහතා

i. රවිබන්දු විද්‍යාපති මහතා

* අධ්‍යාපන සුදුසුකම්:-

අපොස (උපෙ)

* වෘත්තීය සුදුසුකම්:-

සෞන්දර්ය හා කලා විශ්වවිද්‍යාලය, කැලණිය විශ්වවිද්‍යාලය, කොළඹ ශ්‍රීපාලි විශ්වවිද්‍යාලය හා කටුබැද්ද විශ්වවිද්‍යාලය ආදියෙහි බාහිර කථිකාචාර්යවරයකු ලෙස කටයුතු කරයි.

* වෙනත් සුදුසුකම්:-

නර්තන කලාව පිළිබඳව චිත්‍රසේන කලායතනයෙන් හා ඉන්දියාවේ කේරළ කලා මණ්ඩලයෙන්ද, උතුරු ඉන්දියානු සම්භාව්‍ය සංගීතය පිළිබඳව පී.වී. නන්දසිරි මහතා යටතේද හදාරා ඇති අතර, තබ්ලා සහ උතුරු ඉන්දියානු සම්භාව්‍ය බෙර වාදනය සම්බන්ධව ඉන්දියාවේ මෛහර්හිදී හදාරා ඇත.

තවද, චිත්‍ර කලාව, රංග වස්ත්‍ර නිර්මාණය, වේදිකා පසුතල නිර්මාණය සහ වේදිකා පරිපාලනය පිළිබඳව කලාශූරි සෝමබන්ධු විද්‍යාපති මහතා යටතේද හදාරා ඇත.

* වගකීම්:-

සංස්කෘතික හා කලා ක්ෂේත්‍රයේ සංගීත, නැටුම්, චිත්‍ර ආදී ශිල්පීය කාර්යයන්හිදී සහ ප්‍රතිපත්තිමය කරුණුවලදී ගරු අමාත්‍යතුමාට හා අමාත්‍යාංශයට උපදෙස් ලබා දීම.

සියලු පිළිගත් රාජ්‍ය උත්සවවලදී හා අනෙකුත් කරුණුවලදී ඒ හා සම්බන්ධ කටයුතු මෙහෙයවීම පිළිබඳ වගකීම්.

සංස්කෘතික හා කලා කටයුතු සඳහා ප්‍රවර්ධන උපදෙස් ලබා දීම.

ii. සිරිනිමල් ලක්දුසිංහ මහතා

* අධ්‍යාපන සුදුසුකම්:-

පුරා විද්‍යාව පිළිබඳ ගෞරව උපාධිය

පුරා විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය

* වෘත්තීය සුදුසුකම්:-

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවෙහි සහකාර අධ්‍යක්ෂ හා අධ්‍යක්ෂ තනතුරුද, කැලණිය විශ්වවිද්‍යාලයෙහි අධ්‍යක්ෂ තනතුරද දරා ඇත. ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, කැලණිය විශ්වවිද්‍යාලය, පාලි හා බෞද්ධ විශ්වවිද්‍යාලය හා මොරටුව විශ්වවිද්‍යාලය ආදියෙහි බාහිර කථිකාචාර්යවරයකු ලෙස කටයුතු කර ඇත.

* වගකීම්:-

සංස්කෘතික හා කලා උරුමයන් පිළිබඳවද, පුරාවිද්‍යාත්මක කරුණු කෙරෙහිද ගරු අමාත්‍යතුමාට හා අමාත්‍යාංශයට උපදෙස් ලබා දීම.

මධ්‍යම සංස්කෘතික අරමුදල යටතේ පවත්නා ලෝක උරුම ස්ථාන කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් ඒ පිළිබඳව සංවර්ධනාත්මක හා සංරක්ෂණ කරුණු කෙරෙහි අමාත්‍යාංශ නිලධාරින්ට හා අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල නිලධාරින්ට උපදෙස් ලබා දීම.

ඉහත කී කරුණුවලට අදාළව නෛතික උපදෙස් ලබා දීම.

(iii) මසකට රුපියල් 30,000ක් බැගින්.

(iv) උක්ත නිලධාරීන් දෙදෙනාට පසු ගිය පෙබරවාරි මාසයට ගෙවූ මාසික දීමනා හා අනෙකුත් දීමනාවල මුළු එකතුව රුපියල් 1,22,880කි.

(ආ) (i) නවරත්න රවිබන්දු විද්‍යාපති මහතා

නිලරථ එකයි.

වාහන අංකය KE - 3641

සිරිනිමල් ලක්දුසිංහ මහතා හට ලබා දීමට වාහනයක් නොමැති බැවින්, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 23/2007 අනුව රුපියල් 30,000ක මාසික ප්‍රවාහන දීමනාවක් ගෙවනු ලැබේ.

(ii) * රවිබන්දු විද්‍යාපති මහතා රුපියල් 16,440

* සිරිනිමල් ලක්දුසිංහ මහතා රුපියල් 16,440

(ඇ) (i) ඉහත (අ) (ii) නම් සඳහන් පරිදි.

(ii) එක් උපදේශකවරයකුට රුපියල් 12,500ක සීමාවකට යටත්ව කාර්යාලීය, නිවාස හා ජංගම දුරකථන බිල්පත් පියවීම සිදු කරනු ලබයි.

(ඈ) පැන නොනඟී.

## ළමා සංවර්ධන හා කාන්තා කටයුතු සංවර්ධන ව්‍යාපෘති : ප්‍රතිලාභ
சிறுவர் அபிவிருத்தி, மகளிர் அலுவல்கள் அபிவிருத்திக் கருத்திட்டங்கள் : நன்மைகள்
DEVELOPMENT PROJECTS OF CHILD DEVELOPMENT AND WOMEN'S AFFAIRS : BENEFITS

1680/'11

5. **ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා (ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා වෙනුවට)**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் - மாண்புமிகு மொஹான் பிரியதர்ஷன த சில்வா சார்பாக)
(The Hon. Alhaj A.H.M. Azwer on behalf of the Hon. Mohan Priyadarshana De Silva)

ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) (i) 2006 වර්ෂයේ සිට මේ දක්වා කාල සීමාව තුළ ළමා සංවර්ධන හා කාන්තා කටයුතු සම්බන්ධයෙන් ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති කවරේද;

(ii) මෙම ව්‍යාපෘති හරහා ජනතාවට ලැබී ඇති ප්‍රතිලාභ කවරේද;

(iii) ඉදිරියේදී ළමා සංවර්ධන හා කාන්තා කටයුතු සම්බන්ධයෙන් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සංවර්ධන ව්‍යාපෘති කවරේද;

(iv) ඒවායින් අපේක්ෂිත ප්‍රතිඵල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சிறுவர் அபிவிருத்தி, மகளிர் அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2006ஆம் ஆண்டு தொடக்கம் இற்றைவரையான காலப்பகுதியில் சிறுவர் அபிவிருத்தி, மகளிர் அலுவல்கள் தொடர்பில் நடைமுறைப்படுத்தப் பட்ட அபிவிருத்திக் கருத்திட்டங்கள் யாவை என்பதையும்;

(ii) இக்கருத்திட்டங்களினூடாக மக்களுக்குக் கிடைத்துள்ள நன்மைகள் யாவை என்பதையும்;

(iii) எதிர்காலத்தில் சிறுவர் அபிவிருத்தி, மகளிர் அலுவல்கள் தொடர்பாக நடைமுறைப்படுத்த எதிர்பார்த்துள்ள அபிவிருத்திக் கருத்திட்டங்கள் யாவை என்பதையும்;

(iv) அவற்றிலிருந்து எதிர்பார்க்கப்படுகின்ற நன்மைகள் யாவை என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Child Development and Women's Affairs :

(a) Will he inform this House -

(i) the development projects implemented with respect to child development and women's affairs during the period from year 2006 up to now;

(ii) the benefits received by the people through these projects;

(iii) the development projects expected to be implemented in future with respect to child development and women's affairs; and

(iv) the results expected through them?

(b) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ). (i). 2006 වර්ෂයේ සිට මේ දක්වා කාල සීමාව තුළ ළමා සංවර්ධන හා කාන්තා කටයුතු සම්බන්ධයෙන් ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘතින්.

<u>සංවර්ධන අංශය</u>

01 වැන්දඹු හා ගෘහ මූලික කාන්තාවන් ශක්තිමත් කිරීමේ වැඩසටහන
02. ජාතික ළමා සංවර්ධන අරමුදල
03 ළමා ආරක්ෂාව සඳහා පවුල ශක්තිමත් කිරීමේ වැඩසටහන
04. ස්ත්‍රී / පුරුෂ සමාජභාවය මුලප්‍රවාහකරණය පිළිබඳ වැඩසටහන
05 යුද්ධයෙන් හෝ වෙනත් කරුණක් නිසා අනතුරකට පත් වූ / තාඩන පීඩනවලට ලක් වූ කාන්තාවන් සඳහා පහසුකම් සැපයීමේ වැඩසටහන්
06. ලෝක ළමා දිනයට සමගාමීව වැඩසටහන්
07 දිස්ත්‍රික් ළමා සංවර්ධන කමිටු ක්‍රියාත්මක කිරීම
08. බියගම කාන්තා සෙවන ආදර්ශ නේවාසිකාගාරය
09 ජාත්‍යන්තර කාන්තා දිනය
10. ළමුන් සඳහා වන ජාතික ක්‍රියාකාරී සැලැස්ම (2004/2008) ක්‍රියාත්මක කිරීම
11 ළමුන් සඳහා වූ සාර්ක් රටවල අමාත්‍යවරුන්ගේ සම්මේලනය
12. එක්සත්ජාතීන්ගේ ජනගහන අරමුදල (UNFPA)

<u>ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය</u>

01 " කාන්තා සවිය " වැඩසටහන යටතේ කාන්තාවන් සවිබල ගැන්වීම

01 වතු අංශයේ /ධීවර අංශයේ මූල්‍ය කළමනාකරණය හා " මතට තිත " වැඩසටහන (මහින්ද චින්තන වැඩසටහන)
02. ගෙවතු වගා හා පශු සම්පත් වැඩසටහන
03. දිස්ත්‍රික් කාන්තා බල මණ්ඩල සහ නායකත්ව පුහුණු
04. බන්ධනාගාර ගත වූ කාන්තාවන් සමාජය සහ ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම
05 නව යොවනයන්ගේ ජීවන කුසලතා සංවර්ධනය
06. ව්‍යවසායකත්ව පුහුණු වැඩසටහන
07 අත්දැකීම් හුවමාරු වැඩසටහන

02. නැංවුම් ගම්මාන වැඩසටහන
(සෑම ගමකින්ම කාන්තාවන් දසදෙනෙකු සඳහා අත්යන්ත්‍ර රේෂ කර්මාන්ත, හස්ත කර්මාන්ත සහ සෙල්ලම් බඩු නිෂ්පාදනය, විදේශ වෙළඳපොළ වෙත යොමු කර ආර්ථික වශයෙන් ස්වාධීන කිරීම)

03. කුඩා ව්‍යාපාරවල යෙදෙන, ඇප තැබීමට නොහැකි වීම නිසා බැංකු ණයක් ගැනීමට නොහැකිව සිටින කාන්තාවන්ට ණය ලබාදීමේ ක්‍රමයක් ඇති කිරීම

01 වත්‍රිය ණය වැඩසටහන
02. වනිතා ශක්ති බැංකු සංගම් වැඩසටහන

කාන්තා නිෂ්පාදන ප්‍රදර්ශන හා අළෙවිපොළ

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

4. සුනාමි හා යුද්ධ ගැටුම්වලින් පීඩාවට පත්ව ඇති අය සඳහා විශේෂ අවධානය යොමු කරමින් හිංසනයට හා මානසික පීඩනයට ලක් වී ඇති කාන්තාවන් සඳහා උපදේශන වැඩසටහන්, උපදේශන මධ්‍යස්ථාන හා සම්පත් මධ්‍යස්ථාන වැඩසටහන ක්‍රියාත්මක කිරීම

05.මිනිස් ජාවාරම පිළිබඳ ළමුන් හා කාන්තාවන් දැනුවත් කිරීමේ වැඩසටහන

06. ස්ත්‍රී ගෘහ මූලික පවුල් සඳහා ආර්ථික සවිබල ගැන්වීමේ වැඩසටහන

07 වනිතා සංවර්ධන නිලධාරීන් බඳවා ගැනීම

08. වනිතා සංවර්ධන නිලධාරීන් හා අනෙකුත් ක්ෂේත්‍ර නිලධාරීන් 200 කට පමණ උපදේශන පුහුණු වැඩසටහන

<u>ජාතික කාන්තා කමිටුව</u>

01 කාන්තාවන් සඳහා වැටුප් දේපල අයිතිය, රජයේ සේවය හා අනෙකුත් අදාල අංශවලදී සමානත්වයේලා සැලකීම සුරැකීම සඳහා නීති හඳුන්වාදීම
   I. සුනාමියෙන් අවතැන් වූවන් නැවත පදිංචි කරවීමේදී කාන්තා ඉඩම් අයිතිය, ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ පර්යේෂණයක් කිරීම
   II. අවිධිමත් අංශයේ කාන්තාවන් විසින් ශ්‍රී ලංකා ආර්ථිකයට සිදු කරන දායකත්වය පිළිබඳව පර්යේෂණ සිදු කිරීම

02. පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල අපේක්ෂක ලැයිස්තුව නියෝජනය අවම වශයෙන් 25% කින් වැඩි කිරීමට කටයුතු කිරීම

03. කාන්තා සංවිධානවල සහ අදාළී රාජ්‍ය නොවන සංවිධානවල සහභාගීත්වයෙන් කාන්තා අයිතිවාසිකම් සඳහා වූ කාන්තා අයිතිවාසිකම් සඳහා ප්‍රඥප්තියක් සම්පාදනය කිරීම

04. මානසික හා කායික වශයෙන් හිංසනයට පත්වන කාන්තාවන්ගේ රැකවරණය තහවුරු කිරීම

05 සුනාමියෙන් විපතට පත් කාන්තාවන් සඳහා සහන හා රැකවරණය සැලසීම

06. කාන්තාවන් සඳහා වන පස් අවුරුදු ක්‍රියාකාර සැලැස්ම

07 සංවර්ධනයේදී ස්ත්‍රී පුරුෂ සමාජභාවීය විෂමතාවයන් අවම කිරීම

<u>ළමා ලේකම් කාර්යාලය</u>

01. පෙර පාසල් සහ දිවා සුරැකුම් මධ්‍යස්ථානවල තත්ත්වය තාක්ෂණ සහ මූල්‍ය ප්‍රතිපාදන ලබා දීම තුළින් ජාත්‍යන්තර මට්ටමකට නගා සිටුවීම
   I. පෙර පාසල් / මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සංවර්ධනය කිරීම සහ ගුරු පුහුණු වැඩසටහන
   II. පෙර පාසල් / මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානය සඳහා අවම ප්‍රමිතීන් හඳුන්වා දීම
   III. මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලා ආයතන ලියාපදිංචි කිරීම සහ එම ආයතන අධීක්ෂණය
   IV මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන ගුරුවරියන් සඳහා ඩිප්ලෝමා පාඨමාලාව පැවැත්වීම
   V යහළු මඩල මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සඳහා සෙල්ලම් මිදුල සැකසීම
   VI. මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සඳහා අධ්‍යාපන උපකරණ කට්ටල බෙදා දීම

2. "පෝෂණ මංපෙත"

සමස්ත සංවර්ධනයෙන් යුක්ත නිරෝගී දරු පරපුරක් මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන ඇසුරින් බිහි කිරීමේ වැඩසටහන

   01 මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සඳහා ආදර්ශ ගෙවතු වගා සැකසීම
   02. මුල් ළමාවිය සංවර්ධන සහකාර නිළධාරීන්, මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන ගුරුවරියන් හා රැකබලා ගන්නන් සඳහා පුහුණු වැඩසටහන

3. මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම
   01 ජාතික, පළාත්, ප්‍රාදේශීය හා ග්‍රාමීය කමිටු පිහිටුවීම සහ නියමිත පරිදි රැස්වීම් පැවත්වීම
   02. මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය පනතක් බවට පත් කිරීම

4. සෙනෙහෙ තටාක - නිවස පදනම් කරගත් මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ වැඩසටහන
   01 දෙමාපිය දැනුවත් කිරීමේ වැඩසටහන
   02. රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන
   03. යොවුන කණ්ඩායම් දැනුවත් කිරීමේ වැඩසටහන
   04. නිවස පදනම් කරගත් මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ නියමු ව්‍යාපෘතිය

5 පිකිරි මිතුරු - මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ මාධ්‍ය වැඩසටහන

6. මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ දිවයින පුරා සමීක්ෂණය තුළින් දත්ත පද්ධතියක් ඇති කිරීම

7 මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ වෙබ් අඩවිය නිර්මාණය කිරීම

8. මුල් ළමාවිය රැකවරණය පිළිබඳ ආදර්ශ ගම්මාන පිහිටුවීම පිළිබඳ නියමු ව්‍යාපෘතිය.

9 සොඳුරු සෙවන දිවා සුරකුම් මධස්ථාන වැඩසටහන
   01 විශේෂ අවධානය යොමු කල යුතු මුල් ළමාවියේ දරුවන් සිටින ස්ථානයන්හි ළමා සුරැකුම් මධ්‍යස්ථාන ඇති කිරීම.
   02. දිවා සුරැකුම් මධ්‍යස්ථාන පාලිකාවන් දැනුවත් කිරීමේ වැඩසටහන්
   03. දිවා සුරැකුම් මධ්‍යස්ථානවල තත්ත්වය වැඩි දියුණු කිරීම

10 මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික මට්ටමේ සම්පත්දායක සංචිතයක් සහ සම්පත් මධ්‍යස්ථානයක් ඇති කිරීම

11 මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධන වැඩසටහන් ජාලගත කිරීමේ වැඩසටහන
පිකිරි මිතුරු මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ මාධ්‍ය වැඩසටහන

12. මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ප්‍රමිතීන් සකස් කිරීම

13. මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ අරමුදලක් ඇති කිරීම
   01. සහන ගම්මානවල මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සහ සෙල්ලම් මිදුල සැකසීම. නැවත පදිංචි කළ ගම්මාන වල පෙර පාසල් ආරම්භ කිරීම

14. වයස මාස 24ට වැඩි හා මාස 60ට අඩු ආදායම්ලාභී දරුවන්ට නැවුම් කිරි වීදුරුවක් ලබා දීම

**පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව**

01. ළමා නිවාස දරුවන්ගේ මාසික දීමනාව දෙගුණ කිරීම

02 ළමුන්ට අවශ්‍ය ආරක්ෂාව සහ පහසුකම් ලබාදීම තහවුරු කිරීම සඳහා ළමා නිවාස වල කළමණාකාරීත්වය විධිමත් කිරීම

03. සුනාමියෙන් දෙමාපියන් දෙදෙනාම හෝ භාරකරුවන් අහිමි ළමුන්ගේ වියදම් දැරීම සඳහා රු.මි.500 ක අරමුදලක් පිහිටුවීම

04. දුෂ්කර තත්ත්වයන්ට පත් ළමුන් සඳහා ආධාර ලබාදීම

05. පාසල් නොයන ළමුන් පාසල් ගත කිරීම

06. සෙවණ සරණ කැපකරු මාපිය ක්‍රමය

07 අපයෝජනයට පත් දරුවන් පුනරුත්ථාපනය කිරීම

08. ළමුන්ගේ සහභාගිත්ව අයිතිය තහවුරු කිරීම සඳහා ළමා සමාජ ස්ථාපිත කිරීම හා ළමා සභාව පිහිටුවීමේ වැඩසටහන

09. ආයතනගත ළමුන් පුනරුත්ථාපනය කිරීම

10. කැපකරු දෙගුරු වැඩසටහන

11. සිද්ධි කළමණාකරණය පිළිබද ප්‍රතිපත්තිය සැකසීම

12 ළමාරක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාව

13. ළමුන් හා යෞවනයන් පිළිබද ආඥාපණත සංශෝධනය

14. ළමා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමේ ආදර්ශ ගම්මාන වැඩ සටහන

(ii). මෙම ව්‍යාපෘතින් හරහා ජනතාවට ලැබී ඇති ප්‍රතිලාභ.

ඉහත දක්වා ඇති ව්‍යාපෘතින් හරහා ( ඇමුණුමෙහි පරිදි ජනතාවට ප්‍රතිලාභ ලැබී ඇත.

(iii) ඉදිරියේදී ළමා සංවර්ධන හා කාන්තා කටයුතු සම්බන්ධයෙන් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සංවර්ධන ව්‍යාපෘතින්.

දැනට ක්‍රියාත්මක වෙමින් පවතින ඉහත I හා II සංවර්ධන වැඩසටහන් හා ප්‍රතිලාභවලට අමතරව පහත සඳහන් නව සංවර්ධන වැඩසටහන් ද ක්‍රියාත්මක වේ.

2012 වර්ෂය සඳහා අපේක්ෂිත නව වැඩසටහන්/ ව්‍යාපෘති

ළමා ලේකම් කාර්යාලය

1 විශේෂ අවශ්‍යතා ඇති දරුවන්ගේ කුසලතා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය

දැනට ශ්‍රී ලංකාවේ සිටින මුල් ළමාවියේ දරුවන්ගෙන් යම් ප්‍රතිශතයක් විශේෂ අවශ්‍යතා ඇති දරුවන් ය. මෙම දරුවන් පිළිබඳ දිවයින ආවරණය වන පරිදි විධිමත් සමීක්ෂණයක තොරතුරු ළමා ලේකම් කාර්යාලය වෙත ලැබී නොමැති අතර දැනට ලබා ගත හැකි දත්ත අනුව එම දරුවන්ගේ බහුතරයක් පිළිබඳව විශේෂ අවධානයක් යොමු කර විශේෂිත සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමක් දක්නට නොලැබේ. අධ්‍යාපන අමාත්‍යාංශය, සමාජසේවා අමාත්‍යාංශය වැනි රාජ්‍ය ආයතන මෙන්ම රාජ්‍ය නොවන ආයතන ද විවිධ වැඩසටහන් සිදු කළ ද මුල් ළමාවියට විශේෂිතව එම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ අඩුවක් දක්නට ඇත. එබැවින් ළමා ලේකම් කාර්යාලය මඟින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සඳහා අනුයුක්ත කර ඇති මුල් ළමාවිය සංවර්ධන සහකාර නිලධාරීන් මඟින් එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල මුල් ළමාවියේ පසුවන විශේෂ අවශ්‍යතා ඇති දරුවන් පිළිබඳව තොරතුරු සොයාබලා එම දරුවන්ගේ හැකියාවන් සංවර්ධනය කිරීම සඳහා ව්‍යාපෘතියක් දියත් කිරීමට කටයුතු කළ හැකිය.

2. වයස අවුරුදු 3-5 අතර දරුවන්ගේ දෙමාපියන් සඳහා ප්‍රමිතීන් සකස් කිරීම

"මුල් ළමාවිය" පුද්ගල ජීවිතය හා සම්බන්ධ තීරණාත්මක වැදගත්කමකින් යුක්ත බැවින් දරුවන්ගේ සමස්ත සංවර්ධන අවශ්‍යතා සපුරාලීමට අවශ්‍ය ප්‍රමාණවත් සේවාවක් සැපයීම සහතික කිරීම සඳහා මේ වන විට මුල් ළමාවිය සංවර්ධන ප්‍රමිතීන් සකස් කර ඇත. එය ප්‍රධාන වශයෙන් කොටස් 04 කින්, එනම් කායික, සමාජ හා චිත්තවේග, ප්‍රජානන භාෂාව, හා මූලික සාක්ෂරතා යන අංශවලින් යුක්ත වන අතර එය ආශ්‍රිත කර ගනිමින් ප්‍රමිතීන් සකස් කර ඇත.

මෙම ප්‍රමිතීන්වල අනෙක් අදියර වන්නේ දෙමාපියන් සඳහා ප්‍රමිතීන් සකස් කිරීමයි. ලෝකයේ අනෙකුත් රටවල් එනම් බංගලාදේශය, ඝානාව, වැනි රටවල දරුවන් වෙනුවෙන් පමණක් නොව දෙමාපියන් මෙන්ම මුල් ළමාවියේ දරුවන් සමඟ කටයුතු කරන අනෙකුත් අය සඳහා ද ප්‍රමිතීන් සකස් කර ඇත. ශ්‍රී ලංකාවේ දරුවන් සඳහා ශාරීරික, මනෝසමාජීය සහ ප්‍රජානන සංවර්ධනයෙන් යුතු මුල් ළමාවිය දරු පරපුරක් බිහි කිරීම සඳහා දෙමාපියන්ට ද ප්‍රමිතීන් සකස් කර දී දරුවන්ට අවශ්‍ය ළමා මිතුරු පරිසරයක් නිවස තුළ ඇති කිරීමට කටයුතු කිරීම අත්‍යවශ්‍ය වූවකි.

3. ආපදා අවදානම අවම කිරීමේ කාර්යය තුළදී මුල් ළමාවිය සංවර්ධනය තහවුරු කිරීම

ශ්‍රී ලංකාව තුළ දැනට පවතින කාලගුණික හා දේශගුණික විපර්යාසයන් හේතු කොටගෙන විවිධ හදිසි ආපදා අවස්ථා මෙන්ම මිනිසා විසින් ඇති කරනු ලබන ආපදා අවස්ථා ඇති වන විටක දී ඒවායෙහි බලපෑමට ලක්වන පිරිස අතර මුල් ළමාවියේ දරුවන් ද සිටින අවස්ථා බොහෝ විට දැකිය හැක. මුල් ළමාවියේ දරුවාගේ සමස්ත සංවර්ධනය අරමුණු කොට ගෙන ක්‍රියාවට නැංවෙන විවිධ වැඩසටහන් මඟින් දරුවාගේ සංවර්ධන මට්ටමෙහි වර්ධනයක් දැකිය හැක. මෙසේ පෙර පාසල් මඟින් හෝ වෙනත් ළමා රැකවරණ ආයතනයකින් හෝ දරුවා වෙනුවෙන් ක්‍රමානුකූලව අඛණ්ඩව කරගෙන යනු ලබන සංවර්ධන වැඩපිළිවෙළ මෙවැනි ආපදා අවස්ථාවක දී අඩාල විය හැක. මෙවැනි අවස්ථාවන්හිදී සිදුවන හදිසි සිදුවීම් නිසා දරුවා කම්පනයට පත්වීම, මානසික ආතතිය, ඇතැම් විට දරුවන්ගේ භාරකරුවන් අහිමි වීම සහ ඒ නිසා සිදුවන මානසික විපර්යාස වැනි තත්ත්වයන් හේතුවෙන් එම දරුවන්ගේ මනෝ සමාජීය පරිසරය නිතැතින්ම වෙනස් ස්වරූපයක් ගනු ලබන අතර චිත්තවේග සංවර්ධනයට ද බාධා ඇති කරයි. මෙවැනි තත්ත්වයන් තුළදී මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය සම්බන්ධයෙන් කටයුතු කරන පුද්ගලයින්, ආයතන හා පාර්ශවයන් කටයුතු කල යුත්තේ කෙසේ ද යන්න පිළිබඳව අවධානය යොමු කිරීම කාලෝචිත වේ. එමනිසා ආපදා අවදානම අවම කිරීමේ සැලසුම් තුළට මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය සම්බන්ධ වැඩසටහන් ද ඇතුළත් කිරීම තුළින් දරුවාගේ සමස්ත සංවර්ධනය සහතික කිරීම මෙහි අරමුණ වේ.

**පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව**

1.නීති ප්‍රතිසංස්කරණ හා ප්‍රතිපත්ති සංවර්ධනය

ක්‍රියාකාරකම්

- සිද්ධි කළමනාකරණ ප්‍රතිපත්තිය භාවිතයට ගැනීමට අවශ්‍ය පහසුකම් සංවර්ධනය කිරීම.
- ළමයින් හා යෞවනයින් පිළිබඳ ආඥා පනත සංශෝධන නීතිගත කිරීම.

2. බහුවිධ අංශීය ප්‍රවේශය

ක්‍රියාකාරකම්

- පවුල් හමු තාක්ෂණය භාවිතයට ගැනීම සඳහා නිලධාරීන් පුහුණු කිරීම.
- ප්‍රජාව සමඟ වැඩ කිරීමේ නව ක්‍රමවේද පිළිබඳ නිලධාරීන් දැනුවත් කිරීම.

3. ප්‍රජාව හා ළමුන් බලගැන්වීම

ක්‍රියාකාරකම්

- ළමා සමාජ හා ළමා සහා ව්‍යාපෘතිය ශක්තිමත් කිරීම.
- ළමා ප්‍රඥප්තියට අදාළ කමිටු පද්ධතිය ශක්තිමත් කිරීම හා යාවත්කාලීන කිරීම
- ජාතික ළමා සභාව මඟින් අධිකරණ, මාධ්‍ය, අධ්‍යාපන අමාත්‍යාංශ සමඟ සම්බන්ධතා පැවැත්වීම

- ළමා අයිතිවාසිකම් සුරක්ෂිත ගම්මාන ව්‍යාපෘතිය පුළුල් කරමින් ප්‍රජාව බලගැන්වීම හා ළමාරක්ෂණය ශක්තිමත් කිරීම.
- වඩා බරපතළ අවදානමට පත්විය හැකි ළමුන් සිටින පවුල් පිළිබඳ දිප ව්‍යාප්ත සමීක්ෂණ පවත්වා අදාළ තොරතුරු සිතියම්ගත කිරීම. ඒ අනුව අදාළ සේවාවන් ක්‍රියාත්මක කිරීම.

**ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය**

1 ධීවර කාන්තා වැඩසටහන (නියමු වැඩ සටහන)

ධීවර පවුල්වල කාන්තාවන් ආර්ථික හා සමාජයීය වශයෙන් වඩාත් ශක්තිමත් හා යැපුම් මානසිකත්වයෙන් මිදුණු ඵලදායී පිරිසක් බවට පත්වීම. ඔවුන් ජීවත්වන පවුල් පරිසරයේ සාමකාමී හා තෘප්තිමත් බවට පත් කිරීම.

ප්‍රතිලාභ

අදායම් උත්පාදන ව්‍යාපෘති හඳුන්වා දීම තුළ පවුල ආර්ථික හා සමාජයීය වශයෙන් ශක්තිමත්වීම.ධීවර කර්මාන්තයේ නොයෙදෙන කාලයේදී පවුලේ පෝෂණ සුරක්ෂිත භාවය තහවුරුවීම.

2. විදේශගත කාන්තාවන් සඳහා වූ වැඩ සටහන

විදේශගතවන කාන්තාවන්ට දේශීය වශයෙන් තම ආර්ථිකය හා සමාජ තත්ත්වය ගොඩනගා ගැනීමට අවශ්‍ය ඉඩ ප්‍රස්ථාවන් හඳුන්වා දෙමින් විදේශගතවීම නිසා ඇතිවන ආර්ථික හා සමාජයීය අහිටුවල විපාක පිළිබඳ දැනුවත්භාවය වැඩි කරමින් විදේශගතවීමේ ප්‍රවනතාව අඩු කිරීම සහ එතුළින් විදේශගත නොවී කාන්තාවන්ගේ ආර්ථික හා සමාජයීය තත්ත්වය ඉහළ නැංවීම.

විකල්ප ආදායම් උත්පාදන මාර්ග හඳුන්වා දීම තුළ කාන්තාවන් නිවසේ රැදීම මගින් පවුල් ඒකකය සුරක්ෂිත වීම.දරුවන්ගේ ආරක්ෂාව තහවුරු වීම හා ළමා අපචාර වැළැක්වීම

3. ප්‍රජනක සෞඛ්‍යය වැඩ සටහන

නව යොවුන්, තරුණ, වැඩිහිටි හා සමාජය හා නිලධාරීන් තුළ ප්‍රජනන සෞඛ්‍යය පිළිබඳ ප්‍රමාණවත් දැනුම වර්ධනය කිරීම තුළින් පවුල් ජීවිතය හා සමාජයීය වශයෙන් ඇතිවන අහිතකර ගැටලු අවම කිරීම.

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

උදා:- අනවශ්‍ය ගැබ් ගැනීම් / ගබ්සා කිරීම් වැළැක්වේ.

ළමා ගැබ් ගැනීම් වැළකේ.

ලිංගාශ්‍රිත රෝග (ඒඩ්ස්) වලට පාත්‍ර වීම වැළකේ.

**වැන්දඹු හා ගෘහ මූලික කාන්තාවන් සවිබල ගැන්වීමේ වැඩසටහන**

අමාත්‍යාංශය විසින් දැනට රැස්කර ඇති වැන්දඹු තොරතුරු සහ වනිතා සංවර්ධන නිලධාරීන් මඟින් ලබා ගන්නා තොරතුරු අනුව ආර්ථික වශයෙන් සවිබල ගැන්විය යුතු පවුල් හඳුනාගෙන ආදායම් උත්පාදන ව්‍යාපාති ක්‍රියාත්මක කිරීම හා සමාජයමය වශයෙන් සවිබල ගැන්වීම උදෙසා දැනුවත් කිරීමේ වැඩසටහන් , උපදේශන වැඩසටහන් සැලසුම් කොට ක්‍රියාත්මක කිරීම.

වැන්දඹු කාන්තාවන් ආර්ථික වශයෙන් ශක්තිමත් වේ.

සමාජමය පිළිගැනීමක් ඇති වේ.

දරුවන්ගේ සුරක්ෂිතභාවය ඇති වේ.

(iv) ඒවායින් අපේක්ෂිත ප්‍රතිඵල

**ළමා ලේකම් කාර්යාලය**

1 **විශේෂ අවශ්‍යතා ඇති දරුවන්ගේ කුසලතා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය**

ප්‍රතිලාභ

- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 10 ක මුල් ළමාවියේ පසුවන විශේෂ අවශ්‍යතා ඇති දරුවන් හඳුනා ගැනීම.
- එම දරුවන්ගේ සමස්ත සංවර්ධනය ඇති කිරීම සඳහා ක්‍රියාකාරකම් හඳුන්වා දීම.
- තෝරාගත් කොට්ඨාසවල සිටින විශේෂ අවශ්‍යතා ඇති දරුවන්ගේ සමස්ත සංවර්ධනය සහතික කිරීම.
- මුල් ළමාවියේ සිටින විශේෂ අවශ්‍යතා ඇති දරුවන්ගේ සංවර්ධනය පිළිබඳව දෙමව්පියන් තුළ අවබෝධයක් ඇති කිරීම.

2. **වයස අවුරුදු 3-5 අතර දරුවන්ගේ දෙමාපියන් සඳහා ප්‍රමිතීන් සකස් කිරීම**

ප්‍රතිලාභ

- නිවස ආශ්‍රිත භෞතික පරිසරය මුල් ළමාවිය ක්‍රියාකාරකම්වලට ගැලපෙන පරිදි සකස් කිරීම.
- නිවසේ මනෝ සමාජීය පරිසරය දරුවාට හිතකර ලෙස පවත්වාගෙන යෑම.
- මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ පවුලේ සාමාජිකයන්ගේ දැනුම, ආකල්ප, කුසලතා වර්ධනය කිරීම.
- දරුවන්ට හිතකර ප්‍රමිතීන් නිවස තුළ සකස් කිරීමෙන් පසු එම පවුල් ඇතුළත් ගම්මාන ආදර්ශ ගම්මාන බවට පත් කිරීම.

3. **ආපදා අවදානම අවම කිරීමේ කාර්යය තුළදී මුල් ළමාවිය සංවර්ධනය තහවුරු කිරීම**

ප්‍රතිලාභ :

- **ආපදා අවදානම අවම කිරීමේ සැලසුම්තුළට මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධන වැඩසටහන් ඇතුලත් කිරීම .**
- **දරුවාගේ සමස්ත සංවර්ධනය සහතික කිරීම.**

**පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව**

**1.නීති ප්‍රතිසංස්කරණ හා ප්‍රතිපත්ති සංවර්ධනය**

**ප්‍රතිලාභ**

**අනාථ, අත්හල හා අයිතිවාසිකම් කඩවීම්වලට ලක්වූ දරුවන්ගේ අයිතිවාසිකම් හා ආරක්ෂාව සහතික වීම.**

**2. බහුවිධ අංශීය ප්‍රවේශය**

**ප්‍රතිලාභ**

**දරුවන් හා දෙමාපියන් /වැඩිහිටියන් අතර සුහදතාවය සහ අන්‍යොන්‍ය සහයෝගය වර්ධනය වීම තුළින් ළමුන්ට වඩා සුරක්ෂිත පවුල් පරිසරයක් නිර්මාණය වීම හා ළමා ගැටලු විසඳීමට සිටින නිලධාරීන්ගේ ශක්‍යතා වර්ධනය .**

**3. ප්‍රජාව හා ළමුන් බලගැන්වීම**

**ප්‍රතිලාභ**

**ළමා ආරක්ෂාව හා අයිතිවාසිකම් තහවුරුවීමට ළමුන්ගේ හා ප්‍රජාවේ උපරිම දායකත්වය ලැබෙන හිතකර සමාජයක් නිර්මාණය.**

**2012 ඉදිරි සංවර්ධන වැඩසටහන්වල ප්‍රතිඵල**

01. ඉහළ ප්‍රමිතියකින් හා ගුණාත්මක භාවයකින් යුතු පෙර පාසල් හා මුල් ළමාවිය සංවර්ධන සේවාවන් තුළින් මුල් ළමාවියේ දරුවන්ගේ කායික මානසික හා සංප්‍රජානීය සංවර්ධනයක් ඇතිවීම.
    පිරිපුන් හා ඉහළ සාධනයකින් යුතු දරු පරපුරක් පාසල් අධ්‍යාපනයට පිවිසීම.

02. දරුවන් හා කාන්තාවන් පිළිබඳ මනා අවබෝධයක් හා සංවේදීතාවයෙන් යුතු සමාජයක් බිහිවීමෙන් ළමුන්ට හා කාන්තාවන්ට එරෙහිව සිදුවන හිංසනයන් හා අයිතිවාසිකම් කඩවීම් අවම වීම.

03. කාන්තාවන් දැනුවත් වීම ඔවුන්ගේ කුසලතාවයන් වර්ධනය වීම හා ඔවුන්ට ඉදිරියට යාමේදී ඇති ගැටලු අවම කිරීම තුළින් සංවර්ධන ක්‍රියාවලියට සහභාගි වීමේදී හා ප්‍රතිලාභ භුක්ති විඳීමේදී ස්ත්‍රීන්ටත් පුරුෂයන්ට මෙන් සමාන අවස්ථා ලැබීම.

04. කාන්තාවන්ට නව රැකියා/ආදායම් වර්ධන අවස්ථා හා තරඟකාරී වෙළඳ පොළ අවස්ථා ලැබීමෙන් ඔවුන් ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම හා එතුලින් කාන්තාවන් යැපීමේ මට්ටමෙන් මිදීම.

05. ළමා හා කාන්තා හිංසන හා අතවරවලට එරෙහිව සමාජය ක්‍රියා කිරීමට පෙළඹීම තුළින් ළමා හා කාන්තා හිංසනය අවම වීම.

06. යහපත් ගතිගුණ ආකල්ප හා දැනුම වර්ධනය තුළින් ශ්‍රී ලාංකික ළමා හා කාන්තා ප්‍රජාව නව ලෝකයේ අභියෝග වලට සාර්ථකව මුහුණ දිය හැකි ශක්තිමත් පිරිසක් බවට පත්වීම.

(ආ) පැන නොනඟී.

ආයතනය / අංශය : සංවර්ධන අංශය

| අනු අංක | සංවර්ධන වැඩසටහන්/ව්‍යාපෘතිය | අරමුණ | ප්‍රතිලාභ |
|---|---|---|---|
| 1 | වැන්දඹු හා ගෘහ මූලික කාන්තාවන් ශක්තිමත් කිරීමේ වැඩසටහන | වැන්දඹු හා ගෘහ මූලික කාන්තාවන්ට වත්මන් සමාජය හමුවේ ඇතිඅභියෝග වලට සාර්ථකව මුහුණ දීම සඳහා අවශ්‍ය සමාජයීය,ආර්ථික, මානසික තත්ත්වය ශක්තිමත් කිරීම. | වෙනස්වන සමාජ, ආර්ථික සහ සංස්කෘතික පරිසරයට ගැලපෙන අයුරින් එම කාන්තා පවුල් ඒකක සංවර්ධන කිරීම හා සවිබල ගැන්වීම පවුල් 150 ක් සඳහා රු.මිලි. 2.25 |
| 2 | ජාතික ළමා සංවර්ධන අරමුදල | ආර්ථික දුෂ්කරතාවයන්ගෙන් පෙළෙන දිළිඳු, අසරණ හා අන්හල දරුවන්ට විශේෂයෙන්ම<br>අධ්‍යාපනය ඇතුළු අවශ්‍යතාවයන් සපුරා ගැනීමට අවශ්‍ය මූල්‍යමය සහය ලබාදීම. | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ඉල්ලුම්පත් ආශ්‍රයෙන් තොරතුරු රැස්කර එය සලකා බැලීමෙන් අනතුරුව සුදුසු ළමුන් සඳහා ආධාර නිකුත් කෙරේ.<br>පාසල් දරුවන් 733<br>රු.මි. 4.93 ක ශිෂ්‍යාධාර ලබා දී ඇත. |
| 3 | ළමා ආරක්ෂාව සඳහා පවුල ශක්තිමත් කිරීමේ වැඩසටහන | ඉතා දිළිඳු පවුල් සංවර්ධනය කරමින් කාන්තාවන් හා ළමුන් ගේ සමාජ, ආර්ථික තත්ත්වය<br>ඉහළ නැංවීම | අදාල පවුල්වල දරිද්‍රතාවය අඩුකර ගැනීමට පිළියම් යොදා ඔවුන් සමාජයීය, ආර්ථික වශයෙන් සවිබල ගන්වා කාන්තාවන් හා ළමුන්ගේ ජීවන තත්ත්වය ඉහල නැංවීම පවුල් 200<br>රු.මි. 0.215 |
| 4 | ස්ත්‍රී / පුරුෂ සමාජභාවය මූලප්‍රවාහකරණය පිළිබඳ වැඩසටහන | සංවර්ධන ක්‍රියාවලියේ දී හා ප්‍රතිලාභ ගලායාමේ දී ස්ත්‍රී පුරුෂ වශයෙන් දක්නට ලැබෙන<br>විෂමතාවයන් අවම කර ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවයක් ඇති කිරීම සඳහා එම<br>[illegible] | අමාත්‍යාංශ 45 ක කාන්තා කේන්ද්‍ර නිළධාරීන් පත් කර ඇත. දැනුවත් කිරීමේ වැඩසටහන් 02, රැස්වීම් 04 රු.මි.0.213 |
| 5 | යුද්ධයෙන් හෝ වෙනත් කරුණක් නිසා අනතුරකට පත් වූ / තාඩන පීඩනවලට ලක් වූ කාන්තාවන් සඳහා පහසුකම් සැපයීමේ වැඩසටහන් | දශක තුනක් තිස්සේ පැවැති කුරිරු යුද්ධය නිසා හෝ වෙනත් හේතුවක් නිසා අවතැන් වූ<br>කාන්තාවන්ගේ සුභසාධනය සඳහා සෞඛ්‍ය සායන පැවැත්වීම, සාක්ෂරතාවය වැඩි දියුණු<br>කිරීම, මනෝ සමාජයීය යහපැවැත්ම ඇති කිරීම යන මූලික අවශ්‍යතාවයන් පිළිබඳ සොයා බැලීම තුළින් ඔවුන් යහපත් සමාජයට අනුගත කිරීම. | 2010 වර්ෂයේ ආරම්භ කර ඇත පවුල් හත්දහසකට වියළි ආහාර, සෞඛ්‍ය හා සනීපාරක්ෂක ද්‍රව්‍ය ඇතුළු සුබසාධන පහසුකම් සපයා ඇත. අනුරාධපුර,<br>මඩකලපුව, ගම්පහ, මොණරාගල, යාපනය යන දිස්ත්‍රික්ක 5 තුළ සමාජ සත්කාරක සේවාවක් ආරම්භ කිරීමට නියමිතය. |
| 6 | ලෝක ළමා දිනයට සමගාමීව වැඩසටහන් | සෑම වසරකම ඔක්තෝබර් 01 දිනට යෙදෙන ලෝක ළමා දිනයට සමගාමීව තෝරාගත්<br>තේමාවක් ඔස්සේ ළමුන් ඉලක්ක කරගත් වැඩසටහන් ක්‍රියාවට නැංවීම හා ළමුන් කෙරෙහි<br>ජනතා සංවේදී වැඩසටහන් දියත් කිරීම. | ළමුන් 2900<br>රු.මි. 13.23 |

ආයතනය / අංශය : සංවර්ධන අංශය

| අනු අංක | සංවර්ධන වැඩසටහන්/ව්‍යාපෘතිය | අරමුණ | ප්‍රතිලාභ |
|---|---|---|---|
| 7 | දිස්ත්‍රික් ළමා සංවර්ධන කමිටු ක්‍රියාත්මක කිරීම | දිස්ත්‍රික් මට්ටමේ දී ළමා ආරක්ෂාව හා සංවර්ධනය සම්බන්ධයෙන් කාර්යක්ෂම හා ඵලදායීව ක්‍රියාකාරී වීම. | කමිටු රැස්වීම් හා තීරණ අධීක්ෂණය කරන අතර කමිටු මගින් ළමා අපයෝජන හා ආරක්ෂාවට අදාල දිස්ත්‍රික් මට්ටමේ දත්ත රැස්කිරීම, පවත්වාගෙන යාම, නිලධාරීන් හා ප්‍රජාව දැනුවත් කිරීම සහ ප්‍රාදේශීය ළමා සංවර්ධන කමිටු දිස්ත්‍රික් මට්ටම හා සම්බන්ධීකරණය කරනු ලබයි. 2009, 2010 වර්ෂ<br>තුළ කමිටු රැස්වීම් 33<br>රු.මි.ලි. 0.664 |
| 8 | බියගම කාන්තා සෙවන ආදර්ශ නේවාසිකාගාරය | වඩා ආරක්ෂිත හා ප්‍රමාණවත් පහසුකම්වලින් සැදි නේවාසිකාගාර පහසුකම් ලබාදීම තුළින්<br>නිදහස් වෙළඳ කලාපීය සේවිකාවන් ගේ සුභසාධනය සහ ඔවුන්ගේ ශ්‍රම ඵලදායීතාව ඉහළ නැංවීම. නිදහස් වෙළඳ කලාපීය කාන්තා සේවිකාවන් සඳහා ගුණාත්මක තත්ත්වයේ නේවාසික පහසුකම් සැපයීමට පෞද්ගලික හා රාජ්‍ය නොවන සංවිධාන ඇතුළු බාහිර පාර්ශවයන්ට ආදර්ශයක් සැපයීම. | දැනට එහි සේවිකාවන් 256 දෙනෙක් රැඳී සිටිති. නේවාසිකාගාර නඩත්තු අරමුදල සඳහා මසකට එක් අයකුගෙන් රුපියල් දහසක් බැගින් අය කෙරේ. මෙතෙක් නඩත්තු වියදම් මෙම අමාත්‍යාංශය මගින් දැරූ අතර, 2011 ඔක්තෝබර් මස පැවති සාකච්ඡාවට පසුව එම සියලු වියදම් බියගම කර්මාන්ත හිමියන්ගේ සංගමය මගින් දැරීමට ගිවිස ගන්නා ලදි. |
| 9 | ජාත්‍යන්තර කාන්තා දිනය | සෑම වසරකම මාර්තු 08 දිනට යෙදෙන ජාත්‍යන්තර කාන්තා දිනය නිමිත්තෙන් ප්‍රධාන තේමාවක් ඔස්සේ කාන්තාවන් සවිබල ගැන්වීම සඳහා ප්‍රජාව සංවේදී කිරීම හා ඊට අදාල වැඩසටහන් දියත් කිරීම.,කාන්තාවන්ට යහපත් සමාජයක් ගොඩනැංවීම<br>[illegible] | රු.මි. 9.46 |
| 10 | ළමුන් සඳහා වන ජාතික ක්‍රියාකාරී සැලැස්ම (2004/2008) ක්‍රියාත්මක කිරීම | රාජ්‍ය ආයතන හා අනුග්‍රාහක ආයතන වල සහභාගිත්වයෙන් සෑම අංශයකින්ම සුබසාධනය හා සංවර්ධනය තහවුරු කිරීම | රු.මි. 176 |
| 11 | ළමුන් සඳහා වූ සාර්ක් රටවල අමාත්‍යවරුන්ගේ සම්මේලනය | 2009 වර්ෂයේ ජූලි මාසයේ සාර්ක් රටවල සහභාගිත්වයෙන් ළමුන් සඳහා අමාත්‍යවරුන්ගේ<br>[illegible] | රු.මි.15 |
| 12 | එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල (UNFPA) | ස්ත්‍රී පුරුෂ සමාජභාවීය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුළින් ප්‍රජාව දැනුවත් කිරීම.<br>**පිරිමින්ට පමණයි වැඩසටහන**<br>කාන්තාවන් සවිබල ගැන්වීම හා ඔවුන්ගේ අයිතිවාසිකම් තහවුරු කිරීම හා ඔවුන්ට හිතකර පවුල් හා සමාජ පරිසරයක් ගොඩ නැගීමට කාන්තාවන් පිළිබඳ සංවේදී වූ සහ දැනුවත් වූ පිරිමින්ගේ ක්‍රියාකාරී දායකත්වය ලබා ගැනීම. විශේෂයෙන් මේ තුළින් ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ වෙනස්කම් අවම කිරීමට අවශ්‍යය.පිරිමි පාර්ශවයේ මැදිහත්වීමෙන් තවදුරටත් තහවුරු කෙරේ. | කාන්තා අයිතිවාසිකම් තහවුරු කිරීමට අදාලව "කාන්තාවන්ට එරෙහි සියලු අකාරයේ හිංසනයන් පිටුදැකීමේ සම්මුතියේ" වගන්ති ඇතුළත් දින පොතක් මුද්‍රණය කරන ලදි. අමාත්‍යාංශ නිලධාරීන්ගේ දැනුම හා කුසලතා වර්ධනය කිරීම උදෙසා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මූල ප්‍රවාහය, කාන්තාව සහ බුදු දහම, කාන්තාව හා මාධ්‍ය, ව්‍යපාති වාර්තා සැකසීම පිළිබඳ පුහුණු වැඩසටහන් පවත්වන ලදි. පිරිමින්ටද වෙනසක් කළ හැකිය යන තේමාව යටතේ කොළඹ හා අනුරාධපුරයේදී වැඩසටහන් 02 ක් පවත්වා ඇත. |

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

ආයතනය / අංශය : ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය

| අනු අංක | සංවර්ධිත වැඩසටහන්/ව්‍යාපෘතිය | අරමුණ | ප්‍රතිලාභ |
|---|---|---|---|
| 1 | "කාන්තා සවිය" වැඩසටහන යටතේ කාන්තාවන් සවිබල ගැන්වීම<br>1.වතු අංශයේ/ ධීවර අංශයේ මූල්‍ය කළමණාකරණය හා "මතට තිත" වැඩසටහන - මහින්ද චින්තන වැඩසටහන | වතුකරයේ හා ධීවර ප්‍රජාවගේ මත්ද්‍රව්‍ය භාවිතය හා එනිසා ඇතිවන ආර්ථික හා සමාජ ගැටලු අවම කිරීමත්, නාස්තිකාරී මුදල් පරිහරණ ගති පැවතුම් වැළැක්වීම තුළින් අදාල ප්‍රජාවන්ගේ ආර්ථිකය ශක්තිමත් කිරීම සහ මත්ද්‍රව්‍ය උවදුර සහ මුදල් කළමනාකරණයේ වැදගත්කම පිළිබඳ වතු අංශයේ සහ ධීවර ප්‍රජාව දැනුවත් කිරීම. | මත්පැන් හා මත් ද්‍රව්‍ය භාවිතයෙන් කාන්තාවන් හා පුරුෂයින් මුදවා ගැනීම මෙන්ම ග්‍රාමීය හා නාගරික වශයෙන් කාන්තාවන්ට සිදුවන හිංසනය අවම කිරීම මත්පැන් භාවිතය නිසා සිදුවන මුදල් නාස්තියද පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීම<br>රු.මි. 1.73<br>ප්‍රතිලාභීන් 6112<br>තව දුරටත් ක්‍රියාත්මකයි. |
| | 2.ගෙවතු වගා හා පශු සම්පත් වැඩසටහන. | අඩු ආදායම්ලාභී පවුල්වල ආර්ථිකය ශක්තිමත් කිරීම සහ පවුලේ පෝෂණ තත්ත්වය ඉහළ නැංවීම සහ ජීවන වියදම අවම කිරීම මෙම වැඩසටහනෙහි අරමුණියි.. | තෝරා ගන්නා ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසවල කාන්තාවන් වෙත කිරිදෙනුන් පශු සම්පත් දෙපාර්තමේන්තුවේ නිර්දේශ අනුව ලබාදේ. ණය පදනමක් යටතේ ලබාදෙන කිරි දෙනුන් සඳහා මාස 06ක සහන කාලසීමාවකින් පසුව ණය වාරික අය කර ගැනීම සිදු කරන අතර එසේ ලැබෙන මුදලින් තවත් ප්‍රතිලාභීන් සඳහා කිරිදෙනුන් ලබාදෙමින් චක්‍රීය ක්‍රමයට පශු සම්පත් වැඩසටහන ක්‍රියාත්මක කරනු ලැබේ. මේ වන විට ව්‍යාපෘති 25 ක් ආරම්භ කිරීමට ප්‍රතිපාදන නිදහස් කර ඇති අතර වැය කළ මුදල රු. මිලියන 6.1 කි.අදාළ<br>ප්‍රතිලාභීන් 7621<br>තව දුරටත් ක්‍රියාත්මකයි. |
| | 3. දිස්ත්‍රික් කාන්තා බල මණ්ඩල සහ නායකත්ව පුහුණු | ග්‍රාම නිලධාරි වසම් මට්ටමින් සහ ප්‍රාදේශීය මට්ටමේ ඇති කාන්තා සංවිධාන ව්‍යුහය දිස්ත්‍රික් මට්ටම දක්වා පුළුල් කිරීම මගින් කාන්තාවන් තවදුරටත් ශක්තිමත් කිරීම හා තීරණ ගැනීමේ ක්‍රියාවලියේදී කාන්තා මැදිහත්වීම තහවුරු කිරීම. | දිස්ත්‍රික්ක මට්ටමින් දිස්ත්‍රික් බල මණ්ඩල 17 ක් ද කාන්තා සංවිධාන ජාලය හා බද්ධව දිවයින පුරා මේ වන විට ක්‍රියාත්මකවේ.<br>රු.මි.1.03<br>ප්‍රතිලාභීන් 1795<br>(දිස්ත්‍රික් බල මණ්ඩල සාමාජිකාවන් සියල්ලම ප්‍රතිලාභීන් වේ.)<br>තව දුරටත් ක්‍රියාත්මකයි. |

ආයතනය / අංශය : ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය

| අනු අංක | සංවර්ධිත වැඩසටහන්/ව්‍යාපෘතිය | අරමුණ | ප්‍රතිලාභ |
|---|---|---|---|
| | 4. බන්ධනාගාර ගත වූ කාන්තාවන් සමාජීය සහ ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම | සුළු අපරාධ කර බන්ධනාගාර ගත වූ කාන්තාවන් එවැනි අපරාධ කෙරෙහි නැවත පෙළඹවීමෙන් වලක්වා අවශ්‍ය මානසික සහ ආර්ථික ශක්තිය ලබාදීමත්, නැවත බන්ධනාගාර ගත නොවී නැගී සිටීමට අවශ්‍ය මානසික හා ආර්ථික ශක්තිය ලබාදීම. | රු.මි. 0.25<br>ප්‍රතිලාභීන් 60 |
| | 5. නව යෞවනයන්ගේ ජීවන කුසලතා සංවර්ධනය | ජීවිතයේ ස්වභාවික සංසිද්ධීන් හා සමාජ අභියෝගයන්ට හමුවේ මුහුණ දීමේදී අත්දකින්නට සිදුවන ගැටළු පිළිබඳ නව යෞවනියන් දැනුවත් කර ඔවුන්ගේ ළමා කාලය නිසි ලෙස විඳින්නට අවශ්‍ය අවබෝධය ලබා දීම මෙම වැඩසටහන මගින් සිදු කෙරෙයි. එමෙන් ම මනා පෞරුෂයකින් හා සමාජ කුසලතාවයකින් යුතු ඵලදායී අනාගත කාන්තා පරපුරක් නිර්මාණය කිරීමට මින් ඉඩකඩ සැලසේ. | ජීවන කුසලතා පිළිබඳව පුහුණු කරුවන් පුහුණු කිරීම යටතේ ප්‍රාදේශීයව අනුයුක්ත වනිතා සංවර්ධන නිලධාරී සඳහා පුහුණුව ලබාදී ඔවුන් මගින් නව යෞවනියන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.<br>රු.මි. 0.89<br>ප්‍රතිලාභීන් 1227 |
| | 6.ව්‍යවසායකත්ව පුහුණු වැඩසටහන | කුඩා පරිමාණයේ සාර්ථක ව්‍යවසායකයකු වීමට අවශ්‍ය මග පෙන්වීම | කාන්තාවන් ව්‍යාපාරික ක්ෂේත්‍රයට සාර්ථකව යොමු කිරීම, ව්‍යවසායකත්ව පුහුණුව ලබා දීම, ගිණුම් පුහුණුව හා අලෙවි අවස්ථා පිළිබඳ පුහුණුව ලබා දීම.<br>රු.මි. 4.44<br>ප්‍රතිලාභීන් 9629<br>තව දුරටත් ක්‍රියාත්මකයි. |
| | 7.අත්දැකීම් හුවමාරු වැඩසටහන | සාර්ථක කාන්තා සංවිධාන හා ඔවුන්ගේ සාර්ථක ව්‍යාපෘති ව්‍යාපාර පිළිබඳව අත්දැකීම් ලබා ගැනීම සහ සම්බන්ධතා පුළුල් කිරීම. | රු.මි. 1.17<br>ප්‍රතිලාභීන් 397<br>තව දුරටත් ක්‍රියාත්මකයි. |
| 2 | **තංවමු ගම්මාන වැඩසටහන**<br>**(සෑම ගම්මානයකම කාන්තාවන් දසදෙනෙකු සඳහා අත්යන්ත්‍ර ජේෂ කර්මාන්ත,හස්ත කර්මාන්ත සහ සෙල්ලම් බඩු නිෂ්පාදනය, විදේශ වෙළඳපොළ වෙත යොමු කර ආර්ථික වශයෙන් ස්වාධීන කිරීම)** | ග්‍රාමීය කර්මාන්තයන්හි ආදායම් උපයා ගැනීම සඳහා කාන්තාව හා ඔවුන්ගේ පවුලේ සාමාජිකයින් කුඩා ව්‍යාපාර සඳහා යොමු කිරීමේ ප්‍රතිශතය වැඩි කිරීම.තෝරාගත් ගම්මාන වල කාන්තාවන් ආර්ථික හා සමාජීය වශයෙන් සවිබල ගැන්වීම.කාන්තාවන් පුහුණු කිරීමසඳහා අවශ්‍ය සම්පත් සැපයීම සිදු කෙරේ. | ප්‍රාදේශිය මට්ටමින් ඒ ඒ ප්‍රදේශයට ආවේණික සම්පත් උපයෝගී කර ගනිමින් සුළු කර්මාන්ත , කෘෂි කර්මාන්ත යන අංශයන්ට නැඹුරු ව්‍යාපෘති තෝරා ගැනීම තුළින් ඒ සඳහා රු 100,000- රු 250,000 සීමාව තුළ ප්‍රතිපාදන යොදාගනිමින් සාමූහික ගොවිපොලවල් , කිරි ගොවි ගම්මාන, සුළු කර්මාන්ත හා ස්වයං රැකියා සඳහා යටිතල පහසුකම්වලට අදාල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම<br>රු.මි. 3.30<br>ප්‍රතිලාභීන් 1028<br>තව දුරටත් ක්‍රියාත්මකයි. |
| 3 | **කුඩා ව්‍යාපාරවල යෙදෙන, ඇප තැබීමට නොහැකි වීම නිසා බැංකු ණයක් ගැනීමට නොහැකිව සිටින කාන්තාවන්ට ණය ලබා දීමේ ක්‍රමයක් ඇති කිරීම.** | අවශ්‍ය පහසුකම් ලබාදීමෙන් කාන්තාවන් ව්‍යාපාරික ක්ෂේත්‍රයට යොමු කිරීම. | රු.මි. 31.5<br>ප්‍රතිලාභීන් 6889 |
| | 1. චක්‍රීය ණය වැඩසටහන | චක්‍රීය ණය ලබා දීම, ගිණුම් පුහුණුව ලබා දීම,තෝරාගත් ව්‍යාපෘති / කාර්යයන් සඳහා ණය නිකුත් කිරීම සහ පසු විපරම් කිරීම. | |
| | 2. වනිතා ශක්ති බැංකු සංගම් වැඩසටහන | දැනට පිහිටුවා ඇති බැංකු සංගම් විධිමත්ව පවත්වාගෙන යාම | රු.මි. 5.55<br>ප්‍රතිලාභීන් 2804 |

ආයතනය / අංශය : ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය

| අනු අංක | සංවර්ධන වැඩසටහන්/ව්‍යාපෘතිය | අරමුණ | ප්‍රතිලාභ |
|---|---|---|---|
| | 1.කාන්තා නිෂ්පාදන ප්‍රදර්ශනය හා අලෙවිපොළ | කාන්තාවන්ට දේශීය වෙළඳපොළ අවස්ථා හඳුන්වා දීමෙන් ඔවුනගේ ආදායම් වර්ධනය කිරීම. | අලෙවි අවස්ථා වැඩි සිංහල සහ හින්දු අවුරුදු සමය, නත්තල් සමය හා එක් එක් ප්‍රදේශයන්ට ආවේණික විශේෂ උත්සව අවස්ථාවන්වලදී මෙම අලෙවිපොල සංවිධානය කෙරේ. විශාල ඉල්ලුමක් පවතින මෙම වැඩසටහන ඇතැම්විට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කිහිපයක් එක්ව පුළුල්ව සංවිධානය කිරීම තුළින් මේ වන විට වඩාත් ඵලදායි ප්‍රතිඵල ලබා ගැනීමට හැකි වී ඇත. දිවයින පුරා අලෙවිපොළ 20 පැවැත්වීම සඳහා<br>රු.මි. 6.33<br>ප්‍රතිලාභීන් 12206<br>තව දුරටත් ක්‍රියාත්මකයි. |
| 3 | කුඩා ව්‍යාපාරවල යෙදෙන, ඇප තැබීමට නොහැකි වීම නිසා බැංකු ණයක් ගැනීමට නොහැකිව සිටින කාන්තාවන්ට ණය ලබා දීමේ ක්‍රමයක් ඇති කිරීම. | අවශ්‍ය පහසුකම් ලබාදීමෙන් කාන්තාවන් ව්‍යාපාරික ක්ෂේත්‍රයට යොමු කිරීම. | චක්‍රීය ණය ලබා දීම, ශිල්ප පුහුණුව ලබා දීම,තෝරාගත් ව්‍යාපාති / කාර්යයන් සඳහා ණය නිකුත් කිරීම සහ පසු විපරම් කිරීම.<br>රු.මි. 31.5<br>ප්‍රතිලාභීන් 6889 3 |
| | 1. චක්‍රීය ණය වැඩසටහන | සුළු ව්‍යාපාර ආරම්භ කිරීමේ අවස්ථාව කාන්තා කාර්ය සමාජ සාමාජිකාවන්ට ලබා දීමේ අරමුණින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබයි. | |
| 4 | සුනාමිය හා යුද ගැටුම්වලින් පීඩාවට පත්ව ඇති අය සඳහා විශේෂ අවධානය යොමු කරමින් හිංසනයට හා මානසික පීඩනයට ලක් වී ඇති කාන්තාවන් සඳහා උපදේශන වැඩසටහන්, උපදේශන මධ්‍යස්ථාන හා සම්පත් මධ්‍යස්ථාන වැඩසටහන ක්‍රියාත්මක කිරීම. | කාන්තාවට මුහුණදීමට සිදුවන ගැටලු හමුවේ ඇතිවන විවිධ මානසික අර්බුදවලට ඔරොත්තු දීමට හැකිවන පරිදි ඇයගේ පෞරුෂය සංවර්ධනය කිරීම හා අසමතුලිත මානසික තත්ත්වයන් ඇතිවීම වැලැක්වීමෙන් අවශ්‍ය විටෙක මනෝ ප්‍රතිකාර ලබා දීම උපදේශනය මඟින් සිදු කෙරේ. | හඳුනාගත් ප්‍රදේශවල උපදේශන සේවාවන් පුළුල් කිරීම, උපදේශනය පිළිබඳ දැනුවත් කිරීම, සාජු උපදේශනය ලබා දීම, පසු විපරම, උපදේශන, රැකවරණ සම්පත් මධ්‍යස්ථාන පිහිටුවීම, නිළධාරින් පත් කිරීම සහ ජංගම උපදේශන වැඩසටහන් පැවැත්වීම.උපදේශනය ලබාදීම තුළින් හිංසනයට හා පීඩාවටපත් කාන්තාවන්ගේ මානසික තත්ත්වය ගොඩනැංවීම.<br>රු.මි. 10.79<br>ප්‍රතිලාභීන් 11298<br>තව දුරටත් ක්‍රියාත්මකයි. |
| 5 | මිනිස් ජාවාරම පිළිබඳ ළමුන් හා කාන්තාවන් දැනුවත් කිරීමේ වැඩසටහන | කුට්ටනය (Traffiking) පිළිබඳව හා එය වැලැක්වීමට අදාල නීති රීති සම්බන්ධව පාසල් සිසුන් හා ප්‍රජාව දැනුවත් කිරීම, කුට්ටනය හා හිංසනය වැලැක්වීම සඳහා ප්‍රජා සංවිධානවල ශක්තිය වැඩි දියුණු කිරීම, ගැහැණු ළමුන් හා කාන්තාවන් ජාවාරමට ලක්වීම තුළින් ඔවුන්ට එරෙහිව සිදුවන හිංසනය වැලැක්වීම සඳහා පර්යේෂණ සිදු කිරීම. | රු.මි. 4.96<br>ප්‍රතිලාභීන් 24402<br>තව දුරටත් ක්‍රියාත්මකයි. |
| 6 | ස්ත්‍රී ශාඛ මූලික පවුල් සඳහා ආර්ථික සවිබල ගැන්වීමේ වැඩසටහන | අදාල පවුල් සඳහා ජීවනෝපාය අවස්ථා සහ ආදායම් වර්ධන අවස්ථා උදා කිරීම. | යාපනය දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක වේ. |
| 7 | වනිතා සංවර්ධන නිලධාරීන් බඳවා ගැනීම | ප්‍රාදේශීය මට්ටමින් කාන්තාවන්ට පුළුල් සේවාවක් ලබා දීම. | |
| 8 | වනිතා සංවර්ධන නිලධාරීන් හා අනෙකුත් ක්ෂේත්‍ර නිලධාරීන් 200 කට පමණ උපදේශන පුහුණු වැඩසටහන | මානසික පීඩාවන්ට ගොදුරු වන කාන්තාවන්ට පුළුල් සේවාවන් ප්‍රාදේශීය මට්ටමේදී ලැබීම තුළින් ඔවුන්ගේ රැකවරණය තහවුරු වීම. | මඩකලපුව දිස්ත්‍රික්කයේ සැප්තැම්බර් මාසයේ සිට ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. |

ආයතනය / අංශය : ජාතික කාන්තා කමිටුව

| අනු අංක | සංවර්ධන වැඩසටහන්/ව්‍යාපාතිය | අරමුණ | ප්‍රතිලාභ |
|---|---|---|---|
| 1 | කාන්තාවන් සඳහා වැටුප් දේපල අයිතිය,රජයේ සේවය හා අනෙකුත් අදාල අංශවලදී සමානත්වයේලා සැලකීම සුරැකීම සඳහා නීති හඳුන්වාදීම. | | |
| | 1 සුනාමියෙන් අවතැන් වූවන් නැවත පදිංචි කරවීමේදී කාන්තා ඉඩම් අයිතිය , , ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ පර්යේෂණයක් කිරීම.<br>2 අවිධිමත් අංශයේ කාන්තාවන් විසින් ශ්‍රී ලංකා ආර්ථිකයට සිදු කරන දායකත්වය පිළිබඳව පර්යේෂණ සිදු කිරීම. | කාන්තාවන්ට අදාල ක්ෂේත්‍රයන්හි ඇති අසමානතාවයන් අවම කර ඔවුන්ගේ අයිතීන් තහවුරු කිරීමට පිළියම් යෙදීම. | පර්යේෂණ 2ක් සිදු කර ඇත. ඉඩම් අයිතිය පිළිබඳ ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව . සමග ප්‍රතිපත්තිමය සාකච්ඡා 04 ක් පැවැත්විණි. |
| 2 | පළාත් සභා සහ පලාත් පාලන ආයතනවල අපේක්ෂක ලැයිස්තුවල නියෝජනය අවම වශයෙන් 25% කින් වැඩි කිරීමට කටයුතු කිරීම. | කාන්තාවන්ට ප්‍රතිපත්ති හා තීරණ ගැනීමේ ක්‍රියාවලියේ වැඩි දායකත්වයක් ලැබීම. | දැනුවත් කිරීමේ වැඩමුළු 10 ( යූ.එන්.ඩී.පී ආයතනයේද සහභාගීත්වය ඇතිව) |
| 3 | කාන්තා සංවිධාවල සහ අදාල රාජ්‍ය නොවන සංවිධානවල සහභාගිත්වයෙන් කාන්තා අයිතිවාසිකම් සඳහා වූ කාන්තා අයිතිවාසිකම් සඳහා වූ ප්‍රඥප්තියක් සම්පාදනය කිරීම. | නව ශක්තිමත් යාන්ත්‍රනයක් බිහි කිරීම තුළින් කාන්තා අයිතිවාසිකම් හා ඔවුන් වඩාත් සවිබල ගැන්වීම තහවුරු කිරීම. | කාන්තා කොමිසමක් පිහිටුවීමේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර නැවත සංශෝධනය කෙරෙමින් පවතී. |
| 4 | මානසික හා කායික වශයෙන් හිංසනයට පත්වන කාන්තාවන්ගේ රැකවරණය තහවුරු කිරීම. | කාන්තා හිංසනය වැලැක්වීම පිළිබඳ ධනාත්මක ආකල්ප හා හැකියාවන් වර්ධනය තුළින් (ප්‍රජාව හා නීතිය ක්‍රියාවට නංවන නිළධාරින්) කාන්තාවන්ට හිංසනයෙන්ව තොරව නිදහසේ ජීවත්විය හැකි පරිසරයක් උදා කිරීම. | ගෘහස්ත හිංසන පනත ක්‍රියාවට නැංවීම හා ඒ පිළිබඳ පසු විපරම, කාන්තා පැමිණිලි මධ්‍යස්ථානය ක්‍රියාත්මක කර තිබීම,පොලිස් ළමා හා කාන්තා ඒකක නිළධාරින් දැනුවත් කිරීම හා උපකරණ ලබා දීම, මහේස්ත්‍රාත්වරුන් හා උපදේශන නිළධාරින් දැනුවත් කිරීම,හිංසනය වැලැක්වීම පිළිබඳ මාධ්‍ය දැනුවත් කිරීම , කාන්තා හිංසනය වැලැක්වීම පිළිබඳ ජාත්‍යන්තර දින 16 වැඩසටහනට සහභාගීවීම |
| 5 | සුනාමියෙන් විපතට පත් කාන්තාවන් සඳහා සහන හා රැකවරණය සැලසීම. | සුනාමියෙන් විපතට පත් කාන්තාවන්ගේ ජීවිත රැකවරණය හා අත්‍යවශ්‍ය සුබසාධන පහසුකම් සැලසීම. | ඇඳුම්, සනීපාරක්ෂක ද්‍රව්‍ය හා වෙනත් අතිරේක ආධාර , උපදේශන සේවා ලබා දීම. |
| 6 | කාන්තාවන් සඳහා වන පස් අවුරුදු ක්‍රියාකාරී සැලැස්ම | අදාල සියලු රාජ්‍ය ආයතන හා අනුග්‍රාහක ආයතනවල සහභාගිත්වයෙන් සෑම අංශයකින්ම සුභසාධනය හා සංවර්ධනය තහවුරු කිරීම. | සැලැස්මේ මූලික කටයුතු අවසන් කර ඇත.අත්‍යවශ්‍ය සංශෝධන සිදුවෙමින් පවතී. |
| 7 | සංවර්ධනයේදී ස්ත්‍රී පුරුෂ සමාජභාවිය විෂමතාවයන් අවම කිරීම. | කාන්තාවන් ඉලක්ක කර ගනිමින් රජයේ ආයෝජනයන් ප්‍රවර්ධනය හා එතුළින් ඔවුන්ට සංවර්ධනයේ ප්‍රමාණවත් ප්‍රතිඵල ලබා දීම. | අයවැයකරණයේදී කාන්තාවන්ට වැඩි අවධානයක් යොමු කිරීම පිළිබඳ ප්‍රතිපත්ති සම්පාදකයින් හා තීරකයින් සංවේදී කිරීමේ වැඩසටහන් පැවැත්වීම. |

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

ආයතනය / අංශය : ළමා ලේකම් කාර්යාලය

| අනු අංකය | සංවර්ධන වැඩසටහන් / ව්‍යාපෘතිය | අරමුණ | ප්‍රතිලාභ |
|---|---|---|---|
| 1 | පෙර පාසල් සහ දිවා සුරැකුම් මධ්‍යස්ථානවල තත්ත්වය සාක්ෂණ සහ මූල්‍ය ප්‍රතිපාදන ලබා දීම තුළින් ජාත්‍යන්තර මට්ටමකට නගා සිටුවීම | දිවයිනේ මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන පෙරපාසල් සහ ඒවායේ ගුරුවරුන්ගේ තත්ත්වය ගුණාත්මක වශයෙන් වර්ධනය කිරීම ඒ තුළින් සමතුලිත පෞරුෂයකින් හා සමස්ත සංවර්ධයෙන් යුක්ත මුල් ළමාවිය දරු පරපුරක් බිහි කිරීම. | වැඩසටහන් 150 ප්‍රතිලාභින් 9500 |
| | 1. පෙරපාසල් / මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සංවර්ධනය කිරීම සහ ගුරු පුහුණු වැඩසටහන | | |
| | * පෙර පාසල්/මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සඳහා අවම ප්‍රමිතීන් හඳුන්වා දීම | | සියළුම මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන / පෙර පාසල් ගුරුවරියන් දැනුවත් කර ඇත. |
| | * මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලා ආයතන ලියාපදිංචි කිරීම සහ එම ආයතන අධීක්ෂණය | | දැනට මුල් ළමාවිය සංවර්ධන ඩිප්ලෝමා ආයතන 21ක් ලියාපදිංචි කර ඇත |
| | * මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන ගුරුවරියන් සඳහා ඩිප්ලෝමා පාඨමාලාව පැවැත්වීම | | වසරකට ගුරුවරියන් 100 බැගින් ගුරුවරියන් 500 |
| | * යගර මඩල මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සඳහා සෙල්ලම් මිදුල සැකසීම | | සෙල්ලම් මිදුල් 212 ප්‍රතිලාභින් 4240 |
| | * මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සඳහා අධ්‍යාපන උපකරණ කට්ටල බෙදා දීම | | පෙර පාසල් 406 ප්‍රතිලාභින් 8120 |
| | 2. "පෝෂණ මංපෙත" සමස්ත සංවර්ධනයෙන් යුක්ත නිරෝගී දරු පරපුරක් මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන ඇසුරින් බිහි කිරීමේ වැඩසටහන | සමස්ත සංවර්ධනයෙන් යුක්ත නිරෝගී දරු පරපුරක් පරිසරය පිළිබඳ හැඟීමක් ඇති කරමින් මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන ඇසුරින් බිහි කිරීම මෙහි ප්‍රධාන අරමුණයි | |
| | * මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සඳහා ආදර්ශ ගෙවතු වගා සැකසීම | | පෙර පාසල් 86 ප්‍රතිලාභින් 1720 |
| | * මුල් ළමාවිය සංවර්ධන සහකාර නිලධාරීන්, මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන ගුරුවරියන් හා රැකබලා ගන්නන් සඳහා පුහුණු වැඩසටහන | | පුහුණු වැඩසටහන් 84 ප්‍රතිලාභින් 1260 |
| | 3. මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම .<br>* ජාතික, පළාත්, ප්‍රාදේශීය හා ග්‍රාමීය කමිටු පිහිටුවීම සහ නියමිත පරිදි රැස්වීම් පැවැත්වීම | මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනයට අදාලව<br>ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන සියළුම සේවාවන් සම්බන්ධීකරණය කිරීම | ජාතික, පළාත්, ප්‍රාදේශීය කමිටු හා ග්‍රාමීය කමිටු පිහිටුවා ඇත. |

ආයතනය / අංශය : ළමා ලේකම් කාර්යාලය

| ත අංකය | සංවර්ධන වැඩසටහන් / ව්‍යාපෘතිය | අරමුණ | ප්‍රතිලාභ |
|---|---|---|---|
| | * මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය පනතක් බවට පත් කිරීම | | ජාතික ප්‍රතිපත්තිය තවදුරටත් නීතිමය වශයෙන් බලාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතියක් මත, නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව විසින් කෙටුම්පත සකස් කරමින් පවතී. |
| | 4. සෙනෙහෙ සටාක - නිවස පදනම් කරගත් මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ වැඩසටහන | නිවසේ එදිනෙදා කරන ක්‍රියාකාරකම් හා නිවසේ පරිසරය මුල් ළමාවිය සංවර්ධනයට උචිත අයුරින් සකස් කර ගැනීම පිළිබඳව දෙමාපියන් හා වැඩිහිටියන් හට දැනුම අවබෝධය ලබා දීම තුලින් දරුවාගේ සමස්ථ සංවර්ධනය ඇති කිරීම. | |
| | * දෙමාපිය දැනුවත් කිරීමේ වැඩසටහන | | වැඩසටහන් 575 ප්‍රතිලාභින් 34000 |
| | * රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන | | වැඩසටහන් 20 ප්‍රතිලාභින් 550 |
| | * යෞවන කණ්ඩායම් දැනුවත් කිරීමේ වැඩසටහන | | වැඩසටහන් 155 ප්‍රතිලාභින් 9300 |
| | * නිවස පදනම් කරගත් මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ නියමු ව්‍යාපෘතිය | | දරුවන් 200 සඳහා ක්‍රියාත්මකයි |
| | 5. ටිකිරි මිතුරු - මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ මාධ්‍ය වැඩසටහන | මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනයේ වැදගත්කම පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීම සහ ඔවුන් තුළ ඒ පිළිබඳ සංවේදීභාවයක් ඇති කිරීම මෙන්ම මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන ගුරුවරුන් හට තම ආයතනට නිසි පරිදි පවත්වාගෙන යාමට අත්වැලක් සැපයීම මෙහි අරමුණයි | |
| | 6. මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ දිපව්‍යාප්ත සමීක්ෂණය තුලින් දත්ත පද්ධතියක් ඇති කිරීම | ශ්‍රී ලංකාවේ මුල් ළමාවිය සංවර්ධන ක්ෂේත්‍රය පිළිබඳ කාලීන තොරතුරු රැස්කිරීම, මුල් ළමාවිය ක්ෂේත්‍රයේ පවතින භෞතික හා මානව සම්පත්වල තත්ත්වය, ඉගෙනුම් ක්‍රම සහ ගැටළු හඳුනා ගැනීම තුලින් ශ්‍රී ලංකාවේ මුල් ළමාවිය සංවර්ධන ක්ෂේත්‍රය පිළිබඳ විධිමත් දත්ත හා තොරතුරු ජාත්‍යන්තර වශයෙන් ලබා ගත හැකි විධිමත් දත්ත පද්ධතියක් සකස් කිරීම හා යාවත්කාලීන කිරීම. | දිප ව්‍යාපත්ත සමීක්ෂණය තුලින් දත්ත විශ්ලේෂණ කටයුතු අවසන් කර ඇත. වාර්තාව සහ දත්ත පද්ධතිය අගෝස්තු මස අවසානයේදි එළි දැක්වීමට නියමිතය. |
The first is, the use of privileged communications of Parliament in judicial tribunals. On 28th February, 2012, the print and electronic media carried news items that the District Court of Colombo had purportedly issued a Notice of an Interim Injunction, restraining the Colombo Municipal Council, among others, from renting out or leasing any portion of the Mayor's Centre at No. 18, Sir Marcus Fernando Mawatha, Colombo 7. The report also stated that annexed to the petition was a copy of the letter addressed to you by me. I, myself, am a respondent in that case.

The issue of temporary relocation of the Office of the Leader of the Opposition in Colombo is a matter under discussion between the two of us. A final decision has not been taken and that cannot be taken until all the Party Leaders are informed of it. All those discussions are internal matters of Parliament.

The letter in question is an internal communication between the two of us. Matters pertaining to Parliament are outside the jurisdiction of the court. Parliament's internal matters are inclusively within its own jurisdiction. This has been very clearly ruled upon by the Speaker and the House. Our proceedings are, therefore, not open to challenge. Therefore, making such an application to court, using Parliament's internal documents is a violation of the Parliament's rights and privileges.

In the circumstances, all parties responsible for producing the said letter, namely the plaintiff and his lawyers, are acting in breach of Parliamentary Privilege. I, therefore, request you, as the guardian of the rights of Parliament and its Members, to look into this matter and take necessary action.

The second is with regard to the use of vehicles made available by the Government. Due to the security situation in the country, bullet and blast-proof vehicles have been supplied to some Members of the Government, to yourself, to me, as the Leader of the Opposition, and to other persons whose lives are under threat. In addition, all of us are provided with security personnel. All those vehicles belong to the Presidential Security Division. In addition, I have also been provided with other vehicles for my security. Those vehicles and personnel are available to us at all times. My security officers, who are assigned to me by the Government, assess my security needs at any given moment depending on the circumstances of each occasion. The same practice applies to all others.

Therefore, I need your confirmation, firstly, that the vehicles, including the bulletproof vehicles provided to me and the other persons whom I have mentioned, remain the property of the Government at all times and that no legislation has imposed any restriction on the use of such vehicles, and secondly, that I am entitled to use all the facilities given to me for the purpose of my personal security including such vehicles.

Thank you, Hon. Speaker. I hope you would look into the matters and give a Ruling.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ඒ පිළිබඳව වරප්‍රසාද කමිටුවට යොමු කර කඩිනමින් තීරණයක් ගෙන සභාවට දැනුම් දෙනවා.

## පාර්ලිමේන්තුවේ කටයුතු
## பாராளுமன்ற அலுவல்
## BUSINESS OF THE PARLIAMENT

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா )
(The Hon. Nimal Siripala de Silva)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 1, 2, 3 සහ 4 දරන විෂයයන් පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී අංක 20(7) දරන ස්ථාවර නියෝගයෙහි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය.''

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඊ ළඟට දිනට නියමිත කටයුතු යටතේ පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ යෝජනා ඉදිරිපත් කිරීම. 1 වන යෝජනාව ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා.

## අය වැය සම්මත කිරීමට පෙර පූර්ව අය වැය විවාදයක් පැවැත්වීම
## வரவு செலவுத் திட்டம் நிறைவேற்றப்படுவதற்கு முன்னர் பூர்வாங்க வரவு செலவுத்திட்ட விவாதமொன்று நடத்துதல்
## PRE-BUDGET DEBATE PRIOR TO PASSING OF BUDGET

[අ.භා. 2.16]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මාස ගණනාවකට පසුව පෞද්ගලික මන්ත්‍රීන්ගේ යෝජනා යටතේ අද දින මෙම යෝජනාව ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව මම ස්තුතිවන්ත වෙනවා. ගරු කථානායකතුමනි, මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ඉන්දියාව හා එක්සත් රාජධානිය මෙන් අවසාන හා පූර්ණ අය වැය සම්මත කිරීමට මාස තුනකට ප්‍රථම, අය වැය ඇස්තමේන්තුවල අහිතකර හෝ අවාසිදායක බලපෑම් ඇතොත් ඒවා අවම කිරීමට සහ නිවැරදි කිරීමට හැකි වන පරිදි පූර්ව අය වැය විවාදයක් පැවැත්විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි."

ගරු කථානායකතුමනි, මෙවැනි යෝජනාවක් ඉදිරිපත් කිරීමට මා අදහස් කළේ අවුරුදු ගණනාවක් තිස්සේ දවසින් දවස මේ රටේ අය වැය හිඟය වැඩි වෙලා ඒක අද රටේ සමස්ත ආර්ථිකයට බලපෑමක් කර තිබෙන බව අපට පෙනෙන නිසායි. අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148වන ව්‍යවස්ථාව යටතේ රටේ මූල්‍ය පාලනය පිළිබඳ සම්පූර්ණ බලතල තිබෙන්නේ පාර්ලිමේන්තුවටයි. නමුත් අද පාර්ලිමේන්තුවට තිබෙන බලතල විමධ්‍යගත කිරීම තුළින් අන්තිමට මෙහි තිබෙන සම්පූර්ණ වගකීම පැහැර හැර තිබෙනවාය කියන එක අපට පෙනෙන්න තිබෙනවා. අවුරුද්දක් තුළදී පරිපූරක ඇස්තමේන්තු ගණනාවක් මේ පාර්ලිමේන්තුව තුළින් සම්මත කරනවා. ගිය අවුරුද්දේ පරිපූරක ඇස්තමේන්තු මඟින් රුපියල් කෝටි 4,800ක් වන තෙක් වෙනසක් කර තිබෙනවා. ඒක සමස්ත අය වැයෙන් සියයට 12.5ක විතර වෙනසක්. ඒ වාගේම ඊට පෙර අවුරුද්දේ සියයට 10ක විතර වෙනසක් කර තිබෙනවා.

මෙයින් පෙනී යන්නේ කුමක්ද? නොවැම්බර් මාසයේ තුන්වන සුමානයේ ගරු ජනාධිපතිතුමා මුදල් ඇමති වශයෙන් පාර්ලිමේන්තුවට ඇවිත් අය වැය ඉදිරිපත් කරමින් කථා කර මොහොතකට අත්පුඩි ගහලා ඊට පස්සේ තිබෙන ආර්ථිකයත් ඊට වඩා අන්ත තත්ත්වයකට තල්ලු කරලා යනවා කියන එක අපට පෙනෙන්නට තිබෙනවා. මම මේ තත්ත්වය එක ආණ්ඩුවකට සීමා කරන්නේ නැහැ. නමුත් අපට පෙනෙනවා, මේ අවුරුදු දහහත තුළ මේ තත්ත්වයේ වර්ධනයක් තිබෙන බව. පාර්ලිමේන්තුවේ අද ඉන්න අප මේ තත්ත්වය දැන දැන මේ සම්බන්ධයෙන් වෙනස් කිරීමක් කළේ නැත්නම් හෙට දින රජ කරන තරුණ තරුණියන් අපට යම් විධියකින් දෝෂාරෝපණය කරාවි, පාර්ලිමේන්තුවේ ඉඳගෙන මේවා ගැන දැනගෙන, අපේ අනාගතය ගැන සරු සාර වැඩ පිළිවෙළක් ඇති කළේ නැත්තේ ඇයි කියා.

ඉන්දියාව ඉතාම දක්ෂ ලෙස මූල්‍ය පාලනයක් කර ගෙන යනවා. ඒ වාගේම එංගලන්තයේ මේවා සුපිරි මට්ටමට කර ගෙන යනවා. අප එවැනි අවස්ථා පාවිච්චි කර ගන්න අවශ්‍යයි, මීට වඩා ස්ථාවර මට්ටමකට ආපේ ආර්ථිකය තහවුරු කර ගැනීමට. එංගලන්තය සුපුරුදු පරිදි අය වැය ඉදිරිපත් කරන්නට මාස හතර පහකට පෙර ඒ ඇස්තමේන්තු සියල්ල පාර්ලිමේන්තුවට ගෙනැවිත් පූර්ව විමර්ශනයකට ලක් කරනවා. වැරදි තිබෙන්න පුළුවන්. මේ දවස්වල රටක ආර්ථිකයක් ලෙහෙසියෙන් plan කරන්න අමාරුයි. ඒ සම්බන්ධයෙන් ඒ දැනුවත්කම අප පාවිච්චි කරන්නට ඕනෑ. ඒ වාගේම එම වෙනස්කම්වලට අප අලුත් ආකාරයකින් උත්තර දෙන්නට ඕනෑ වන්නේ කොහොම ද කියන එක මේ පාර්ලිමේන්තුවේ අප සාකච්ඡා කළ යුතුයි. කොයි ආණ්ඩුවක් තිබුණත් ඒ විධියේ සංශෝධනයන් කරන්න අවශ්‍යයි.

ගරු කථානායකතුමනි, එම නිසා විපක්ෂයෙන් මෙම යෝජනාව ගෙනාවාය කියා ආණ්ඩුවක් ඉලක්ක කර නැහැ. මේ ආණ්ඩුව අවුරුදු 17ක් රට පාලනය කර තිබෙන නිසා, එහි දුර්වලකම් තිබෙන නිසා මා ඒ කාරණය පෙන්වීම සඳහා මේ අවස්ථාව උපයෝගී කර ගන්නවා.

මා එක නිදසුනක් ගන්නම්. 2012 අය වැය ලේඛනයෙන් - 2011 නොවැම්බර් මස 21වන දා හැන්සාඩ් වාර්තාව; Volume 204, තීරු අංක 22 අය වැය ප්‍රකාශනයෙන්- මා මේ කාරණය ඉදිරිපත් කරන්නේ. ජනාධිපතිතුමා එහි ප්‍රකාශ කරන්නේ මෙන්න මේ විධියටයි:

" ඛනිජ තෙල් හා ගෑස් සොයා ගැනීම සම්බන්ධව හා පුනර්ජනීය බලශක්තිය පිළිබඳව ලබා ඇති ප්‍රගතිය අනුව ඛනිජ තෙල් ආනයනය සඳහා දැනට වැය වන ඩොලර් මිලියන 3,000කට අධික විනිමය ඉතිරි කර ගැනීමේ බලාපොරොත්තු ද ඇති වී තිබෙනවා. අද තෙල් බැරලයක් ඩොලර් 130ක් වනවා ගරු කථානායකතුමනි. "

ගරු කථානායකතුමනි, ඔබතුමා මූලාසනයේ සිටින අවස්ථාවේදී ජනාධිපතිතුමා අය වැය ප්‍රකාශයට පත් කරමින් නොවැම්බර් මාසයේ 21වන දා කිව්වා, තෙල් බැරලයක් ඩොලර් 130යි කියා. අද පිරිසිදු කළ තෙල් බැරලය ඩොලර් 121 යි. බොර තෙල් බැරලය ඩොලර් 107 යි.

මීට සුමාන තුනකට ඉස්සෙල්ලා තෙල් මිල වැඩි කළත් අද පවතින තෙල් මිල ඒ විධියයි. එහෙම නම් ඇයි, පාර්ලිමේන්තුවේදී ජනාධිපතිතුමා එදා තෙල් බැරලය ඩොලර් 130යි කියලා කිව්වේ? එක්කෝ එදා ජනාධිපතිතුමා වැරදි ප්‍රකාශයක් කරලා තිබෙනවා. එහෙම නැත්නම් තෙල් මිල වැරදි ආකාරයකට ප්‍රකාශ වෙලා තිබෙනවා. ඒක තමයි අපට පෙනෙන්නේ. මෙවැනි දේවල් නිසා, එක දවසක කළ ඒ ප්‍රකාශය නිසා, මුළු රටේම අවුරුද්දකට තිබෙන සැලැස්ම සම්පූර්ණයෙන්ම වෙනස් කරන්න වෙනවා. ඒ නිසා අපට මේ කරුණු අය වැයට මාස තුන හතරකට ඉස්සෙල්ලා පාර්ලිමේන්තුවට ගෙනැල්ලා පූර්ව විමර්ශනයකට ලක් කරන්න පුළුවන් නම්, මෙවැනි ප්‍රශ්න නිසා රටේ සමස්ත ආර්ථිකයට සිද්ධ වන බලපෑම අඩු කර ගන්න පුළුවන් වෙනවාය කියන එක මම මේ අවස්ථාවේදී වගකීමෙන් කියන්න කැමැතියි. මම ඒ සඳහන් කළේ එක නිදසුනක්.

[ගරු රවි කරුණානායක මහතා]

ගරු කථානායකතුමනි, මාගේ දෙවන නිදසුන වශයෙන් ගන්නේ HSBC ණය. අද රට ලොකු ණය උගුලකට වැටිලා තිබෙනවා. කවුරු නැහැ කිව්වත්, මහ බැංකුවේ අධිපති අද මේ රටේ සමස්ත ආර්ථිකය පාලනය කරනවා නිකම් බුලත් කඩයක් පවත්වා ගෙන යනවා වාගේ. බලයේ ඉන්න කොට එකක් කියන, විපක්ෂයේ ඉන්න කොට තවත් එකක් කියන පුද්ගලයකු වශයෙන් තමයි ඔහුව හඳුන්වන්න පුළුවන් වන්නේ.

ගරු කථානායකතුමනි, HSBC ණය සඳහා 2007 ජූලි මාසයේ මේ ආණ්ඩුව roadshow එකක් ඇති කළා. මම මේ උදාහරණය පාවිච්චි කරන්නේ රටට කොතරම් අහිතකර ආර්ථික තත්ත්වයක් ඒ මඟින් ඇති වෙලා තිබෙනවාද කියලා පෙන්වන්නයි. ගරු කථානායකතුමනි, මම ඔබතුමාගේ කාරුණිකව අවධානය "Sri Lankan Economy: Current Status and the Future Prospects - Presentation of Selected Banks/Investor Banks" කියන 11th July, 2007 මහ බැංකුවේ වාර්තාවට යොමු කරනවා. මේක තමයි roadshow එක. මේකෙන් තමයි US Dollars මිලියන 500ක් සියයට 8 පොලියට අරගෙන, එදා රටේ විදේශ සංචිතය වැඩි කරන්න කටයුතු කළේ. එදා මේ වාගේ roadshow එකක් ඇති කළා. ඒක සාමාන්‍ය සිරිතක්. ආණ්ඩුවට සල්ලි අවශ්‍ය නම් බැංකුවට ගිහින් තමන්ගේ අවශ්‍යතාව පෙන්වලා, ණය ගැනීමේ හැකියාවක් තිබෙනවා. නමුත් මෙතෙක් කල් කරලා තිබෙන්නේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන්, ලෝක බැංකුවෙන් හෝ ආසියානු සංවර්ධන බැංකුවෙන් සියයට දශම දෙකේ පොලියට නැතහොත් සියයට 1/2 පොලියට ණය ගන්නවා මිස, සියයට හයේ, හතේ සහ අටේ පොලියට වාණිජ ණය ගැනීම නොවෙයි. මහ බැංකුවේ roadshow එකේ පිටු අංක 34 හි කියනවා, අපි මේ US Dollars මිලියන 500 පාවිච්චි කරන්නේ මේ වාගේ කටයුතුවලට කියලා. Puttlam Coal Power Project, Southern Expressway, හම්බන්තොට වරාය, Colombo Port Expansion Project, කෙරවලපිටිය තාප බලාගාරය, Proposed Northern Highway to Jaffna, Greater Colombo Urban Transport Development Project - Phase II, Development of Bandaranaike International Airport - Phase II, Improvement of Colombo-Matara Railway line, Greater Colombo Urban Transport Development Project - Phase I, Road Network Improvement Project.

මේ එක කොටසක්. ඊළඟ කොටසේ මේ ව්‍යාපෘති තිබෙනවා. වීරවිල ජාත්‍යන්තර ගුවන් තොටුපළ, ගාලු වරාය සංවර්ධන ව්‍යාපෘතිය, Kalu-Ganga Water Supply Project එක වාගේ ව්‍යාපෘති හත අටක් තිබෙනවා.

මෙහි වග කීමෙන් කියනවා, පුත්තලමේ තිබෙන තාප බලාගාරය හදන්න සම්පූර්ණයෙන්ම පාවිච්චි කළේ චීන ණය බව. ඒකට HSBC ණය සත පහක්වත් පාවිච්චි කළේ නැහැ. දකුණු අධිවේගී මාර්ගය හදන්නත් ඒකෙන් සත පහක් පාවිච්චි කළේ නැහැ. ගරු කථානායකතුමනි, ඔබතුමා දන්නවා, හම්බන්තොට වරාය ඉදි කරන්නත් මේ HSBC ණය පාවිච්චි කළේ නැහැ කියලා. ඒ සඳහාත් සම්පූර්ණයෙන් පාවිච්චි කළේ චීන ණයක්. පළමු වැනි ණය වාරිකය සියයට දෙකක පොලියට ගත්තා. ඊට පස්සේ ඔබතුමා -ගරු කථානායකතුමා- ඇමතිතුමා වශයෙන් ඉන්න කොට සියයට හයහමාරකට, හතකට ඉතුරු ණය ප්‍රමාණය ගත්තා.

ගරු කථානායකතුමනි, ඒ වාගේම තමයි කොළඹ වරාය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය. ඒ වැඩ කරන්නේත් සම්පූර්ණයෙන්ම ආසියානු සංවර්ධන බැංකුවෙන් ගත්තු ණයකින්. China Merchants Holdings (International) Company Limited එකෙන් තමයි ඒකට අවශ්‍ය ඉතුරු සල්ලි ප්‍රමාණය ගත්තේ. ඉතින් මේ වාගේ ඒවා කරලා සමස්ත ලෝකයටම බොරු කරලා තිබෙන අවස්ථාවක තමයි අපි මහ බැංකුව ගැන කථා කරන්නේ. මම මේ අවස්ථාවේදී ඔබතුමාගේ අවසරය ගන්නවා මේ වාර්තාව හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා **සභාගත*** කරන්න.

මෙවැනි දේවල් අපි හැන්සාඩ් වාර්තාවට ඇතුළු කරලා පෙන්වන්න අවශ්‍යයි. රටක ආර්ථිකය ගෙන යන කොට යම් විධියකින් ඒ කියන දේ ඇත්තද කියලා ප්‍රශ්නයක් මතු වෙනවා නම්, නැවත පාර්ලිමේන්තුවට ඇවිල්ලා ඒ තොරතුරු පෙන්වලා පැහැදිලි කරන්න අවශ්‍යයි.

අද අපි මේ රටේ ආර්ථිකය ගැන කථා කරන කොට, තව මාස දෙකකින් අපි US Dollars මිලියන 500ක් ණය සඳහා ගෙවන්න තිබෙනවා; bullet payment එකක් ගෙවන්න තිබෙනවා. මේ අවුරුද්දේ අපේ සමස්ත ආදායම බිලියන 1,150යි. නමුත් සම්පූර්ණ ණය ප්‍රමාණය බිලියන 1,784යි. HSBC එකෙන් ගත්ත ණය නැවත ගෙවීමට තිබෙන නිසා, ආදායමට වැඩිය ණය ප්‍රමාණයක් ගෙවන්න තිබෙන අවුරුද්දක් වශයෙන් මේ අවුරුද්ද හඳුන්වන්න පුළුවන්. අද ඒ නිසා තමයි රුපියල බාල්දු කරලා තිබෙන්නේ. මේ සුමාන තුන, හතර තුළදී රුපියල් 111ට තිබුණු ඩොලරය රුපියල් 122ට, 123ට ඉහළ නැඟ තිබෙනවා. මේ ආණ්ඩුව කිව්වා අපට ඕනෑ තරම් මුදල් සංචිත තිබෙනවා, ඇමෙරිකාවේ ආර්ථිකය කඩා වැටුණත් මේ රටේ ආර්ථිකය කඩා වැටෙන්නේ නැහැ කියලා. මෙතැන ඉන්න ප්‍රබල ඇමතිවරු සියලු දෙනාම එහෙම කිව්වා. නමුත් අද මොනවාද වෙලා තිබෙන්නේ? ඇමෙරිකාවටත් ණය දෙන්න හදන ලංකාවේ රුපියල සුමාන තුනක් ඇතුළත රුපියල් 111 ඉඳලා රුපියල් 123 දක්වා අවප්‍රමාණ වෙලා තිබෙනවා. මුදලක් අවප්‍රමාණ වීම සාමාන්‍ය සිරිතක්. ඉන්දියාවේත් ඩොලරය රුපියල් 46 ඉඳන් රුපියල් 53ට ගිහිල්ලා, නැවත රුපියල් 51ට ආවා. නමුත් ඒ අය ඒ ත්ත්ත්වය ඇති කළේ යම් විධියක ක්‍රමෝපායක් පාවිච්චි කරලායි. ඒ අය ගෙවන්න තිබෙන ණය ගෙවලා තමයි එවැනි දේවල් කළේ.

මේ කථා කරන අවස්ථාව වන විටත් ඉරානයෙන් තෙල් අරගෙන තිබෙන්නේ දවස් 290ක ණයක් එක්කයි. ඒ සඳහා බිලියන ගණනාවක් ණය ගෙවන්න තිබෙනවා. මේ රටේ මහ බැංකුවේ අධිපතිගෙන් සහ මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමාගෙන් මම අහනවා, ඒ ණය ගෙවලාද රුපියල අවප්‍රමාණ කළේ කියලා. එහෙම නැත්නම් හිතුවක්කාර විධියට, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් ලැබෙන්න තිබෙන US Dollars 800ට තිබෙන කෑදරකම නිසා එක පාරටම, "ඔව්, අපි රුපියල අවප්‍රමාණ කරන්න ඕනෑ" කියලා කටයුතු කළාද? පෙබරවාරි මාසයේ 03 වැනිදා, 04 වැනිදා සිට රුපියල අවප්‍රමාණ කරන්න ආරම්භ කළාට පස්සේ, සුමාන තුනකදී ඩොලරය රුපියල් 123 දක්වා වැඩි වීමෙන්, රුපියල් 12කින් ඩොලරය වැඩි වෙලා තිබෙනවා.

අපේ රටේ සමස්ත ණය ප්‍රමාණය බිලියන 5,481යි. එයින් පිට රට ණය හැටියට සියයට 54ක් තිබෙනවා. එම සියයට 54 බිලියන 5,481න් වැඩි කරලා, ඒක රුපියල් ශතවලින් වැඩි කරලා බැලුවාම, අද මේ රටේ ණය බර බිලියන 282ක් වෙනවා. රුපියල අවප්‍රමාණ වීම නිසා මේ රටේ ණය බර කෝටි 28,200කින් වැඩි වෙලා තිබෙනවා. කවුද ඒවා ගෙවන්නේ? මහවැලි ව්‍යාපාරයට සම්පූර්ණයෙන්ම බිලියන 50යි ගියේ. ඒ ප්‍රමාණය පසු ගිය දවස් 15, 16 තුළ රුපියල අවප්‍රමාණ කිරීම නිසා හතර ගුණයක් වෙලා තිබෙනවා. මේ පාර්ලිමේන්තුවට සම්පූර්ණ මූල්‍ය බලතල තිබෙනවා නම්, අන්තිම පැය වෙනකල් ඉඳලා, අය වැය යෝජනා රතු පෙට්ටියේ දාගෙන පාර්ලිමේන්තුවට ඇවිල්ලා නිකම් කියැවීමක් නොවෙයි අපට අවශ්‍ය වන්නේ. දැන් සිද්ධ වෙලා

***කථාව අවසානයේ පළ කර ඇත.***

** உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*

** Produced at end of speech.*

තිබෙන දේ හැටියට රටේ ආර්ථිකය භයානක තත්ත්වයකට තල්ලු වෙලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, අපේ ජෝන් අමරතුංග මැතිතුමා ගිය අවුරුද්දේ නැත්නම් එපිට අවුරුද්දේ දුන්නු අදහසක් අනුව, අපි මෙවැනි අමාත්‍යාංශ පිළිබඳව වෙනත් තැනක සිට මීට වඩා පූර්ණ විමර්ශනයකට ලක් කරනවා. පාර්ලිමේන්තුවෙන් පිටදී - pre-Budget meeting - ඒකේ කථා කරලා ඒ අමාත්‍යාංශ පිළිබඳ සවිස්තර වාර්තාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා. එතැනදී අපි ඒ අමාත්‍යාංශවල අය වැය ඇස්තමේන්තු පිළිබඳව කථා කරනවා.

ගරු කථානායකතුමනි, ඒ වාගේම අපි රට පාලනය කරන අවස්ථාවේදී Fiscal Management (Responsibility) Act කියලා එකක් ගෙනාවා. නවසීලන්ත රටේ ආර්ථිකයේ තිබෙන වැදගත් සාරාංශයක් උපුටාගෙන, අපේ සමස්ත රටේ ආර්ථික තත්ත්වය කොහොමද කියලා පෙන්වන්න හැම අවුරුද්දේම වාර්තාවක් ලබා ගන්න අවශ්‍යයි කියලා අපි කිව්වා. ඒ විධියට වාර්තා කිරීම සාමාන්‍ය සිරිතක්. මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා වාර්තා කරනවා, අපේ රටේ මෙන්න මේ වාගේ ණය ප්‍රමාණයක් තිබෙනවා, මේ වාගේ සංවර්ධනයක් ඇති වෙලා තිබෙනවා කියලා. ඒ මඟින් අපට ඇත්ත තත්ත්වය දැන ගන්න පුළුවන්.

ගරු කථානායකතුමනි, මම උදාහරණයක් කියන්නම්. අපි ලෙඩ වුණාම සාමාන්‍ය සිරිතක් වශයෙන් දොස්තර ළඟට යනවා නේ. දොස්තර අපව පරීක්ෂා කරලා අර check-up එක, මේ check-up එක කරලා තත්ත්වය හොඳද නැද්ද කියනවා නේ. ඒ වෙලාවේ බැරි වෙලාවත් pressure ටිකක් වැඩි වෙලා තියෙනවා නම් ඒකට හරි බෙහෙත ගන්නවා. ඒ විධියට මේ රටේ ආර්ථිකයේත් වැරදි තැන් ඇති වෙලා තියෙනවා. නමුත් ඒ වැරදි නිවැරදි කරන්නවත් කටයුතු කරන්නේ නැති තත්ත්වයක් ඇති වෙලා තියෙනවා.

ගරු කථානායකතුමනි, මා හිතනවා රටේ මූල්‍ය සම්බන්ධයෙන් මූලස්ථානය විධියට පාර්ලිමේන්තුව කටයුතු කරන නිසා මේ යෝජනාව ඉදිරිපත් කිරීමට ලැබීම බොහොම හොඳ දෙයක් කියලා. මෙවැනි උදාහරණ ඉන්දියාවෙන්, එංගලන්තයෙන් අපට පෙන්වා දීලා තිබෙනවා. ගරු කථානායකතුමනි, ඔබතුමාගේ කාර්යාලය තුළින් නොයෙක් විශේෂඥයන් මෙහාට ගෙන්වලා අපට මේ සම්බන්ධයෙන් නොයෙක් උපදෙස් දෙනවා. ඉතින් ඒ දෙන උපදෙස් අපට මෙතැන පිළිපදින්න බැරි නම්, මෙතැනදී වෙලාව නාස්ති කරලා වැඩක් නැහැ. ඒ නිසා මා මේ ආණ්ඩුවට කාරුණිකව කියනවා, මෙවැනි යෝජනා අපි පාවිච්චි කරමු කියලා. ඔබතුමන්ලාම දන්නවා, කොතරම් අමාරු ආර්ථික තත්ත්වයක ඔබතුමන්ලා ඉන්නවාද කියන එක. අද සමහර වෙලාවට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ දවසට එකතු වන සල්ලි ටික අරගෙන ගිහිල්ලා තමයි දෙපාර්තමේන්තුවල පඩි ටික ගෙවන්නේ. එහෙම නැත්නම් වරායේ එකතු වන මුදල්වලින්. ඒ කියන්නේ බදු ගෙවන මුදලින් තමයි සමහර තැන්වල මාසයේ පඩි ගෙවන්න කටයුතු කරගෙන යන්නේ. මේ තත්ත්වය දවසින් දවස මීට වැඩිය අන්ත තත්ත්වයකට තල්ලු වෙනවා. ඒ නිසා කරුණාකර, මෙවැනි යෝජනාවක් අපි පාවිච්චි කරමු, රටේ අභිවෘද්ධිය වෙනුවෙන් සහ ඉදිරි අනාගතයට මීට වැඩිය හොඳ තත්ත්වයක් ඇති කරන්න.

මා HSBC ණය ගැන කිව්වේ, මොන වාගේ භයානක තත්ත්වයක්ද මේ රජයේ නිලධාරින්ගේ බොරු කිරීම තුළ ඇති වන්නේ කියලා ඒකෙන් පෙනෙන නිසා. රටේ සමස්ත දේශපාලනඥයන්ට වෘත්තීය පදනමක් නැහැ. ඒ නිසා යම් අයට උපදෙස් දෙන්න අවශ්‍යයි. නමුත් උපදෙස් දෙන අය බොරු කිව්වොත්, ඒ ඉන්න දේශපාලනඥයෝ ඒ බොරුව තුළින්ම තමයි ඒ කටයුතු ඉදිරියට ගෙන යන්නේ. එහෙනම් කවුද වගකීමක් ඇතිව මේ කටයුතු කරන්න ඕනෑ? යම් ව්‍යවස්ථා සංශෝධන කිරීම් ගැන හෝ පනත් ගැන අදහස් ගන්න තිබෙන්නේ නීතිපති දෙපාර්තමේන්තුවෙන්. එතැනින් වැරැද්දක් සිද්ධ වුණොත් මුළු පාර්ලිමේන්තුවම හාස්‍යයට ලක් වෙනවා. මා මේ පාර්ලිමේන්තුවේදී මතක් කළා, නිහාල් අමරසේකර මැතිතුමා හිල්ටන් හෝටලය සම්බන්ධයෙන් උසාවි ගිය කාරණය. ඒ උසාවි ගිය අවස්ථාවේදී පෙන්වා දුන්නා, නීතිපති දෙපාර්තමේන්තුව පාර්ලිමේන්තුවටත්, කැබිනට් මණ්ඩලයටත් බොරු කියලා තිබෙන ආකාරය කොහොමද කියලා. බොරු කීම නොවෙයි, suppression of information. මා සුප්‍රීම් උසාවියේ හිටියා, නිහාල් අමරසේකර මැතිතුමා එවැනි හෙළදරව් කිරීමක් කරන අවස්ථාවේදී. එතැනදී පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් මම ලජ්ජා වුණා, අපිත් මේ සම්බන්ධයෙන් මීට වැඩිය විශේෂ දැනුමක් සහිතව කටයුතු කළේ නැහැයි කියලා. ගරු කථානායකතුමනි, දැන් මා පෙන්නුවා, පාර්ලිමේන්තුවට ඇවිල්ලා කරන යම් ප්‍රකාශ නිසා ඇති වන විපාක. ඒ වාගේම රජයේ නිලධාරින් වැරදි ප්‍රකාශ කිරීමෙන් සිදු වන විපාක.

මේ පාර්ලිමේන්තුවට ගිය අවුරුද්දේ ඉදිරිපත් කළ පරිපූරක ඇස්තමේන්තුවල අගය කෝටි 4,800ක්. ඒ කියන්නේ බිලියන 48ක් ගරු කථානායකතුමනි. මේක ආර්ථිකයට බොහොම දරුණු මට්ටමින් බලපාන දෙයක්. සාමාන්‍යයෙන් හොඳට පරිපාලනය කරන ආර්ථිකයක මේවා දකින්නවත් නැහැ. අපේ පුංචි ලංකාව නොයෙක් පීඩනවලට ලක් වනවා. මේ සම්බන්ධයෙන් මීට වඩා විධිමත් ක්‍රියාත්මක කිරීමක් මේ පාර්ලිමේන්තුව තුළින් කළේ නැත්නම් මම හිතන විධියට අපි අඳුරු තත්ත්වයකට ඇද වැටෙනවා.

ගරු කථානායකතුමනි, ඒ වාගේම තමයි රජයේ ණය ගෙවීමත්. මම කිව්වා වාගේ සමස්ත ණය ප්‍රමාණය රුපියල් බිලියන 5,481ක් තිබෙනවා. රුපියල් 12, 13 අවප්‍රමාණය කිරීම නිසා ණය ගෙවීමේදී රුපියල් බිලියන 282ක ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. රජය Goldman Sachs කොම්පැනියෙන් රුපියල් බිලියනයක් ගන්න යනවා. ඒ කියන්නේ යූඑස් ඩොලර්ස් මිලියන 1,000ක් ණයක් වශයෙන් ගන්න යනවා. ඒ ණය ගන්නේ ඊට පෙර ගත් ණය ගෙවන්න මිස රට සංවර්ධනය කිරීම සඳහා පාවිච්චි කිරීමට නොවෙයි. ඒ තුළින් මේ රටට මොන තරම් අපරාධයක් සිදු වනවාද? රටක් සංවර්ධනය කරන්න ණය ගන්න අවශ්‍යයි. අපි හෙට බලයට ආවොත් ඒ ආපු විගසම ණය ගන්න ඕනෑයි කියලා මම ප්‍රකාශ කරනවා. නමුත් එසේ ගන්න අවශ්‍ය වන්නේ ගෙවන්න හැකියාවක් තිබෙන ණයක්. නිකරුණේ ණය ගන්න අවශ්‍ය නැහැ. ගත්ත ණය ගෙවීම සඳහා නොවෙයි ණය ගන්න අවශ්‍ය වන්නේ.

ගරු කථානායකතුමනි,නොවැම්බර් මාසයේ පාර්ලිමේන්තුවට අය වැය ඉදිරිපත් කරන්න කලින් ඒ ගැන පුළුල් විමර්ශනයක් කරන්න අවශ්‍යයි. ඒ, 2013 වර්ෂය සඳහා ඉදිරිපත් කරනු ලබන අය වැයයි කියලා අපි හිතමු. ඒ සම්බන්ධයෙන් සාකච්ඡාවක් ඇති කරලා, දැනුවත් කරලා මීට වඩා වැදගත් විධියට ආර්ථිකයට ප්‍රවේශවීමක් කරලා, 2013 අය වැය හැදුවොත් ඒක නරකද? ඒක ඕනෑම ආණ්ඩුවකට අවශ්‍ය වනවා. ඒ වාගේම ඕනෑම විපක්ෂයකට ඒ දැනුවත්කම අවශ්‍යයි. අද Freedom of Information Bill එකත් මේ ආණ්ඩුව යටපත් කර තිබෙනවා. ප්‍රජාතන්ත්‍රවාදය තිබෙන ඕනෑම හොඳ රටක "Freedom of Information" කියන එක basic information එකක්. ඒ කියන්නේ ප්‍රාථමික දැනුවත්කමක් ඇති කරන දෙයක්. ඒ විතරක් නොවෙයි, අද ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ තිබෙන වුවමනාව මත LLRC Report එක ක්‍රියාත්මක කරන්න ඕනෑ කියලා ඇමෙරිකාව resolution එකක් ගේනවා. එහිත් තිබෙනවා, Freedom of Information Bill එක ගැන. මාධ්‍ය නිදහස තහවුරු කිරීම වැනි දේවල් කරන්න ඕනෑය කියලා අද ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ LLRC Report එක තුළින් හෙළිදරව්

[ගරු රවි කරුණානායක මහතා]

වෙලා, ඇමෙරිකාව ඒක අල්ලා ගෙන ඒක ක්‍රියාත්මක කරන්නය කියලා ජිනීවාවලට ගිහිල්ලා කියනවා. ඉතින් අද ආණ්ඩුව දහලනවා. එක පැත්තකින් රජයේ නියෝජිතයෙක් වශයෙන්- ජනාධිපතිතුමාගේ විශේෂ නියෝජිතයෙක් වශයෙන්- මහින්ද සමරසිංහ ඇමතිතුමා ජිනීවා යනවා. එතුමා ගිහිල්ලා කියනවා, LLRC Report එක ක්‍රියාත්මක කරනවා කියලා.

විදේශ කටයුතු ඇමති අප්‍රිකානු රටවල්වලට ගිහිල්ලා කියනවා, "නැහැ, නැහැ. අපි දන්නේ නැහැ, ඒ කියන්නේ මොකක්ද කියලා. LLRC දානවාද නැද්ද කියන එක අපි හොයලා බලන්න ඕනෑ." කියලා. අපේ නිමල් සිරිපාල ඇමතිතුමා යැව්වා නම් දෙපැත්තටම හොඳ උත්තරයක් දීලා අඩු ගණනේ රටේ නම්බු නාමයවත් ආරක්ෂා කර ගෙන එන්න හැකියාවක් තිබුණාය කියලා මම විශ්වාස කරනවා. නමුත් ඒ පරිණතභාවය පාවිච්චි කරන්නේ නැතිව පැත්තකට දාලා තියෙනවා. සුමානයකට විතර ඉස්සෙල්ලා පත්තරේ පළ වෙලා තිබුණා, හැම දෙනාම ලංකාවට සහයෝගය දෙනවාය කියලා. හැබැයි, ඊයේ පත්තරේ බැලුවාම තිබුණා, "ඔන්න ඇමෙරිකාව resolution එකක් ගේනවාය" කියලා. කවුද ඇත්ත කියන්නේ, කවුද බොරු කියන්නේ? රටේ නමත් එක්ක සෙල්ලම් කරන මේ අය දේශ ප්‍රේමීයෝ. අපි බැරි වෙලාවත් ඒ ගැන කථා කළොත් අපි දේශ ද්‍රෝහියෝ වෙනවා.

අද ඇත්ත තත්ත්වය මොකක්ද? අද ඔබතුමන්ලාගේ ආණ්ඩුව රකින්න ජිනීවාවලට ගිහිල්ලා කියනවා, "LLRC Report එක අපි පිළිපදිනවා" කියලා. යුද හමුදාවේ අය පාවා දීලා තමන්ලාගේ ආණ්ඩුව රකින්න කටයුතු කළාය කියන එක මා මේ අවස්ථාවේ මතක් කරන්න කැමැතියි. මම මේ යෝජනාව ගේන්නේ ඒකයි. ඒකෙන් ඇති වන මූල්‍ය ප්‍රතිවිපාක සම්බන්ධයෙන් අපි මීට වැඩිය සවිස්තරව පූර්ව විමර්ශනයක් කිරීම තුළින් කටයුතු කළොත් මේ ප්‍රශ්නයට උත්තරය සැපයෙනවා. විපක්ෂයේ අපි මේ ගැන කිව්වාම විස; මේක සයනයිඩ්. අපි අවුරුදු දෙක තුනකට ඉස්සෙල්ලා රෝහිත බෝගොල්ලාගම මහතාට කිව්වා, ජී.එල්. පීරිස් මහතාට කිව්වා, "GSP Plus එක සම්බන්ධයෙන් කරුණාකරලා අපේ අදහසුත් ගන්න, අපි දෙන්නා එකට කථා කරමු, මේ ප්‍රශ්නය විසඳමු, රටේ අපනයනකරුවන්ට උදවු කරන්න පුළුවන් විධියේ වැඩ පිළිවෙළක් හදමු" කියලා. මොනවාද මේ පාර්ලිමේන්තුවේ කිව්වේ? "විපක්ෂයේ උදවු අපට අවශ්‍ය නැහැ." කියලා කිව්වා. අන්තිමට මාස 12කට 13කට විතර පස්සේ ඒ GSP Plus එක නැති වුණා.

ගරු කථානායාකතුමනි, ඒ වාගේම අපි 2009, 2010 LLRC Report ගැන අදහස් කිව්වාම මොකක්ද කිව්වේ? "මේ රට පාවා දෙනවා." කියලා කිව්වා. නමුත් තමුන්නාන්සේලාම පත් කරපු කොමිසම තුළින්, තමුන්නාන්සේලාගේම හෙළිදරවු කිරීමක් තුළින් අපි කියපු ඒවාම ඒ LLRC Report එකේ තියෙනවා. ඉතින් අපි කියපු ඒවා වැරදිද? අපි එදා කිව්වේ දැනුවත්කමක් තුළින් රට ආරක්ෂා කරන්න ඕනෑය කියලායි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒ කොටස යෝජනාවේ නැහැ. මේ යෝජනාවේ තියෙන්නේ අය වැය සම්මත කිරීමට පෙර පූර්ව අය වැය විවාදයක් පැවැත්වීම පිළිබඳව. අනික් ඒවා නැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔව්, ගරු කථානායකතුමනි. ඒක හරි දෙයක් නේ. පිට රට යන කොටත් ඒ වියදම දරන්න තියෙන්නේ මේ පාර්ලිමේන්තුවෙන්. පිට රට යන්න තියෙන කොට ඒ ගෙවන්න තියෙන මුදලත් ගෙවන්න තියෙන්නේ මේ පාර්ලිමේන්තුවට. මේකට පූර්ව විමර්ශනයක් තිබුණා නම් අපට කියන්න තිබුණා, "අපට ජිනීවාවලට යන්න තියෙනවා. ඒකට මුදල් වෙන් කරන්න ඕනෑ." කියලා. ඒකයි මම මේ කියන්න හදන්නේ. නිමල් සිරිපාල ඇමතිතුමා යවන්න තිබුණා නම්, ඔය මහින්ද සමරසිංහ, ජී.එල්. පීරිස් වාගේ 53 දෙනෙක් 54 දෙනෙක් අරගෙන යන්න ඕනෑ නැහැ. දෙන්නෙක් තුන් දෙනෙක් එක්ක සුදු වෑන් එකකුත් අරගෙන යන්න ඉඩ තියෙනවා වෙන්න පුළුවන්. ගිහිල්ලා ප්‍රශ්න නිරාකරණය කරලා එන්න ඉඩ තියෙනවා. [බාධා කිරීමක්] නැහැ නොවෙයි. 53 දෙනෙක් යනවා නම්, පාර්ලිමේන්තුවේ සල්ලි පාවිච්චි කරලා තමයි ඒ 53 දෙනාට එහි යන්න වන්නේ. ඒ ප්‍රමාණය තුන් හතර දෙනෙකුට අඩු කළා නම් ගරු කථානායකතුමනි, ඔබතුමාට වියදම් කරන්නට කොතරම් සල්ලි ඉතුරු වනවාද? මෙන්න මේ නිසා තමයි පූර්ව විමර්ශනයක් අවශ්‍ය වනවායි කිව්වේ. ඒ සම්බන්ධයෙන් අපට අවශ්‍ය වන්නේ මීට වැඩිය දැනුත්වීමක් තුළින්, මීට වැඩිය ඉදිරි දැක්මක් සහිතව වැඩ කිරීමයි.

ගරු කථානායකතුමනි, ඒ වාගේම තමයි ලයිට් බිල. දැන් කථානායකතුමනි, මේ ගැන බලන්න,-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
යෝජනාව ස්ථිර කරන්න කාටවත් දෙන්නේ නැද්ද?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ස්ථිර කරන්න ඉන්නවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මේ යෝජනාවට පැයයි දෙන්නේ. පැය භාගයක් යෝජනාව ඉදිරිපත් කරන්නත් පැය භාගයක්-

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම තව මිනිත්තු දෙකකින් මගේ කථාව නවත්වන්නම්, ගරු කථානායකතුමනි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
බොහොම ස්තුතියි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මේ අවස්ථාවේදී මම විදුලිබල මණ්ඩලය ගැනත් මතක් කරනවා. පසු ගිය දවස් 95ට අලාභය රුපියල් බිලියන 91යි; රුපියල් කෝටි 9,100යි. ඊයේ වම්පික රණවක ඇමතිතුමා කියපු ආකාරයට මීට වඩා තුන් හතර ගුණයක අලාභයක් මේ අවුරුද්දට පෙන්වනවා කියන එක අපි දන්නා කරුණක්.

ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ අලාභය දැනට රුපියල් කෝටි 6,800යි. මේ රුපියල් කෝටි 6,800 ගෙවන්න තිබෙන්නේ තෙල් මිල වැඩි කළාට පසුවයි. ගරු කථානායකතුමනි, මේ සම්බන්ධයෙන් ප්‍රශ්න තිබෙනවා නම් මේ පාර්ලිමේන්තුවේ සාකච්ඡා කළා නම්, විරුද්ධ පාර්ශ්වයේ උදව්වත් ලබා දෙන්න

පුළුවන්. කවදාවත් තනිවම මේ ආර්ථිකය ගෙනියන්න බැහැ. මේකට ජාතික ආර්ථිකයක් හදන්න ඕනෑ. අපි එදා ඉදලා ඒක කිව්වා. මේක ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට උරුම වෙලා තිබෙන ආර්ථිකයක් නොවෙයි. මේ එක්සත් ජාතික පක්ෂයත් අනෙක් සියලුම පක්ෂත් එකතු වෙලා ජාතික ආර්ථිකයක් හදන්න තිබෙන අවස්ථාවක්. මම ඒ ගැන මීට වඩා කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. ගරු කථානායකතුමා මා දැනුවත් කළා, වෙලාව සම්බන්ධයෙන්. ඒ වාගේම

EPF, ETF ගැනත් කියන්න ඕනෑ. රටේ ආර්ථිකය කොතරම් විනාශ වෙලා තිබෙනවාද, බංකොලොත් වෙලා තිබෙනවාද කියනවා නම් මහ බැංකුවේ අධිපති වැනි අය අද පෞද්ගලික ව්‍යාපාර කර ගෙන යනවා. එක පැත්තකින් Laugfs Gas (Pvt.) Limited එකේ කොටස් ගන්නවා. ගන්නේ කොටසක් රුපියල් 58ට. දැන් ඒ කොටසක වටිනාකම රුපියල් 30යි. ඒ වාගේම ගලදාරී හෝටලේ කොටස් ගන්නවා. ගන්න වෙලාවේ කොටසක් රුපියල් 46යි, දැන් ඒ කොටසක වටිනාකම තක්සේරු කරලා තිබෙනවා; එය රුපියල් 15ට අඩු වෙලා තිබෙනවා. කවුද, මේකට වග කියන්න අවශ්‍ය වන්නේ? කවුද, මේ වාගේ කටයුතු කරන්න බලය ඇත්තේ ? ඒ ගොල්ලන්ගේ කොම්පැනි තිබෙනවා.

යුරෝපයේ කොම්පැනි මහ බැංකුවට සල්ලි දෙනවා. මහ බැංකුවෙන් මුදල් දෙනවා, ඒ ගොල්ලන්ගේ හිතවත් finance companiesවලට; LOLC වාගේ finance companiesවලට. දශම බින්දුවයි දෙකයි පහක වාගේ පොලියකට ගන්නා ණය මුදල් මේ අය සියයට 10ක, 12ක පොලියකට වෙනත් අයට දීලා ප්‍රශ්නයක් ඇති කරලා තිබෙනවා. මොකද, නිවාඩ් කබ්රාල් මැතිතුමායි, අජිත් දේවසුරේන්ද්‍රයි යාළුවෝ. ඒ වාගේම තමයි Taprobane Investments (Pvt.) Limited. මේ අය ගන්නවා. මේ අය මේ කොම්පැනි තුළින් කටයුතු කරලා වැඩ කරන අහිංසක ජනතාවගේ EPF, ETF එක්ක සෙල්ලම් කරන එක තමයි තිබෙන ප්‍රශ්නය.

මේ අවස්ථාවේදී රොෂෙන් චානක වැනි පුද්ගලයන්ව මතක් කරන්න අවශ්‍යයි. අර්ථ සාධක අරමුදල ආරක්ෂා කරන්න ඔහු තමන්ගේ ජීවිතය පුද කළා.

ගරු කථානායකතුමනි, ඒ වාගේ විනාශකාරී දේවල් සිදු නොවී අපේ රටේ ආර්ථිකය බේරා ගන්න පුළුවන්, මේ වාගේ පූර්ව විමර්ශනයක් තුළින්. අය වැය සම්මත කිරීමට පෙර පූර්ව අය වැය විවාදයක් පවත්වා ඒ අය වැය තුළින් ඇති වන ප්‍රතිවිපාක මොනවාද කියා විපක්ෂයේ අදහස් හා ආණ්ඩුවේ අදහස් තුළින් දැනුවත් වීම හොඳයි. ආණ්ඩුවේ සැලැස්ම දැනුවත් කරන්න ඕනෑ නැහැ. නමුත් ආණ්ඩුවේ ණයබරතාව, ඒ වාගේම ප්‍රාග්ධන වියදම, පුනරාවර්තන වියදම වෙනස් කරනවාද නැද්ද කියා සියලු දෙනා දැනුවත් කරලා ඒ තුළින් කටයුතු කිරීම තමයි මේ අවස්ථාවේදී අවශ්‍ය වන්නේ. ගරු කථානායකතුමනි, ඔබතුමා වෙලාව ලබා දීම සම්බන්ධව මා අගය කරනවා. මගේ යෝජනාව ස්ථිර කරමින් ගරු රන්ජන් රාමනායක මන්ත්‍රීතුමා කථා කරනවා.

***සභාමේසය මත තබන ලද ලියවිල්ල :***
*சபாபீடத்தில் வைக்கப்பட்ட ஆவணம்:*
*Document tabled:*


Sri Lankan Economy:
Current Status and Future Prospects

Presentation to Selected Banks/ Investor Banks 11th July 2007

Central Bank of Sri Lanka
Towards Prosperity

[ගරු රවි කරුණානායක මහතා]

## The pipeline of investment is strong, and supported by committed foreign and private sector participation

**Projections on mega projects over 2007 - 2011**

| | |
|---|---|
| Puttalam Coal Power Project | National Highways Project |
| Southern Expressway | Weerawila International Airport |
| Hambantota Sea Port Development project | The Galle Port Development Project |
| Colombo Port Expansion Project | Kaluganga Water Supply Project |
| Establishment of Duel Fuel Combined Cycle Power Plant at Kerawalapitiya | Water Sector Development Project - Phase I |
| Proposed Northern Highway to Jaffna | Small Scale Infrastructure Rehabilitation & Upgrading (SIRUPII) |
| Greater Colombo Urban Transport Development Project - Phase II | Water Sector Development Project - Phase II |
| Development of Bandaranaike International Airport - Phase II | Road Sector Assistance |
| Improvement of Colombo - Matara Railway | Post-Tsunami Line of Credit |
| Greater Colombo Urban Transport Development Project - Phase I | |
| Road Network Improvement Project | |

Source: Ministry of Finance and Planning

- The government has proactively sought foreign and private participation in its quest to improve infrastructure in the country
- The government is working on the PPP model for infrastructure development
- Investment in the oil sector bodes well for further investment in Sri Lanka
  - Production Sharing Agreements (PSA) should be signed in early 2008

Central Bank of Sri Lanka
*Towards Prosperity*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

යෝජනාව ස්ථිර කරන්න, විනාඩි දෙකක් තුනක් විතර තිබෙනවා.

[අ.භා. 2.43]

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)

ගරු කථානායකතුමනි, ඇත්ත වශයෙන්ම අප පක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු රවි කරුණානායක මැතිතුමා මෙම යෝජනාව ඉදිරිපත් කරමින් ඉතාම හොඳ හරවත් දෙසුමක් කළා. අය වැය සම්මත කිරීමට පෙර අය වැය ඇස්තමේන්තු පිළිබඳව පූර්ව විමර්ශනයක් සිදු කිරීම, එහි ඇති වැදගත්කම ඉතාම හොඳ උපහරණ මඟින් පෙන්වා දුන්නා. පක්ෂ විපක්ෂ භේදයකින් තොරව එතුමාගේ කාලෝචිත යෝජනාව අගය කිරීමකට, විමර්ශනයකට ලක් කර යමක් කරන්න කියා ඉල්ලා සිටිමින්, මා එය ස්ථිර කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

[අ.භා. 2.44 ]

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා )**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவ அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Nimal Siripala de Silva - Minister of Irrigation and Water Resources Management and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා විසින් ගෙන එන ලද මේ යෝජනාව එක්තරා ආකාරයක වැදගත් යෝජනාවක් හැටියට මා සලකනවා. ඒ වුණත් එතුමා මේ යෝජනාවට අදාළව ප්‍රකාශ කරන ලද යෝජනාවෙන් පරිබාහිර වූ වැල්වටාරම් සමූහය පිළිබඳව අපේ රජයේ එකඟතාවක් නොමැති බව ප්‍රකාශ කරන්න ඕනෑ. විශේෂයෙන්ම එක්සත් රාජධානිය, ඉන්දියාව වැනි ප්‍රජාතන්ත්‍රවාදී රටවල පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදයේ සමහර අංශයන් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව තුළට ගෙනල්ලා අපේ අය වැය විවාදය ඇතුළු අනෙකුත් වාද විවාදවලදී ප්‍රජාතන්ත්‍රවාදය වඩාත් පුළුල් ලෙස ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදයක් ඇති කර ගැනීම පිළිබඳව අපේ රජයේ විරුද්ධත්වයක් නැහැ. දිනෙන් දින අලුතෙන් එකතු වන න්‍යාය පද්ධතීන්, වෙනත් කරුණු කාරණා, කාලානුරූපව සකස් කර ගනිමින් තමයි පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය දියුණු වන්න ඕනෑ. මුල් අවධියේ බ්‍රිතාන්‍යයේ පැවැති පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදයට වඩා වෙනත් ස්වරූපයක් අද තිබෙනවා.

ලෝකයේ සෑම රටකම පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය දියුණු වීමේ ඉතිහාසය දිහා බැලුවාම අපට පේනවා ඔවුන් අලුත් කරුණු කාරණා ඒ සඳහා උපයෝගී කර ගත් බව. උදාහරණයක් වශයෙන් අපේ තිබෙන ස්ථාවර නියෝග, ඒ වාගේම පාර්ලිමේන්තුවේ අනිකුත් වැඩ කටයුතු කිරීමේ සම්ප්‍රදායන් හා වැඩ පිළිවෙළවල් කාලානුරූපව වෙනස් විය යුතුව තිබෙනවා.

ගරු කථානායකතුමනි, මෙවැනි අත් හදා බැලීමක් අප දැනට අවුරුදු දෙකකට පෙර පටන් ගත්තා. ආණ්ඩු පක්ෂයේත්, විපක්ෂයේත් අපේ ගරු මන්ත්‍රීතුමන්ලා ස්ථාවර කමිටුවක් හැටියට එකතු වෙලා, ඒ වාගේම ඒ අමාත්‍යාංශවලට අයිති නිලධාරින් ගෙන්වලා සමහර අමාත්‍යාංශ ගණනාවක අය වැය යෝජනා පිළිබඳව අප පුළුල් ලෙස සාකච්ඡා කළා. එපමණක් නොවෙයි, ඊට පෙර වර්ෂයේ ඒ ඒ අමාත්‍යාංශවල ක්‍රියාකාරිත්වය, රජයෙන් ලබා දෙන මුදල්වලින් කරන ලද වැඩ කටයුතු, ඒවායේ ඵලදායීතාව කියන මේ සෑම අංශයක්ම පිළිබඳව එහිදී පුළුල් වූ සාකච්ඡා පැවැත්වුවා. ආණ්ඩු පක්ෂයේ වාගේම විපක්ෂයේ මන්ත්‍රීවරුන් විශාල සංඛ්‍යාවක් ඒවාට ඉතාම උනන්දුවෙන් සහභාගි වෙලා හුදෙක් ආණ්ඩුව විවේචනය කිරීමේ සංකල්පයෙන් බැහැරව ඉතා වටිනා අදහස් රාශියක් ලබා දුන්නා.

අපේ රජය එවැනි ඉතාම වැදගත් කරුණු පෙන්වා දීම් සැලකිල්ලට ගැනීම නිසා, ඊළඟ වර්ෂයේ වැඩසටහන් සම්පාදනය කිරීමටත්, ඒ වාගේම අමාත්‍යාංශවල වැඩ කටයුතු ඉදිරියට කර ගෙන යාමත් පිළිබඳව අපේ වැඩ කටයුතු සකස් කර ගැනීමට අවස්ථාවක් ලැබුණා කියන එක මම ප්‍රකාශ කරන්න කැමැතියි. ඒ කමිටුවේ සභාපතිවරයා හැටියට ඒ අවුරුදු දෙකේම වැඩ කටයුතු කරන්න මට අවස්ථාව ලැබුණා. විශේෂයෙන්ම මා ප්‍රකාශ කරන්න ඕනෑ විපක්ෂයේ ගරු ජෝන් අමරතුංග මැතිතුමා, ගරු ජෝශප් මයිකල් පෙරේරා මැතිතුමා වැනි අය ඉතාම දැඩි උනන්දුවකින් හා ඕනෑකමකින් ඒ රැස්වීම්වලට සහභාගි වෙලා සුවිශේෂ වශයෙන්ම මේ වැඩ කටයුතු, අමාත්‍යාංශ වැඩ කටයුතු ජනතාවට වඩාත් ළං කිරීම සඳහා කළ යුතු කාර්ය භාරය පිළිබඳ විශාල වැඩ පිළිවෙළකට අපට සහයෝගය දුන් බව. ඒ නිසා මෙය හිතකර ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයක්. මෙවැනි ක්‍රමයක් අප අලුතින් ආරම්භ කර තිබෙනවා. රවි කරුණානායක මැතිතුමා කියන පරිදි මේ ක්‍රමය තව දුරටත් පුළුල් කිරීමේ අදහස පිළිබඳව අප පක්ෂ නායකයින් සමඟ සාකච්ඡා කරලා, ඔබතුමා සමඟ සාකච්ඡා කරලා, මේ පාර්ලිමේන්තුවේ තිබෙන ස්ථාවර නියෝග සහ අනිකුත් නීතිරීති, රෙගුලාසි ගැන කල්පනා කරලා කුමන ආකාරයක ක්‍රමවේදයක් සකස් කළ යුතුද කියන කාරණය පිළිබඳව අපට අනාගතයේදී වැඩ කටයුතු කිරීමට අවස්ථාවක් ලැබෙයි කියලා මා විශ්වාස කරනවා.

ගරු කථානායකතුමනි, මගේ යුතුකමක් හා වග කීමක්ව තිබෙනවා, මේ විවාදයේදී ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා විසින් ප්‍රකාශ කරන ලද කරුණු පිළිබඳව රජයේ ස්ථාවරය ප්‍රකාශ කිරීමට. එහෙම නැත්නම් රජය වෙනුවෙන් මම මගේ යුතුකම ඉටු නොකළා වන්නට පුළුවන්. එතුමා මේ පාර්ලිමේන්තුව තුළ ඉඳගෙන හැම දාම ආර්ථිකය ගැන කථා කරනවා. එතුමා මේ දක්වා කරපු කථා සියල්ලම ඒක රාශි කරලා, කොම්පියුටරයකට දමලා බැලුවොත් එතුමා හැම දාම කරලා තිබෙන්නේ එකම කථාව බව ඔබතුමන්ලාටත් පෙනේවි. වචන සහ පද මාලා වෙනස් වීම පමණයි වෙලා තිබෙන්නේ. හැම වෙලාවේම එතුමාගේ කථාවේ හරය වුණේ, "ඔන්න ආණ්ඩුව හෙට කඩා වැටෙනවා, මෙන්න ආර්ථිකය හෙට කඩා වැටෙනවා, මේ ආණ්ඩුව ගෙන යන්න බැහැ, මේ ආර්ථිකය කඩා වැටෙනවා" කියන එක. නමුත් ගරු කථානායකතුමනි, අපේ රජය මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ඒ දූරදර්ශී නායකත්වය යටතේ ඉතා ශක්තිමත් ලෙස ඉදිරියට ගියා. මේ රටේ කොන්ක්‍රීට් පාරවල් හැදුවා විතරක් නොවෙයි, කාපට් කරපු පාරවල් පමණක් නොවෙයි, මේ රටේ යටිතල පහසුකම් දියුණු කිරීම ඇතුළු වාර්තාගත වී අස්වැන්නක් අපි ලබා ගත්තා. අටු කොටු සරු වුණා.

අද අපට තිබෙන ප්‍රශ්නය මොකක්ද? අද අපට තිබෙන ප්‍රශ්නය අතිරික්ත වී ප්‍රමාණය විකුණා ගැනීම. අපට අවුරුද්දකට ඇති වන තරම් සහල්, වී අප ගබඩා කර තිබෙනවා. බලන්න, ආහාර සුරක්ෂිතතාව අතින් ලංකාව වාගේ උච්චස්ථානයකට පැමිණි වෙනත් රටක් තිබෙනවාද? තුන්වැනි ලෝකයේ රටක් වශයෙන් අප ත්‍රස්තවාදය දුරු කරලා, කුරිරු ත්‍රස්තවාදයට එරෙහිව සටන් කරලා නැඟිටලා අද කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ ලබා ගත්ත දියුණුව හැමෝටම පේන්න තිබෙනවා.

ගරු කථානායකතුමනි, මේ රටේ ජනතාව මේ සියල්ල මනින්නේ උච්ඡාවචනය වන ඩොලරයේ අගය මත නොවෙයි. එදිනෙදා තමන්ගේ සාක්කුවට කීයක් ලැබෙනවාද, තමන්ගේ ආදායම් මාර්ග කොහොමද, තමන්ගේ අටුකොටු සරු වෙලා තිබෙනවාද කියන එකයි ඒ අය බලන්නේ. වී, පලතුරු වාගේ නිෂ්පාදන සම්බන්ධයෙන් අද තිබෙන මැසිවිල්ල ඒ සඳහා ලැබෙන මුදල මදියි කියන එකයි. පාරිභෝගිකයාට ඉතා අඩු මුදලකට ඒවා ලබා ගන්නට පුළුවන්. විපක්ෂ නායකතුමා එදා කිව්වා, "පතෝල ගණන් වැඩියි, පතෝල කිලෝ එකක් රුපියල් 60යි" කියලා. ඉතින් අද සිදු වෙලා තිබෙන්නේ ඒකේ අනෙක් පැත්ත. අපට ආඩම්බර වන්නට පුළුවන් ආර්ථිකයක් අපේ රටට අපේ ජනාධිපතිතුමා සකසා දීලා තිබෙනවා.

අද මේ යෝජනාව ඉදිරිපත් කරපු ගරු මන්ත්‍රීතුමා කිව්වා, රටේ ණය බර වැඩි වෙලා කියලා. එතුමාත්, හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාත්ඇතුළු කිහිප දෙනෙක් හැමදාම කථා කරන්නේ රටේ ණය බර ගැනයි. ගරු කථානායකතුමනි, අපි ඉතා පැහැදිලිව පෙන්වා දුන්නා, මේ රටේ ආර්ථිකය ශක්තිමත් බව. අද එංගලන්තය, ඇමෙරිකාව, ප්‍රංශය, ජර්මනිය වාගේ රටවල් සිය දේශීය නිෂ්පාදනයෙන් සියයට 102, සියයට 103, සියයට 104 දක්වා ණය ලබා ගනිද්දී, ශ්‍රී ලංකාවේ ණය ප්‍රමාණය දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 108 ඉඳලා සියයට 76 දක්වා අපි අඩු කළා. එවැනි ආර්ථික ප්‍රගතියක් අප ලබා ගෙන තිබෙනවා. Sri Lanka is not a failed State. අපි අපේ ණය නියම වෙලාවට ගෙවලා තිබෙනවා. ඒ ගැන ආඩම්බර වන්නට පුළුවන්. අද අපට සෑහෙන මුදල් සංචිතයක් තිබෙනවා.

අපේ මිලියන 1.5ක් පමණ වූ ජනතාව පිට රට සේවය කරනවා. ඔවුන් අපට මුදල් එවනවා. ඒ වාගේම ඩොලරය ඉහළ යාමේ ප්‍රතිඵලයක් වශයෙන් සමහර අහිතකර බලපෑම් තිබෙන එක ඇත්ත බව අපි දන්නවා. හිතකර බලපෑම් ගැන කථා කරන්නේ නැත්තේ ඇයි? Exportsවල යෙදී සිටින අයට ලැබෙන මුදල් පිළිබඳව කථා කරන්නේ නැත්තේ ඇයි? ඒ වාගේම තේ, කුරුඳු, රබර්, garments මේ වාගේ දේවල්වලින් විශාල ආදායමක් අපේ දේශීය නිෂ්පාදකයාට ලැබෙනවා ගරු කථානායකතුමනි. එපමණක් නොවෙයි. අද අපේ ආර්ථිකය ශක්තිමත් වෙලා ඒක පුද්ගල ආදායම වැඩි වෙලා තිබෙනවා. මේ අනුව ආසියාවේ ඉදිරියට යන රටක් හැටියට ශ්‍රී ලංකාව නම් දරා තිබෙනවා.

අපේ රටට අමතර ගුවන් තොටුපොළක් අවශ්‍යයි. සංචාරකයින් ගලා එනවා. මේ ආර්ථික සංවර්ධනයේ ප්‍රතිඵල නිසා අද හෝටල් වැඩි වැඩියෙන් බිහි වනවා. හෝටල් ක්ෂේත්‍රයේ රැකියා වැඩි වනවා. ඇමෙරිකාවේ විරැකියාව සියයට 20ක් වන කොට ලංකාවේ විරැකියාව සියයට 5යි. විරැකියාව කියන ඒ අංශයෙන් ඇමෙරිකාව, එංගලන්තය, ප්‍රංශය, ජර්මනිය, ජපානය වැනි රටවලට වඩා අද ශ්‍රී ලංකාව ඉතාම ඉදිරියෙන් සිටිනවා. අපි අද ඒක දන්නවා. සමහර රැකියා සඳහා අද අපේ රටේ පුද්ගලයන් සොයා ගන්නට පුළුවන්කමක් නැහැ. Free Trade Zone එකේ හරි, එහෙම නැත්නම් ගම්වල, ඒ ඒ ප්‍රදේශවල අද රැකියාවන් සඳහා අවශ්‍ය පුද්ගලයන් ප්‍රමාණය සොයා ගන්න නැහැ. ඒ නිසා අපේ රටේ මේ ආර්ථිකය නිවැරදි පැත්තකට තමයි අද ගමන් කරන්නේ කියලා අපිට කියන්න පුළුවන්.

ගරු කථානායකතුමනි, සර්ව සම්පූර්ණ වූ රජයක්, සර්ව සම්පූර්ණ වූ ආර්ථික ප්‍රතිපත්තියක්, සර්ව සම්පූර්ණ වූ වැඩ පිළිවෙළක් කොයි රජයකවත් නැහැ. රජයේ සමහර වැඩ පිළිවෙළවල් තුළ සමහර අඩු පාඩුකම් තිබෙන්නට පුළුවන්. ඒවා හදා ගෙන අපි ඉදිරියට යාමේ වැඩ පිළිවෙළක් තිබෙනවා.

[ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

පසු ගිය දා දියතලාවේ ගිහිල්ලා, අතිගරු ජනාධිපතිතුමා ඇතුළු ආණ්ඩු පක්ෂයේ අපි සියලු දෙනාම එකතු වෙලා පූර්ණ විමර්ශනයක් කළා. අපේ රජය ආපු ගමන පිළිබඳව පෙර විමසුමක් කළා. අපි ආපු ගමනේ දී මොනවා සම්බන්ධයෙන්ද ධනාත්මක ස්වරූපයෙන් අපි ඉදිරියට ගිහින් තිබෙන්නේ, මොන ස්ථානයේද අපට වැරදුණේ, කුමන තැන්වලදීද අපේ අඩු පාඩුකම් සිදු වුණේ, ජනතාව පැත්තෙන් එන මැසිවිලි මොනවාද කියන කාරණා ගැන විමසුමක් කළා. අපේ රජය දරදඬු රජයක් නොවෙයි; දඩබ්බර රජයක් නොවෙයි. හැම වෙලාවේම අපේ අඩු පාඩුකම් මොනවාද කියලා සොයා බලා, පෙන්වා දෙනවා නම් ඒවා නිහතමානීව භාර ගෙන, ඉදිරියට යාමට අපේ රජය සූදානම්ව සිටිනවා කියන එක මා කියන්න කැමැතියි.

ගරු කථානායකතුමනි, මෙයට අදාළ නැති වුණත් විශේෂයෙන්ම LLRC වාර්තාව හා ජිනීවා සාකච්ඡා පිළිබඳව රවි කරුණානායක මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා. එම නිසා එතුමාට පිළිතුරු දීම මගේ යුතුකමක් වනවා. ගරු කථානායකතුමනි, මා කියන්න කැමැතියි, ජිනීවා ගිය කණ්ඩායමේ අපි සියලු දෙනාම එකතු වෙලා, සාමූහික වග කීමෙන් යුතුව මේ රටට එල්ල වෙලා තිබෙන තර්ජනවලින් මේ රට බේරා ගැනීම සඳහා උපරිම උත්සාහයක් දැරුවාය; ඉදිරියටත් දරනවාය කියලා.

ගරු කථානායකතුමනි, ඒ වාගේම එතුමා ප්‍රකාශ කළා, අපි මේ රණ විරුවන් බිල්ලට දෙන්න යනවාය කියලා. ගරු කථානායකතුමනි, ශ්‍රී ලංකා රජය වෙනුවෙන් මා ප්‍රකාශ කරන්න කැමැතියි, මේ රටට සාමය උදා කර දීමට දිවි පිදූ රණ විරුවන් කිසිවකු බිල්ලට දීමට මේ රජය සූදානම් නැහැයි කියලා. [බාධා කිරීමක්] ගරු කථානායකතුමනි, යුද හමුදාව මඟින් කරන පරීක්ෂණ හා වෙනත් පරීක්ෂණ තුළින් කරන්නේ රණ විරුවන් බිල්ලට දීම නොවෙයි. යම් කෙනකුගෙන් excess එකක් වුණා නම්, වැරැද්දක් වුණා නම් ඒ පිළිබඳව පරීක්ෂා කර බැලීම සදාචාරාත්මකව කළ යුත්තක්. ඒකෙන් අපි අදහස් කරන්නේ නැහැ, ඔවුන් බිල්ලට දෙන්න යනවාය කියලා. අපි ඔවුන්ව ආරක්ෂා කරනවා. ඔවුන්ගේ ශුභ සාධනය ගැන අපි හැම විටම බලනවා. ඒ අංශය කෙරෙහි, විශේෂයෙන්ම රණ විරු ශුභ සාධනය පිළිබඳව අපේ රජය ඉතාම ඕනෑකමින් සොයා බලන බවත් මා ප්‍රකාශ කරන්න කැමැතියි.

ගරු කථානායකතුමනි, මා මීට වඩා දීර්ඝ වශයෙන් කථා කරන්නේ නැහැ. රවි කරුණානායක මන්ත්‍රීතුමාට මා ස්තුතිවන්ත වනවා, මෙම යෝජනාව ගෙන ඒම පිළිබඳව. එසේම මෙම යෝජනාව යථාර්ථවාදී ලෙස ක්‍රියාත්මක කිරීමට තිබෙන හැකියාවන් ගැන අපි සොයා බලමු. බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
යෝජනාව ඉදිරිපත් කළ ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමාට තව විනාඩි 5ක් තිබෙනවා.

[අ.භා. 2.57]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ස්තුතියි, ගරු කථානායකතුමනි. නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමා ආණ්ඩුවේ ස්ථාවරය හෙළිදරව් කිරීම මා අගය කරනවා. ඒ වාගේම මෙම යෝජනාවේ හොඳ ගුණාංග තිබෙනවා නම් ඒ පිළිබඳව නැවත සාකච්ඡා කරලා, කථානායකතුමාගේ නායකත්වය තුළින් ඒ හොඳ ගුණාංග රටේ අභිවෘද්ධිය වෙනුවෙන් ක්‍රියාත්මක කරන්න පුළුවන් නම් හොඳයි කියා මා ප්‍රකාශ කරනවා.

ඒ විතරක් නොවෙයි. නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමා කිව්වා, ආණ්ඩුවේ සංවර්ධනාත්මක කටයුතු පිළිබඳ විවේචන තිබෙනවා නම් හිස නවා ඒවා පිළිගන්නවාය කියලා. ඒ පිළිබඳව කථා බහට ලක් වෙලා තිබෙනවා මීසක් ඔබතුමන්ලාගේ ආණ්ඩුවෙන් ඒක ක්‍රියාත්මක කරනවාද යන ප්‍රශ්නයයි තිබෙන්නේ. ඔබතුමන්ලාගේ ආණ්ඩුව ආශ්චර්යවත් රටක් හදන්න යන ගමනේදී, පූර්ව විමර්ශනයක් තුළින් අය වැය විවාදයක් කරන්න පුළුවන් නම්, ඒ තුළින් රටේ සංවර්ධනය සඳහා මීට වඩා ඉලක්ක කරලා වැඩ කරන්න කියා මා නැවත කියනවා. හොඳම උදාහරණය වශයෙන් මා කියන්නේ, මේ රටේ ප්‍රාග්ධනය වියදම් කර තිබෙන බවයි.

ගරු කථානායකතුමනි, එතුමා කිව්වා, මේක හදනවාය, අරක හදනවාය කියලා. හොඳයි. වරායවල් හදන කොට හදන්නේ මාස 14කට නැව් 5ක් එන වරායක්ද, එහෙම නැත්නම් හැම දවසකටම නැව් 5ක්, 10ක්, 15ක් එන්න පුළුවන් වරායක්ද? මේක තමයි වෙනස. මත්තල airport එකක් හදන්න අවශ්‍යයි. කටුනායක ගුවන් තොටු පොළේ දේශගුණයේ ප්‍රශ්නයක් තිබෙනවා නම්, ඊට වඩා හොඳ දේශගුණයක් තිබෙන ගුවන් තොටු පොළක් තමයි හදන්න අවශ්‍ය වන්නේ. අපට ප්‍රශ්නය තිබෙන්නේ ගුවන් තොටු පොළ හදන තැන නොවෙයි; එය හදන්නේ ඇයි, එය මීට වඩා සංවර්ධනය කරන්න පුළුවන් වන්නේ කොහොමද කියන එකයි.

මා මේ අවස්ථාවේදී උදාහරණයක් වශයෙන් "දැයට කිරුළ" ප්‍රදර්ශනය ගැන කියන්නම්. එය රටේ නාස්තිකාර වියදමක්. ඔබතුමන්ලාගේ ආණ්ඩුවෙන්ම කියා තිබෙනවා, ඒ සඳහා රුපියල් කෝටි 2,180ක් වියදම් කළාය කියලා. පෙබරවාරි මාසයේ 04 වන දා සිට 12 වන දා දක්වා මේ සැණකෙළිය තිබුණාය කියලා ඇමතිවරු පිළිගෙන තිබෙනවා. මීට දවස් හයකට, හතකට පෙර මා ඔයාමඩුව ප්‍රදේශයට ගිහින් බලන විට, සම්පූර්ණයෙන් නටබුන් විතරයි තිබුණේ. ඉතින් ඒ වියදම් කළ රුපියල් කෝටි 2,180 අපරාධයක්. එතැන තිබුණු රේල් පීලි ටික ගලවලා, එතැන තිබුණු ලයිට් කණු ටික ගලවලා තිබෙනවා. එතැන අක්කර 600ක් තිබෙනවා. අඩු ගණනේ ලයිට් එකක් නැහැ. කථානායකතුමනි, මේක කිව්වේ වෙන කවුරුත් නොවෙයි, ඔබතුමන්ලාගේ පක්ෂයේ -ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ- තරුණ පෙරමුණේ නායකයෙක්. ඔහුගේ නම මා කියන්නේ නැහැ. මොකද, ඔහු කිව්වා ඔහුගේ නම කියන්න එපාය කියලා. ඔහු කිව්වා, "අනේ, මේ කරන අපරාධයක්. අපට රක්ෂාවක් නැහැ. මෙතැන ලයිට් කණුවක් නැහැ"යි කියලා. මා වග කීමකින් ඒක කියන්නේ. එයින් කිසිම දේශපාලන තෘප්තියක් ලැබෙන්නේ නැහැ. නමුත් මට එහි ගිහින් බැලුවාම ඇති වුණ ලොකුම ප්‍රශ්නය තමයි, මේ රුපියල් කෝටි 2,180 ගණනක් වියදම් කරලා තිබෙන්නේ ඇයි කියන එක. රංජිත් සියඹලාපිටිය ඇමතිතුමා එතැන ඉදි කරපු රේල් පීලි දිගේ ධාවනය වුණ දුම්රියේ කථා කරකර ගියේ, මෙන්න අපි ජනතාවට මේකෙන් සියයට 70ක දායකත්වයක් දෙනවාය කියලායි. ඒ රේල් පීලි ටිකවත් දැන් නැහැ නේ, ගරු කථානායකතුමනි. ඉතින් මේ රටේ, මේ පාර්ලිමේන්තුවේ මුදල් ආරක්ෂා කරන්න තිබෙන අවස්ථාවේදී ඒක නැති වීමේ ප්‍රතිවිපාක මේවා තමයි.

ඒ විතරක් නොවෙයි. දැන් මේ පොහොර රුපියල් 350ට දෙනවාය කියනවා. නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමා මේ ගරු සභාවේදී කිව්වා, වී අතිරික්තයක් තිබෙනවාය කියලා. ඒක සම්පූර්ණයෙන් වැරැදියි. අපි තවම ආනයනය කරනවා, යම් දේවල්. ඔක්කෝම නොවෙයි. ඒ වාගේම වී ගබඩා කිරීමේ ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. ඒ නිසා තමයි වී මෙට්‍රික්ටොන් 50,000ක් ගබඩා කරන්න ඕනෑ කියලා අනුරාධපුර "දැයට කිරුළ" වැඩසටහනට සමගාමීව ගබඩා සංකීර්ණයක් හදන්න හැදුවේ. නමුත් වී වගා කරන්නේ ගලෙන්බිඳුණුවැව ආදී පැතිවල. ඒ පැතිවල ඉඳන් ඔයාමඩුවට ගෙනෙන්න කිලෝමීටර් 80ක් යනවා. වැරදි තැනක ගබඩා ඉදි කරලා රටේ ජනතාවගෙන් බදු හැටියට ගන්නා සල්ලි නිකරුණේ වියදම් කිරීමක් තමයි කරන්නේ. ගලෙන්බිඳුණුවැව ප්‍රදේශයේ තිබෙන වී අස්වැන්න නෙළලා,

ඔයාමඩුවේ තිබෙන වී ගබඩාවට ගෙනෙන්න කිලෝමීටර් 80ක් යනවා ලු. මම නොවෙයි කියන්නේ. ඒ ප්‍රදේශයේ ඉන්න ජනතාවයි කියන්නේ. සමහර විට ඒ ප්‍රදේශය ගැන මගේ දැනුවත්කම අඩු වෙන්න පුළුවන්. නමුත් ජාතික ප්‍රශ්නයක් නිසායි මම මේ ගැන කථා කරන්නේ. ඒ ප්‍රශ්නයට උත්තරය මොකක්ද?

ඊ ළඟ කාරණය තමයි පොහොර සහනාධාරය. අපේ කෘෂිකර්ම ඇමතිවරු පුන පුනා කියනවා, "අපි පොහොර සහනාධාරය සම්බන්ධයෙන් කෝටි 4,000ක් වාර්ෂිකව වෙන් කරනවා" කියා. අපි අවුරුදු 6,7ක් මේ වාගේ පොහොර සහනාධාරය පාවිච්චි කරලා තිබෙනවා. පොහොර සහනාධාරයට හැම අවුරුද්දේම රුපියල් කෝටි 4,000ක් වියදම් කරනවා නම්, අපේ නිෂ්පාදනය අඩු ගණනේ සියයට 50කින් වැඩි වෙන්න ඕනෑ නේද? අපි පොහොර ලංකාවේ දමලා අස්වැන්න ඉන්දියාවෙන් ලබා ගන්නේ නැහැ නේ. ගරු ඇමතිතුමනි, ඔබතුමා කෘෂිකර්ම ඇමතිවරයා වශයෙන් දන්නවා පාර්ලිමේන්තුවෙන් රුපියල් කෝටි 4,000ක් වෙන් කරලා තිබුණාට වියදම් කර තිබෙන සැබෑ මුදල් ප්‍රමාණය කීයද කියලා. ඒවා තමයි පූර්ව විමර්ශනයට ලක් කරන්න අවශ්‍ය වන්නේ.

අද නොමිලේ දෙන පාසල් නිල ඇඳුම අහිංසක දූ දරුවන්ට ලැබිලා නැහැ. අද ඒ සම්බන්ධයෙන් ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. පාසල් නිල ඇඳුම් සම්බන්ධ වියදම කොහේද දරලා තිබෙන්නේ? ඒ වාගේම තමයි Ceylon Petroleum Corporation එකේ තිබුණු අලාභය. ඒ වාගේම තමයි ලංකා විදුලිබල මණ්ඩලය. මම ඒ සම්බන්ධයෙන් එදා මතක් කළා. ඒ ගැන නැවත මතක් කරන්න අවශ්‍යතාවක් නැහැ. ඉතින් මීට වැඩිය ආණ්ඩු පක්ෂය හා විපක්ෂය යන දෙපැත්තම ක්‍රමානුකූලව ක්‍රියා කරන්න අවශ්‍යයි මේ රටේ ආර්ථිකය ඉදිරියට ගෙන යන්න. රටේ ජාතික ආර්ථිකයක් හදන්න අවශ්‍යතාවක් තිබෙනවා නම් කරුණාකරලා ආණ්ඩුව මේ යෝජනාව ක්‍රියාත්මක කරන්න. අපේ රටේ අදට වඩා හොඳ හෙට දිනයක්, හෙට හොඳ ජීවිතයක් ගත කරන්න පුළුවන් ආර්ථිකයක් හදන්න කියන එක මා මතක් කරනවා.

මතක තියා ගන්න මගේ ඉලක්කය වන්නේ, එක්සත් ජාතික පක්ෂයේ ඉලක්කය වන්නේ ජාතික ආර්ථිකයක් හදන එකයි; ඒ වාගේම පුංචි ලංකාව එක්සත් කරලා ලෝකයට තරගකාරී තත්ත්වයක් ඇති කිරීමයි. මම නැවත කියනවා, අපි මෙතැන ලොකුවට සතුටුදායක තත්ත්වයක් පෙන්වන්න හොඳ නැහැ ලෝක ආර්ථිකය කඩා වැටිලා තිබෙනවා කියලා. ලෝක ආර්ථිකය කඩා වැටුණාම ඒකෙන් වැඩියෙන්ම ප්‍රශ්නය ඇති වන්නේ අපිටයි. තෙල් මිල උච්චාවචනය වන්නේ ඒ පැත්තට තිබෙන වුවමනාව නිසායි. දැන් ලෝකයේ තෙල් බැලරය තව ඩොලර් හයකින්, හතකින් වැඩි වුණොත් ආයෙත් අපේ රටේ තෙල් මිල වැඩි කරනවාද? ඒ ප්‍රශ්නය ජනතාවට දරා ගන්න පුළුවන්ද? එතකොට අපනයනය කිරීමේ හැකියාව ඊට වඩා අමාරු වනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දැන් අවසන් කරන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මම මීට වැඩිය කථා කරන්න යන්නේ නැහැ. මේ අවස්ථාවේදී මම බොහොම ස්තුතිවන්ත වෙනවා මම පාර්ලිමේන්තුවේ ඉදිරිපත් කරපු යෝජනාවට අදහස් උදහස් ලබා දීම ගැන. මම කරුණාකරලා ආණ්ඩුවට කියනවා, වැඩිකල් යන්න ඉස්සර වෙලා මේ යෝජනාව අපේ රටේ අභිවෘද්ධියට පාවිච්චි කරන්න කියලා. බොහොම ස්තුතියි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
බොහොම ස්තුතියි.

දෙවන යෝජනාව ගරු අජිත් කුමාර මහතා. එතුමා පැමිණ නැහැ. තුන්වන යෝජනාව ගරු තිලංග සුමතිපාල මහතා.

## වෛද්‍ය ක්ෂේත්‍රයේ වෘත්තීමය වටිනාකම සුරැකීම
## மருத்துவத் துறையின் தொழில்சார் பெறுமதியினைப் பேணல்
## PROTECTING THE PROFESSIONAL DIGNITY OF THE MEDICAL FIELD

[අ.භා. 3.03]

**ගරු තිලංග සුමතිපාල මහතා**
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)
නමෝ බුද්ධාය!

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"දේශීය හා ජාත්‍යන්තර වෛද්‍ය ක්‍රමය තුළ වෘත්තීමය සුදුසුකම් හා අත්දැකීම නොමැති වෛද්‍යවරුන් හා වෛද්‍යවරියන් ප්‍රතිකාර කිරීමෙහි යෙදී සිටීම තුළින් සාමාන්‍ය රෝගී ජනතාවට විශාල ගැටලුවලට මුහුණ පෑමට සිදුවීමෙන් අසරණ තත්ත්වයකට පත්ව ඇති හෙයින් ද, ඒ තුළින් වෛද්‍ය ක්ෂේත්‍රය තුළ සිටින්නා වූ සුදුසුකම් ඇති වෛද්‍ය වෘත්තිකයන් සමාජය තුළ අවමානයට පත්ව ඇති හෙයින්ද, වෛද්‍ය ක්ෂේත්‍රයේ වෘත්තීමය වටිනාකම සුරැකීමට ක්‍රමවත්ව හා විධිමත්ව නීත්‍යානුකූලව ක්‍රියාත්මක විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි."

ගරු කථානායකතුමනි, ප්‍රථමයෙන්ම මේ අවස්ථාව මට ලබා දීම ගැන ඔබතුමාට මා ස්තුතිවන්ත වනවා. ඒ වාගේම ඔබතුමා මුලසුනේ සිටිද්දී මේ යෝජනාව ඉදිරිපත් කිරීමට ලැබීම ගැනත් මා සන්තෝෂ වනවා.

ගරු කථානායකතුමනි, මෙම යෝජනාවේ පසුබිම හැටියට මම කියන්න කැමැතියි, වෛද්‍යවරුන් ලෙස පෙනී සිටින පුද්ගලයන් 10,000ක් පමණ සිටින බව සෞඛ්‍ය අමාත්‍යාංශය 1990 දශකයේදී පෙන්වා දුන් බව.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා] මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு சந்திரகுமார் முருகேசு] தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. SPEAKER *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. MURUGESU CHANDRAKUMAR] *took the Chair.*

**ගරු තිලංග සුමතිපාල මහතා**
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, බොහෝ අය සිතන පරිදි මෙවැනි වෛද්‍යවරුන් රෝගීන්ට ප්‍රතිකාර කිරීම සිදු කරන්නේ දුෂ්කර ප්‍රදේශවල නොවේ. බොහෝ විට කොළඹ ඇතුළු තදාසන්න ප්‍රදේශවලය. කොටින්ම කියතොත් අප ජීවත් වන බොරැල්ල මැතිවරණ කොට්ඨාසය ආශ්‍රිත ප්‍රදේශයේය.

මෙවැනි නීතිවිරෝධී වෛද්‍යවරුන් නිසා රටක සෞඛ්‍ය සේවයේ බරපතළ ගැටලු ඇති වන අතර ඔවුන් විසින් රෝගීන්ට දෙනු ලබන ප්‍රතිකාර නිසා රෝගී තත්ත්වය උත්සන්න වන අතර, එයින් ඇති වන සංකූලතා හේතුවෙන් රෝහල්ගත වන පිරිස දිනෙන් දින වර්ධනය වෙමින් පවතී. පැරසිටමෝල් වැනි ඖෂධ පවා වැරදි මාත්‍රාවන් ලබා දුන් විට ඇස් අන්ධ වීම වැනි බරපතළ අතුරු ආබාධ පමණක් නොව ජීවිත හානි පවා ඇති විය හැකිය. ප්‍රතිජීවක ඖෂධ අත්තනෝමතික ලෙස භාවිතයෙන් ඖෂධවලට ඔරොත්තු නොදෙන තත්ත්වයක් ඇති වේ. මෙවන් අවාසනාවන්ත සිද්ධීන් හේතුවෙන් සෞඛ්‍ය ක්ෂේත්‍රයට අනවශ්‍ය බරක් දැරීමට සිදු වේ.

ඊට අමතරව සෞඛ්‍ය නිවාරණ වැඩසටහන ව්‍යාකූල කිරීම මෙම ගැටලුවට බලපාන ප්‍රධාන සාධකයක් බවට පත් වී ඇත. සෞඛ්‍ය ප්‍රතිපත්තියට අනුව සිදු වන වැඩ පිළිවෙළ පිළිබඳව මෙම පුද්ගලයන්ට කිසිදු අදහසක් නොමැත. එපමණක් නොව සංඛ්‍යා ලේඛනවලටද ඔවුන් ව්‍යාකූලත්වයක් ඇති කරයි.

දැනට ශ්‍රී ලංකාවේ නීත්‍යනුකූලව වෛද්‍යවරුන් ලෙස කටයුතු කළ හැකි කොට්ඨාස තුනකි. එනම්:

1. බටහිර වෛද්‍ය (1927 අංක 26 දරන වෛද්‍ය ආඥාපනතින්ද, 1979 අංක 10 දරන පනතින්ද සංශෝධිතය.)
2. ආයුර්වේද වෛද්‍යවරු (1961 අංක 31 දරන ආයුර්වේද ආඥාපනත)
3. හෝමියෝපති වෛද්‍ය (1970 අංක 31 දරන හෝමියෝපති වෛද්‍ය ආඥාපනත)

   මෙම කොට්ඨාස අතරින් රෝගීන් සඳහා බටහිර ඖෂධ නියම කිරීමට අධ්‍යාපනික සහ නීතිමය සුදුසුකම් ඇත්තේ බටහිර වෛද්‍යවරුන්ට පමණි. ව්‍යාජ ලෙස වෛද්‍ය වෘත්තියේ නියැලෙන පුද්ගලයන් පහත පරිදි දැක්විය හැක.

1. කිසියම් හෝ ආකාරයක සුදුසුකමක් නොමැති පුද්ගලයන්;
2. සෞඛ්‍ය ක්ෂේත්‍රයේ නියුතු එහෙත් වෛද්‍ය ක්ෂේත්‍රයට සුදුසුකමක් නොමැති පුද්ගලයන් (උදා: හෙදියන්, සෞඛ්‍ය සේවකයන් හෝ ඖෂධවේදීන්); සහ
3. වෛද්‍ය උපාධියක් සතු වුවත් නීත්‍යනුකූල ලෙස ලියා පදිංචි නොවූ පුද්ගලයන්.

   මෙවැනි නීතිවිරෝධී වෛද්‍යවරුන් ආකාර කිහිපයකින් වෛද්‍ය සේවයේ නිරත වේ. එනම්;

1. තම ඥාතියකුගේ වෛද්‍ය සභා ලියා පදිංචි අංකය භාවිත කරමින්;
2. මියගිය වෛද්‍යවරයකුගේ වෛද්‍ය සභා ලියා පදිංචි අංකය භාවිත කරමින්;
3. ව්‍යාපාර ලියා පදිංචි අංකයක් වෛද්‍ය සභා ලියා පදිංචි අංකය ලෙස භාවිත කරමින්; සහ
4. කිසිදු ලියා පදිංචි අංකයක් භාවිත නොකරමින්.

   මෙම ව්‍යාජ ලෙස වෛද්‍ය ක්ෂේත්‍රයේ නිරතවන්නන්ට ලබා දෙන දඩුවම් දඩ මුදලකට සීමා වීම ප්‍රමාණවත් නොවීමත්, මෙවැනි අය මර්දනය සඳහා ලියා පදිංචි වෛද්‍යවරුන්ගේ දත්ත පොලිස් ස්ථානවල නොමැති වීමත් විශාල ගැටලුවකි.

ගරු නියෝජ්‍ය කාරක සභාතිතුමනි, ඒ වාගේම විදේශයන්හි සිට ලංකාවට පැමිණෙන ප්‍රමාණවත් සුදුසුකම් නොමැති වෛද්‍යවරුන් පෞද්ගලික අංශයේ සේවයේ නිරත වන බවට අපට වාර්තා වෙනවා. එම වෛද්‍යවරුන්ගේ අධ්‍යාපනික සුදුසුකම් හා පුහුණුව සම්බන්ධයෙන් බොහෝ දෙනාගේ අවධානය යොමු වන්නේ මඳ වශයෙන් වන අතර ඔවුන් නියමිත සුදුසුකම් සපුරා ඇති නිසි පුහුණුවක් ලත් වෛද්‍ය නිලධාරීන්ද යන වග සොයා බැලීම නිසි බලධාරීන්ගේ වගකීමකි. ඒ සම්බන්ධයෙන් විධිමත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතු අතර විදේශයන්හි සිට පැමිණෙන වෛද්‍ය උපාධි ලත් පුද්ගලයන් නිත්‍ය වශයෙන් ඒ සඳහා සුදුසු පුද්ගලයන්ද යන වග සොයා බැලීම සඳහා ප්‍රමාණවත් රාජ්‍ය යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කළ යුතු වන්නේ එය සමස්ත වෛද්‍ය ක්ෂේත්‍රයේම වෘත්තීමය වටිනාකම සුරැකීමට සාමාන්‍ය රෝගී ජනතාවට ඉන් මුහුණ පෑමට සිදු වන අපහසුතාව මඟහරවා ලීමටය.

එමෙන්ම, වෛද්‍ය ක්ෂේත්‍රය භාවිතයෙන් පශ්චාත් උපාධි අවස්ථා බිහි කෙරේ. විදේශ රටවල වෛද්‍යවරුන් සඳහා පුළුල් පශ්චාත් උපාධි අවස්ථා පවතින අතර, බොහෝ රටවල්වල වෛද්‍යවරුන් හට සිය උපාධිය අවසන් වනවාත් සමඟම විශේෂඥ වෛද්‍යවරුන් වීමට පහසුකම් ඇත. ඇමෙරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය වැනි රටවල වෛද්‍යවරුන් සඳහා පුළුල් පශ්චාත් උපාධි අවස්ථාවන් පවතින බැවින් සියයට 90ක්ම වෛද්‍ය වෘත්තිකයන් හට කුමන හෝ අංශයක විශේෂඥ වෛද්‍යවරයෙක් වීමේ හැකියාවක් පවතී. නමුත් ශ්‍රී ලංකාවේ විශේෂඥ වෛද්‍යවරයෙක් වීමේ අවස්ථාව හිමි වන්නේ සියයට 15ක්, 20ක් වැනි සුළු ප්‍රමාණයකට පමණි. බොහොමයක් වෛද්‍යවරුන් හට තමන් සිය සේවයෙන් විශ්‍රාම ගන්නා තෙක් එම අවස්ථාව උදා කර ගැනීමට නොහැකි වේ. ඒ අනුව අපගේ වෛද්‍ය ක්ෂේත්‍රය තුළද වෛද්‍යවරුන් හට පවතින පශ්චාත් උපාධි අවස්ථා පුළුල් කිරීමට ක්‍රියා කළ යුතු අතරම ඒ තුළින්ද වඩා යහපත් විශේෂඥ සේවාවක් නිර්මාණය කර ගැනීමට අවස්ථාවක් උදා වේ.

මම මේ අවස්ථාවේදී කියන්නට කැමතියි, සෞඛ්‍ය සේවයේ වර්තමාන තත්ත්වය අනුව, පුද්ගලයින් 1,000කට තිබෙන ආරෝග්‍යශාලා සංඛ්‍යාව සියයට 3.4ක් පමණ වන බව. එක වෛද්‍යවරයකු සඳහා පුද්ගලයන් සංඛ්‍යාව 1462ක් වෙනවා. පුද්ගලයන් 10,000 කට හෙද සේවකයන් සංඛ්‍යාව සියයට 13.3ක් වෙනවා. සෞඛ්‍ය සඳහා රජයේ වියදම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් හැටියට බලන විට 13ක් වෙනවා. මෙවැනි අතිශය වැදගත් අපේ ක්ෂේත්‍රයක, වෘත්තියක, වෛද්‍යවරුන්ගේ තත්ත්වය පිළිබඳව -ඔවුන්ගේ සුදුසුකම් පිළිබඳව- අප මීට වඩා පැහැදිලි වැඩසටහනකට යා යුතු යයි කියන්න ඕනෑ. ඒ වාගේම විදේශයන්හි සිට වෛද්‍යවරුන් ලංකාවට පැමිණි විට ඔවුන් නැවත ලියා පදිංචි කර ගැනීමේ ක්‍රමවේදයක් තිබෙනවා.

It is the ERPM, the compulsory Examination for Registration to Practise Medicine in Sri Lanka or the Act 16 Examination Preparation Programme. The purpose of the ERPM Examination is to assess whether a candidate can approach medical practice with the appropriate intellectual skills of enquiry, clinical reasoning, critical thinking and decision-making, possessing sufficient knowledge of the basic and clinical sciences and an understanding of the underlying principles of scientific

method and the ability to create a differential diagnosis and rationalize a treatment plan for common clinical situations prevalent in Sri Lanka. For whom is the ERPM held? The ERPM or the ACT 16 Exam is for the medical graduates who have completed their medical degree from the medical faculties in foreign universities recognized by the Sri Lanka Medical Council.

මේ ක්‍රමය තුළින් පමණයි පිට රට උපාධියක්, පශ්චාත් උපාධියක් ගත්ත කෙනකුට මේ රටට ඇවිත් වෛද්‍ය වෘත්තියේ නියැලෙන්න පුළුවන්කම ලැබෙන්නේ. නමුත් වර්තමාන දත්ත අනුව වෘත්තීයමය වශයෙන් සුදුසුකම් තිබෙන පිරිසට වඩා විශාල පිරිසක්-දහස් ගණනක්- විශේෂයෙන් පෞද්ගලික අරෝග්‍යශාලාවල වෛද්‍ය වෘත්තියේ යෙදෙනවා. ඒ අයගේ වෘත්තීය දැනුම පිළිබඳ විශාල ගැටලුවක් තිබෙනවා. වර්තමාන තත්ත්වය අනුව ඉන්දියාවේදී අවුරුදු හතරහමාරක් වැනි කෙටි කාලයකින් කෙනකුගේ degree එක අවසාන කරන්න පුළුවන්. ඒ අවසාන කළ ගමන්ම ප්‍රායෝගික දැනුම - practical knowledge - ලබා ගන්න අවුරුදු දෙකක් වාගේ කාලයක් ගත කරන්න ඕනෑ, පශ්චාත් උපාධිය ලබා ගන්න. නමුත් ලංකාවට පැමිණියාට පස්සේ, ඒ අය ලබා ගත්ත උපාධිය පිළිගෙන, මාස නවයක් වැනි කාලයකට පසු වෛද්‍ය වෘත්තියේ නියැලෙන්නට අවස්ථාවක් ලබා දෙනවා. ලංකාවේ වෛද්‍ය වෘත්තියේ යෙදී සිටින කෙනකුට අවුරුදු 8ක විතර කාලයක් යනවා, පශ්චාත් උපාධියෙන් පසු වෛද්‍යවරයකු හැටියට වැඩ භාර ගන්න. ඒ නිසා මේ කාරණයේදී මීට වඩා හොඳ පාලනයක්, විධිමත් පාලනයක් තිබි යුතුය කියන එක නැවතත් මා ප්‍රකාශ කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම අපි ඉතා ගරු කරන, වෛද්‍ය වෘත්තියේ නියැලී සිටින අයගෙන් විශාල පිරිසක් වෘත්තීය සුදුසුකම් නැති, ව්‍යාජ සුදුසුකම් තිබෙන අය කියන මතය සමාජ ගත වුණොත් විශාල ප්‍රශ්නයක් ඇති වන බව මේ දත්ත අනුව අපට පැහැදිලි වෙනවා. ඒ අය දෙන අඩු තත්ත්වයේ ඇති බෙහෙත් - prescribe කරන බෙහෙත්- ජනතාව පාවිච්චි කිරීම නිසා අපේ සමාජයට විශාල හානියක් වෙන්න පුළුවන්. ඒ ගැන යම් කිසි පාලනයක් නොකළොත් එයින් සිදු වන විනාශය නවත්වා ගන්න ඊට වඩා විශාල මුදලක් රජයට, ඒ වාගේම ජන සමාජයට දරන්න සිද්ධ වෙනවා.

වෛද්‍ය වෘත්තීය ගැන පාර්ලිමේන්තුවේදී සංවාදශීලීව අදහස් පළ කරලා, වෛද්‍යවරුන්ගේ වෘත්තීය තත්ත්වය රැක ගැනීම සඳහා හඬක්, මතවාදයක් සමාජ ගත කරලා ඒ තුළින් ඉදිරියට යැමයි මෙම යෝජනාව ඉදිරිපත් කිරීමේ අරමුණ. අපේ වර්තමාන සෞඛ්‍ය ඇමතිතුමා වැඩ භාර ගන්න කලින් තමයි අපි මේ යෝජනාව ලැයිස්තු ගත කළේ, මේ පාර්ලිමේන්තුව තුළ කථිකාවක් ඇති කරන්නට. වර්තමානයේ අමාත්‍යාංශය ඒ වෙනුවෙන් ක්‍රියාත්මක වෙන බව මට දැන ගන්නට ලැබුණා.

ඒ කෙසේ වෙතත්, වෛද්‍ය වෘත්තියේ සහ වෛද්‍ය වෘත්තියට අදාළව තිබෙන අනෙකුත් සියලුම වෘත්තීන්වල නියැලෙන අයගේ වෙනත් වෘත්තීන්වල නියැලෙන අයගේ - ඉංජිනේරුවරයෙක් වන්නට පුළුවන්, ගණකාධිකාරිවරයෙකු වන්නට පුළුවන්, නීතිඥ මහත්මයෙක් වෙන්න පුළුවන්- වෘත්තීයමය තත්ත්වය සුරක්ෂිත වීමට මෙවැනි කථිකා තුළින් ඉඩ ප්‍රස්ථාව ලැබෙනවා.

සුදුසුකම් ඇති පුද්ගලයා සුදුස්සා බවට හඳුනා ගෙන, ඔවුන්ගේ වෘත්තිය සුරක්ෂිත කර දෙමින්, ඒ තුළින් ඔවුන්ගේ වෘත්තිය ඉතා ශ්‍රේෂ්ඨ අන්දමින් කර ගැනීමට අවස්ථාව ලබා දීම තමයි මේ යෝජනාවේ අරමුණ. ඒ නිසා මේ යෝජනාව සභාවට ඉදිරිපත් කරමින්, මේ සම්බන්ධව අදාළ අමාත්‍යාංශයේ විශේෂ අවධානය යොමු කරන මෙන් ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 3.15]

**ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) (திருமதி) சுதர்ஷினி பர்னாந்துபுள்ளே)
(The Hon. (Dr.) (Mrs.) Sudharshini Fernandopulle)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද ගරු තිලංග සුමතිපාල මන්ත්‍රීතුමා ඉතාම වැදගත් යෝජනාවක් ඉදිරිපත් කළා. එම යෝජනාව මම ඉතාමත් සංතෝෂයෙන් ස්ථිර කරනවා. විශේෂයෙන්ම අපේ රටේ සිටින දහස් සංඛ්‍යාත රෝගීන්ගේ ජීවිතවල සුරක්ෂිතභාවය තහවුරු කරන්නත්, රෝගීන්ට ලැබෙන සේවාවේ ගුණාත්මකභාවය වැඩිදියුණු කරන්නත්, ඒ වාගේම වෛද්‍ය වෘත්තිකයන්ට සුරක්ෂිතභාවයකින් සහ වැඩි වටිනාකමකින් යුක්තව තම වෘත්තිය කර ගැනීමට අවශ්‍ය පසුබිමක් සකස් කරන්නත් අවශ්‍ය යෝජනාවක් තමයි එතුමා ඉදිරිපත් කළේ. එය ඉතාම හොඳ යෝජනාවක් හැටියට මා දකිනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද මේ වෛද්‍ය ක්ෂේත්‍රයට ඇතුළු වෙන්න ලොකු තරගයක් තිබෙනවා. වෛද්‍ය ක්ෂේත්‍රය දේශීයව වාගේම ජාත්‍යන්තරවත් ලොකු පිළිගැනීමක් තිබෙන ක්ෂේත්‍රයක්. අද මේ ක්ෂේත්‍රයට ඇතුළු වෙන්න සුදුසුකම් ලබන්නේ ඉතාම සුළු පිරිසක්. මේ ක්ෂේත්‍රයට ඇතුළු වීමට නොහැකිව මේ ක්ෂේත්‍රය දිහා බලා ගෙන සුසුම් හෙළන අය ගොඩක් ඉන්නවා. අපි දන්නවා, මේ රටේ ඉන්න දක්ෂතම ශිෂ්‍යයන් තමයි වෛද්‍ය ක්ෂේත්‍රයට ඇතුළත් වෙන්නේ කියලා. වෛද්‍ය ක්ෂේත්‍රයට ඇතුළු වීමට නොහැකි වූ අයගේ ලොකු බලාපොරොත්තු කඩ වීමක් අපි දකිනවා. ඒ නිසා අද ඔවුන් විදේශ රටවලට හෝ ගිහිල්ලා, විශාල වශයෙන් මුදල් වියදම් කරලා වෛද්‍ය උපාධිය ලබා ගැනීමට කටයුතු කරනවා. මේ රටේ අහිංසක, අසරණ, දුප්පත් පවුල්වල දරුවන් පවා -තිබෙන දේවල් විකුණලා හෝ- පිට රට ගිහින් විදේශීය වෛද්‍ය උපාධිය ලබා ගැනීමට අද බොහෝවිට කටයුතු කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, වෛද්‍යවරයෙක් වුණාම, අද සමාජයේ ලොකු පිළිගැනීමක් තිබෙනවා. වෙනත් ක්ෂේත්‍රවල අය සමඟ බලන විට සාමාන්‍යයෙන් වෛද්‍යවරයාට සාධාරණ වැටුපක් ලැබෙනවා. පෞද්ගලික අංශයත් සමඟ බලන විට රජයෙන් එතරම් ලොකු වැටුපක් නොලැබුණත්, පෞද්ගලිකව වෛද්‍ය කටයුතුවල නියැලිලා වැඩි ආදායමක් උපයා ගන්න ලොකු අවස්ථාවක් ලැබිලා තිබෙනවා. ඒ වාගේම තීරු බදු සහන යටතේ වාහනයක් ගෙන්වා ගැනීම වාගේ විවිධ පහසුකම් මෙම වෛද්‍ය වෘත්තිකයන්ට තිබෙනවා. ඒ නිසා මේ වෘත්තිය සමාජයේ පිළිගැනීමකට ලක් වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද මම දේශපාලනයේ යම් තැනක ඉන්නවා නම්, වෛද්‍ය වෘත්තියට ඒ ගෞරවය හිමි කරන්න ඕනෑ. මගේ දේශපාලන පසුබිම සකස් කරන්න මගේ දිවංගත ස්වාමි පුරුෂයා හරහා ලැබුණ ආභාසය වාගේම වෛද්‍ය වෘත්තියෙන්ද මට විශාල පිටිවහලක් ලැබිලා තිබෙනවා. මගේ ස්වාමි පුරුෂයා මිය ගිය වෙලාවේ ඇති වුණ කම්පනය දරා ගැනීමටද වෛද්‍ය වෘත්තියෙන් මට ලොකු පිටිවහලක්, ලොකු ශක්තියක් ලැබුණා. ඒ වාගේම පෞරුෂත්වය වර්ධනය කර ගෙන ප්‍රජාවට සේවය කිරීමට අවශ්‍ය කරන ලොකු ශක්තියක් වෛද්‍ය වෘත්තියෙන් මට ලැබිලා තිබෙනවා. ඒ නිසා තමයි අද බොහෝ දෙනා මේ වෛද්‍ය වෘත්තියේ නියැලීමට කැමැත්තක් දක්වන්නේ. සුදුසුකම් ලබා ගත්ත අය වෛද්‍ය වෘත්තියේ නියැලෙනවා වාගේම, ඒ සුදුසුකම් නැති අයත් මේ ක්ෂේත්‍රයට පිවිසීමෙන් ක්ෂේත්‍රයට ලොකු අගෞරවයක් සිදු වෙලා තිබෙනවා. ඒ මඟින් අද ජනතාවට ලොකු අනතුරුදායක තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට කලින් කථා කරපු අපේ ගරු තිලංග සුමතිපාල මන්ත්‍රීතුමා කිව්වා වාගේම අද අපේ

[ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය]

රටේ රජයේ වෛද්‍යවරු හැටියට 14,000කට ආසන්න පිරිසක් ලියා පදිංචි වෙලා ඉන්නවා. ඒ වාගේම පෞද්ගලිකව වෛද්‍ය වෘත්තියේ නියැලෙන වෛද්‍යවරු 25,000කට ආසන්න සංඛ්‍යාවක් සිටිනවා. පිළිගත්ත විශ්වවිද්‍යාලයකින් අධ්‍යාපනය ලබලා, පුහුණු වෙලා, ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියා පදිංචි වෙලා, මේ රටේ වෛද්‍ය වෘත්තිකයකු හැටියට සේවය කරන්න අවශ්‍ය බලපත්‍රය තිබෙන අය 25,000ක් සිටිනවා. ඒ වාගේම බලපත්‍ර නොමැතිව, කිසිම සුදුසුකමක් නොමැතිව වෛද්‍ය වෘත්තියේ යෙදෙන අය 40,000ක් පමණ අද සමාජයේ ඉන්නවා. ඔවුන්ට නිසි දැනුමක් නැහැ. මේ නිසා අද රෝගීන්ගේ ජීවිත අනතුරට පත් වෙලා තිබෙනවා. සෞඛ්‍ය ක්ෂේත්‍රයේ වෙනත් අංශයක සේවය කරලා, විශේෂයෙන් ඖෂධවේදියෙක් හෝ සනීපාරක්ෂක කම්කරුවෙක් ලෙස සේවය කරලා, යම් කිසි අවබෝධයක් අරගෙන රෝගීන්ට ප්‍රතිකාර කරන අවස්ථා අපි දැකලා තිබෙනවා. නමුත් ඔවුන්ට රෝග හඳුනා ගන්න බැහැ; රෝගයට අවශ්‍ය ප්‍රතිකාරය, දෙන්න ඕනෑ බෙහෙත හරියට දන්නේ නැහැ; බෙහෙත දෙන්න ඕනෑ මාත්‍රාව දන්නේ නැහැ; බෙහෙත දෙන්න ඕනෑ වාර ගණන දන්නේ නැහැ. අපි දන්නා විධියට බොහෝ අය කෝකටත් තෛලයක් හැටියට steroids පාවිච්චි කරනවා; Prednisolone පාවිච්චි කරනවා. Prednisolone වලින් තාවකාලිකව ඉක්මනින් සුවය ලැබුණත් රෝගීන්ට දීර්ඝ කාලීනව නොයෙකුත් ලෙඩ රෝග ඇති වෙනවා. මේ නිසා රෝගීන්ගේ ජීවිත අද අවදානමකට ලක් වෙලා තිබෙනවා. අපි දන්නවා, කිලෝමීටර් 4ක්, 5ක් වාගේ දුරකින් අද රෝහලකට ළඟා වෙන්න පුළුවන්ය කියලා. ඒ වුණාට අපේ ජනතාවට දැනුවත්කමක් නැතිකම නිසා, විශේෂයෙන්ම දුෂ්කර පළාත්වල ඉන්න හුඟක් අහිංසක ජනතාව තමයි මේ වාගේ දේවල්වලට රැවටෙන්නේ. සුදුසුකම් නැති, පුහුණුව නොලත් වෛද්‍යවරුන් ළඟට යාම නිසා ඔවුන්ගේ ජීවිත අනතුරට පත් වූ අවස්ථා තිබෙනවා. ඔවුන් මරු මුවට පත් වූ අවස්ථා තිබෙනවා. සංකූලතා ඇති වූ අවස්ථා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට එක සිදු වීමක් මතකයි. මම කටාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි විධියට කටයුතු කළ කාලයේ මගේ ගෙදර සේවය කළ අයගේ දරුවා අසනීප වෙලා අරගෙන ගිහින් තිබෙන්නේ කිසිම සුදුසුකමක් නැති වෛද්‍යවරයෙකු ළඟටයි. ඔහු අධි මාත්‍රාවක් ලබා දීලා ඒ දරුවාට නොයෙකුත් සංකූලතා ආවා. ඒ සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව කටයුතු කරන්නත් අපට සිද්ධ වුණා. මේ කටයුතු කිරීමේදී නීතියේත් ලිහිල් බවක් තිබෙනවා. පොලීසියත් එක්ක ගිහිල්ලා එවැනි වෛද්‍යවරුන් අත් අඩංගුවට ගැනීමේ බලය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිට තිබෙනවා. ඒ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි ගිහිල්ලා ඔවුන්ව නීතිය ඉදිරියට ගෙනාවාම උසාවියෙන් ඔවුන්ට දඩයක් ගහනවා. ඔවුන් නැවත ගිහිල්ලා එම කටයුත්තේම නියැලෙනවා. එම නිසා මීට වඩා දැඩි නීතිරීති පමුණුවන්න ඕනෑ කියලා මම මේ අවස්ථාවේදී යෝජනා කරනවා.

මෙම යෝජනාව ඉතා කාලෝචිත යෝජනාවක් හැටියට අපි දකිනවා. මෙවැනි වෛද්‍යවරුන් නිසා සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සියලුම වෛද්‍ය වෘත්තිකයන්ට ලොකු අවමානයක් සිද්ධ වෙනවා. වෛද්‍ය වෘත්තිකයන් අතරත් සමහර විට ගැටලු, මතභේදකාරී අවස්ථා සිදු වුණත් බහුතරයක් වෛද්‍ය වෘත්තිකයන්ට මේ තුළින් ලොකු අසාධාරණයක් සිද්ධ වෙනවා. මොකද අපේ වෛද්‍ය ක්ෂේත්‍රය අද හොඳ ස්ථානයක තිබෙන බව අපි දන්නවා. සෞඛ්‍ය අමාත්‍යාංශයේ, පවුල් සෞඛ්‍ය කාර්යාංශයේ, ප්‍රජා වෛද්‍ය විශේෂඥ කපිල ජයරත්න මහතාගේ ලිපියක් ඊයේ "ඩේලි මිරර්" පුවත් පතේ පළ වී තිබුණා. ඒ ලිපියට අනුව ඔහු හඳුනා ගෙන තිබෙනවා, අද මිනිසුන්ගේ ආයු කාලය හුඟාක් වැඩියි කියලා. කාන්තාවන්ගේ ආයු කාලය අවුරුදු 80ක් වෙන කොට, පුරුෂයන්ගේ ආයු කාලය අවුරුදු 75ක් දක්වා වැඩි වෙලා තිබෙනවා. ඒ වාගේම තමයි මාතෘ මරණ අනුපාතිකයත්. සජීවී ළදරු උපත් ලක්ෂයකට 31ක් දක්වා අඩු වෙලා තිබෙනවා. මේක තමයි දකුණු ආසියාතික කලාපයේ හොඳම අගය. ඒ වාගේම ළදරු මරණ අනුපාතිකය හුඟක් අඩු වෙලා තිබෙනවා. මේ දත්ත අපට ළඟා කර ගන්න මේ වෛද්‍ය ක්ෂේත්‍රයේ ඉන්න අය ලොකු කැපවීමක් කරලා තිබෙනවා. ඒ නිසා පුහුණුවක් නැති, සුදුසුකම් නොලත් අය සේවය කිරීම නිසා හොඳින් සේවය කරන වෛද්‍ය වෘත්තිකයන්ට විශාල අසාධාරණයක් සිදු වෙනවාය කියන එක මා මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ. ඒ නිසා අපි මේ අය අඩු කරනවා වාගේම ඔවුන්ට විරුද්ධව නීතිමය වශයෙන් කටයුතු කරන්න ඕනෑ. ඒ සඳහා මීට වඩා දැඩි නීතිරීති පනවන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, තවත් කොටසක් ඉන්නවා. ඒ අය ගැනත් මා මේ අවස්ථාවේදී සඳහන් කරන්න ඕනෑ. විදේශවලින් සුදුසුකම් ලබලා විදේශවල සේවය කරන සමහර වෛද්‍යවරුන් අද පෞද්ගලික රෝහල්වලට ඇවිල්ලා සේවය කරනවා. ඔවුන්ට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියා පදිංචියක් නැහැ. මේ අය රෝගවලට ප්‍රතිකාර කරලා සුමානයකින් ආපහු විදේශ රටවලට යනවා. කිසිම වගකීමක් නැහැ. මේ අය නිසාත් රෝගීන්ගේ ජීවිත අනතුරට පත් වී තිබෙන බව මා මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ. ඔවුන් මේ රටට ඇවිල්ලා රෝගීන්ට ප්‍රතිකාර කරනවා නම් තාවකාලිකව හෝ වෛද්‍ය සභාවේ ලියා පදිංචි වීම අනිවාර්යය කළ යුතු බව මම මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ. එහෙම නැත්නම් මේ රටේ සෞඛ්‍ය ක්ෂේත්‍රය වෙනුවෙන් දුෂ්කර පළාත්වලට ගිහිල්ලා සේවය කරපු සහ ඒ සේවය කරන වෛද්‍යවරුන්ට එයින් ලොකු අසාධාරණයක් සිදු වන බවත් මා මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ.

අපේ ගරු තිලංග සුමතිපාල මන්ත්‍රීතුමා සඳහන් කළා, අද අපේ රටේ මිනිසුන් 1,462ට එක් වෛද්‍යවරයෙකු බැගින් හිටියත් එහි විෂමතාවක් තිබෙනවා කියලා. පැතිරීමේ භූගෝලීය විෂමතාවක් තිබෙනවා. බොහෝ වෛද්‍යවරුන් බස්නාහිර පළාතට කොටු වෙලා ඉන්නවා. අනෙක් පළාත් ගැන බලන කොට ඒ වෛද්‍යවරයෙකු සේවය කරන ජනගහනය ඊට වඩා වැඩියි. ඒ නිසා අපි ඒ පැතිරීමත් මීට වඩා විධිමත් කරනවා නම්, මේ වාගේ නූගත්, කිසිම සුදුසුකමක් නැති හොර වෛද්‍යවරුන්ට සේවය කිරීමේ ඉඩ කඩ ඇහිරිලා යනවා කියන එකත් මේ අවස්ථාවේ මතක් කරන්න ඕනෑ.

අපි මේ රටේ ජනතාවට නොමිලයේ ගුණාත්මක වෛද්‍ය සේවාවක් ලබා දෙන වකවානුවක, ඒ වාගේම දකුණු ආසියාතික කලාපයේම වෛද්‍ය ක්ෂේත්‍රයේ ඉදිරියෙන්ම ඉන්න රටක් හැටියට අපේ රටේ වෛද්‍ය ක්ෂේත්‍රයේ නියැලී සිටින වෛද්‍යවරුන්ගේ ගුණාත්මකභාවය ඉහළ දැමීමට අද ගරු තිලංග සුමතිපාල මන්ත්‍රීතුමා ඉදිරිපත් කරන ලද මේ යෝජනාව හුඟාක් ඉවහල්වන බව මා මතක් කර සිටිනවා. අද මේ රටේ ඕනෑම වෛද්‍යවරයෙකුට ඕනෑම තැනකට යන්න පුළුවන්, යොමු කිරීමේ ක්‍රමවේදයක් නැහැ.

Referral System එකක් නැහැ. ඕනෑම ග්‍රාමීය පළාතක කෙනෙකුට රටේ ඕනෑම තැනකට ගිහිල්ලා විශේෂඥ වෛද්‍යවරයෙක් හමු වන්න පුළුවන්. ඒකෙ එක හොඳ පැත්තක් තිබෙනවා. තමන්ට ඕනෑ වෛද්‍යවරයා හමු වන්න පුළුවන්. ඕනෑම වෙලාවක ගිහිල්ලා මුදල් බැඳලා ඔහුව පෞද්ගලිකව හමු වන්න පුළුවන්. එහෙම නැත්නම් තමන්ට අවශ්‍ය රෝහලට ගිහිල්ලා අදාළ සායනයට යොමු කිරීමක් කරගෙන අවශ්‍ය විශේෂඥ වෛද්‍යවරයාව හමු වන්න පුළුවන්. නමුත් එහි ගැටලුවක් තිබෙනවා. මොකද, අනවශ්‍ය ලෙස තදබදයක් ඇති වෙනවා. සමහර රෝහල්වල ජනගහනය වැඩි නිසා තදබදය හුඟක් වැඩි වෙනවා. ඒ වාගේම ග්‍රාමීය හා දිස්ත්‍රික් රෝහල්වල තිබෙන සේවාව අවතක්සේරු වෙලා තිබෙනවා. ඒ සඳහා රජය වැය කරන මුදලින් උපරිම ප්‍රයෝජන ගන්න බැරි තත්ත්වයකට අද පත් වෙලා

තිබෙනවා. ඒ නිසා වෛද්‍යවරුන් වෙත යොමු කිරීමේ ක්‍රමවේදයක් යම්තාක් දුරකට මේ රටේ ස්ථාපිත කරනවා නම් සමහර රෝහල්වල තිබෙන අධික තදබදය අවම කිරීමට පුළුවන් වන බව මතක් කරමින්, ගරු තිලංග සුමතිපාල මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද මෙම ඉතාම වැදගත් යෝජනාවට සියයට සියයක්ම එකඟතාව පළ කරනවා.

මේ රටේ පුහුණුව නොලත් වෛද්‍යවරුන් සම්පූර්ණයෙන්ම ඉවත් කරන්න අනිවාර්යයෙන්ම කටයුතු කළ යුතු වෙනවා. වෛද්‍යවරුන්ට තම වෘත්තියේ ගෞරවය රැක ගනිමින් රෝගීන්ගේ ජීවිතවල සුරක්ෂිතභාවය සහ ආරක්ෂාව තහවුරු කිරීමට මෙම ගරු මන්ත්‍රීතුමා විසින් ගෙන එන ලද මෙම යෝජනාව ස්ථිර කරමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසන් කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

[අ.භා. 3.27]

**ගරු වෛද්‍ය රෝහණ පුෂ්ප කුමාර මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ரோஹண புஷ்பகுமார)
(The Hon. (Dr.) Rohana Pushpa Kumara)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු තිලංග සුමතිපාල මන්ත්‍රීතුමා අද මේ රටේ ජනතාවගේ සෞඛ්‍ය සේවාවට කෙළින්ම බලපාන ගැටලුවක් පිළිබඳව කාලීන හා වැදගත් යෝජනාවක් ගෙන ආවා කියලා තමයි මම හිතන්නේ. ඒකට ප්‍රධාන හේතුවක් තිබෙනවා. කාලීන වටිනාකම ගැන මම කථා කරන්නේ, මීට අවුරුදු 30කට, 40කට ඉස්සෙල්ලා මේ රටේ සෞඛ්‍ය ක්ෂේත්‍රයත් අද මේ රටේ සෞඛ්‍ය ක්ෂේත්‍රයත් අතර අහසට පොළොව වගේ වෙනසක් තිබෙනවා. ඒකට උදාහරණයක් තමයි, අද අපි මේ විෂය තුළ විශේෂයෙන්ම කථා කරන සුදුසුකම් නැති වෛද්‍යවරුන් හරහා මේ රටේ ජීවත් වන අහිංසක දෙමව්පියන්ට, සහෝදර සහෝදරියන්ට, දූවා දරුවන්ට සිදු වන අසාධාරණය.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එක පැත්තකින් සෞඛ්‍ය ක්ෂේත්‍රය ගැන කථා කරන කොට මේ යෝජනාව කාලීනයි කියලා කියන්නේ මෙන්න මේ නිසයි. ඔබතුමාත්, මෙතැන ඉන්න බොහෝ අයත් මේ කාරණය දන්නවා ඇති. එදා මේ රටේ සෞඛ්‍ය ක්ෂේත්‍රය තුළ වෛද්‍යවරු විධියට කණ්ඩායම් කිහිපයක් සිටියා. ඒ කණ්ඩායම් කිහිපය ගැන කථා කරන කොට, විශේෂයෙන්ම අපි AMP කියලා කණ්ඩායමක් ගැන කථා කරනවා. එහෙම නැත්නම් apothecary කියලා කණ්ඩායමක් ගැන කථා කරනවා. ඊ ළඟට ඒ අය යම් කිසි ස්ථාවරභාවයකට ආවාම RMPලා බවට පත් වුණා. ඒ කියන්නේ Registered Medical Practitionersලා බවට පත් වුණා. ඒ කියන්නේ ඒ කාලයේ MBBS වෛද්‍යවරුන්ගේ හිඟයත් එක්ක කෙටි කාලීන දැනුමක් ලබා දුන් වෛද්‍ය කණ්ඩායමක් තමයි මේ රටේ ප්‍රායෝගික, එහෙම නැත්නම් ග්‍රාමීය මට්ටමේ වෛද්‍ය වෘත්තිය කරමින් මේ රටේ ජනතාවට මෙහෙවරක් කළේ. මම MBBS වෛද්‍යවරයකු වුණත් පසු ගිය කාලයේ ඌව පළාත් සභාවේ හිටපු සෞඛ්‍ය අමාත්‍යවරයා විධියට අගය කරපු දෙයක් තමයි, මේ රටේ වෛද්‍ය ක්ෂේත්‍රයේ MBBS, එහෙම නැත්නම් පශ්චාත් උපාධි වෛද්‍යවරුන් බිහි වන තාක් මේ රටේ අහිංසක ජනතාවට වෛද්‍ය ක්ෂේත්‍රයේ මෙහෙවර කළ එම AMPලා, RMPලා කියන වෛද්‍ය කණ්ඩායම. ඔවුන් MBBS වෛද්‍යවරුන් තරම් අවුරුදු 5ක පුහුණුවක් නොලැබුවත්, ඔවුන් කරපු සේවාව මේ අවස්ථාවේ සිහිපත් කිරීම වෛද්‍යවරයෙක් ලෙස මගේ යුතුකමක් විධියට මම දකිනවා. මොකද, මේ වෛද්‍ය ක්ෂේත්‍රය ඇදගෙන යන්න, මේ රටේ සෞඛ්‍ය ක්ෂේත්‍රය ඇදගෙන යන්න ප්‍රායෝගිකව කටයුතු කරපු වෛද්‍ය කණ්ඩායමක් තමයි AMP සහ RMP කියන වෛද්‍ය කණ්ඩායම. මම ඌව පළාත් සභාවේ සෞඛ්‍ය අමාත්‍යවරයා වශයෙන් කටයුතු කළ කාලයේ එම වෛද්‍ය කණ්ඩායමට ස්තුති කළා වාගේම, මෙම ගරුතර පාර්ලිමේන්තුවේදීත් ඔවුන්ගේ සේවය ඇගැයීමට ලක් කිරීමට අවස්ථාවක් ලැබීම පිළිබඳව මා අද සන්තෝෂ වෙනවා.

අපට අමතක කරන්න බැහැ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, වතුකරයේ සෞඛ්‍ය ක්ෂේත්‍රය. ඇත්තටම වතුකරයේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ හිටියේ EMA - Estate Medical Assistants - ලා. මා හිතන විධියට ඒ ගොල්ලන්ට වෛද්‍යවරයකුට තිබෙන කිසිම සුදුසුකම් තිබුණේ නැහැ. ඒ ගොල්ලන්ට තිබුණේ පැනඩෝල් වාගේ බෙහෙත් ටිකක් දෙන්න විතරයි. එහෙම නැත්නම්, අද අපි කථා කරන රෝහලක ඉන්න pharmacist කෙනකුගේ දැනුම විතරයි තිබුණේ. ඉතින් ඒ කාලයේ මේ EMAලා හරහා තමයි වතුකරයේ සෞඛ්‍ය සේවය ගෙන ගියේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද ඌව පළාත් සභාව ගත්තාම කියන්න සන්තෝෂයි, මම එහි අමාත්‍යවරයාව හිටපු කාලයේ එවකට හිටපු අපේ සෞඛ්‍ය අමාත්‍ය ගරු නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමාගේ මැදිහත් වීම සහ රජයේ මැදිහත් වීම තුළ ඒ වතුකරයේ තිබුණු ඒ සෞඛ්‍ය ක්‍රමවේදය වෙනස් කරලා අද රෝහල් 30කට වැඩි සංඛ්‍යාවක් වතුකරයට ලබා දීලා, MBBS වෛද්‍යවරු පත් කරන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒ නිසා මා කියාගෙන ආවේ, සෞඛ්‍ය ක්ෂේත්‍රයේ අපි හිටපු තැන ඉඳලා ඉදිරියට ඇවිත් අද වන කොට මේ සමාජයට අවශ්‍ය, ගැළපෙන, බුද්ධිමත් වෛද්‍යවරු කණ්ඩායමක් මේ රජය තුළින් බිහි කරලා තියෙනවා කියන එකයි. නමුත් දැන් අපට තවත් ගැටලුවක් තිබෙනවා. එනම් මෙවැනි සුදුසුකම් තිබෙන වෛද්‍යවරුන් සිටියදී, සුදුසුකම් නැති වෛද්‍යවරුන් හරහා මේ රටේ සෞඛ්‍ය ක්ෂේත්‍රයට, සමාජයට තව දුරටත් අසාධාරණයක් වනවාද කියන එක. ඒ නිසා අපේ ගරු තිලංග සුමතිපාල මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව හරහා සෞඛ්‍ය අමාත්‍යාංශය, රජය යම් කිසි ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීමේ වටිනාකම තමයි මේ අවස්ථාවේදී මතක් කරන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම අපේ ගරු වෛද්‍ය සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මන්ත්‍රීතුමියත් පැහැදිලි කළා, අද මේ රටට අවශ්‍ය වෛද්‍යවරුන් බිහි වීමේදී, මේ රටේ ඉන්න උගතුන් අතරින් කොච්චර සුළු සංඛ්‍යාවක්ද මේ ක්ෂේත්‍රයට එන්නේ කියන එක. අනෙක් පැත්තෙන් ගත්තාම ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ රටේ විශ්වවිද්‍යාලවලින් පිට වන - වෛද්‍ය අංශයෙන් වෙන්න පුළුවන්, ඉංජිනේරු අංශයෙන් වෙන්න පුළුවන්; කලා අංශයෙන් වෙන්න පුළුවන්; එහෙම නැත්නම් commerce; අංශයෙන් වෙන්න පුළුවන්; මේ ඕනෑම ක්ෂේත්‍රයකම වෙන්න පුළුවන්- දරුවන්ගේ බුද්ධිය අතින් බැලුවාම, වෙනත් කිසිම රටක විශ්වවිද්‍යාලයකින් ගන්න උපාධියකට කිට්ටු කරන්න පුළුවන් කියලා මා හිතන්නේ නැහැ. ඒ නිසා ඉතාමත් දක්ෂ වෛද්‍යවරු කණ්ඩායමක්, ඉංජිනේරුවරු කණ්ඩායමක් වාගේම නොයෙක් ක්ෂේත්‍රවලට දක්ෂයන් බිහි කරන විශ්වවිද්‍යාල පද්ධතියක් තමයි අපේ ලංකාවේ තියෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, බොහෝ රටවල රෝහල්වල පවා අද ඉන්න සමහර විශේෂඥයින්, එහෙම නැත්නම් ඒ රෝහල් භාරව ඉන්න විශේෂඥයින් අපේ ලංකාවෙන් ගිය අය. ඒ නිසා අපට මේ රටේ සෞඛ්‍ය සේවාව නිවැරදි ආකාරයෙන් ගෙන යන්න පුළුවන් පද්ධතියක් සකස් වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඊළඟට අපට අමතක කරන්න බැරි තවත් කාරණයක් තිබෙනවා. අද පත්තරයක් අරගෙන බැලුවොත් වෛද්‍යවරුන් 500ක් විතර ඉන්නවා වෙළෙඳ දැන්වීම්වල. අපි කොයි වෙලාවකවත් බලලා තිබෙනවාද මොවුන්ගේ සුදුසුකම් ගැන. ඇදුම රෝගයට ප්‍රතිකාර කරනවා; නිවිටාවට සනීප කරනවා; ඇඟේ තිබෙන සුදු හම කළු කරලා දෙනවා; ඊළඟට මම වාගේ කොණ්ඩය නැති අයට කොණ්ඩය අරගෙන දෙනවා; මේ විධියට තිබෙනවා. අඩුම ගණනේ පත්තරේ

[ගරු වෛද්‍ය රෝහණ පුෂ්ප කුමාර මහතා]

වෙළෙඳ දැන්වීම් කරන, "වෛද්‍යවරු" කියලා නම් කරන අයට සැබැවින්ම ඒ අත් දැකීම් සහ ඒ සුදුසුකම් තිබෙනවාද කියන එක අපි විමර්ශනය කරලා නැහැ. අපේ ගරු සෞඛ්‍ය නියෝජ්‍ය ඇමතිතුමා මේ අවස්ථාවේ ඉන්නවා. මා මෙය එතුමාගේ අවධානයට යොමු කරන්න කැමැතියි. අපි ඒ පිළිබඳව යම් කිසි සැලැස්මක් සකස් කරන්න ඕනෑ. මා හිතන විධියට අපේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සුදුසුකම් නැති වෛද්‍යවරු පරීක්ෂා කරන්න ක්‍රමවේදයක් නැතිව නොවෙයි. ක්‍රමවේදයක් තියෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම ඉස්සෙල්ලාම 1985 මොනරාගල දිස්ත්‍රික්කයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි විධියටයි පත් වුණේ. එදා මොනරාගල දිස්ත්‍රික්කය සඳහා හිටපු එකම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතුමා මම. අද ඒ ක්ෂේත්‍රය කඩලා වෛද්‍යවරු 09 දෙනෙක් ඉන්නවා. ඒ දවස්වල මා වෛද්‍යවරයකු වාගේම මට තාරුණ්‍යයේ හයියත් තිබුණා. ඒ වාගේම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතුමාට තමයි ඒ ප්‍රදේශයේ ඉන්න වෛද්‍යවරුන් පිළිබඳව එහෙම නැත්නම් සෞඛ්‍යයට සම්බන්ධ වෙළෙඳ සැල් පිළිබඳව පරීක්ෂා කිරීමේ වගකීම, බලය තියෙන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඔබතුමා විශ්වාස කරන්න, මම ගිහිල්ලා මාසයක් දෙකක් ඇතුළත මොනරාගල දිස්ත්‍රික්කයේ ප්‍රසිද්ධ තැනක එක්තරා වෛද්‍යවරයෙක් කෙනෙක් කරන ලද කටයුත්තක් සම්බන්ධයෙන් පරීක්ෂා කරන්න මම ගියා. ඇත්තටම මට ආරංචියක් ආවා, එතැන ගබ්සා කිරීම් කරනවා කියලා. ඒක පරීක්ෂා කරන්නයි මා ගියේ. ගිහිල්ලා බලන කොට ඒ වෛද්‍යවරයාට කිසිම සුදුසුකමක් තිබුණේ නැහැ. මම වහාම ඒ ගැන පරීක්ෂණයක් කරලා මට ඉහළ ඉන්න නිලධාරියාට- මගේ superior officerට - නියෝජ්‍ය පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂතුමාට දැනුම් දුන්නා. හැබැයි, ඒක දැනුම් දෙන කොටම මට ආපු පණිවිඩය මොකක්ද? මට ආපු පණිවිඩය තමයි, "ඔබතුමාට මොණරාගල දිස්ත්‍රික්කයේ වැඩ කරන්න ඕනෑ නම් මේ කටයුත්ත සම්පූර්ණයෙන් නවත්වන්න" කියන එක.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ රටේ නීතිය ක්‍රියාත්මක කරන ක්‍රමවේදයට යම්කිසි ආකාරයක බලපෑමක් එනවා නම්, අපේ ගරු තිලංග සුමතිපාල මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව කවදාවත් ක්‍රියාත්මක කරන්න බැහැ. මේක තමයි ඇත්ත කථාව. මම ඒක ප්‍රායෝගිකව දැක්කා. සමහර වෙලාවට දේශපාලනඥයින් හරහා බලපෑම් එනවා. එහෙම නැත්නම් ඒ ප්‍රදේශයේ ඉන්න මුදලාලිලා හරහා බලපෑම් එනවා. මොකද, මොවුන්ගෙන් ප්‍රයෝජන ගත්ත අය ඉන්නවා. මේ රටේ ගබ්සා කරන මධ්‍යස්ථානවලින් ප්‍රයෝජන ගත්ත බොහෝ අය ඉන්නවා. ඒ නිසා නීතිය ක්‍රියාත්මක වන විට, ඔවුන්ට පණිවිඩ දෙන කොට ඔවුන්ට මේවා වහන්න වෙනවා. ඒ නිසා පෞද්ගලික වෛද්‍ය ක්ෂේත්‍රය තුළ ඉන්න quacksලා, එහෙම නැත්නම් හොර දොස්තරවරු වෙනුවෙන් නීතිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රශ්නයක් තිබෙනවා. ඒ එක්කම මට තවත් කාරණයක් මතක් වනවා. මේක වෛද්‍ය වෘත්තියට සම්බන්ධ නොවුණත් ඒ ගැන කියන්න ඕනෑ. මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු ගත්තාමත් ඒ වාගේම තමයි. මහියංගනය ප්‍රදේශයේ මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරිතුමා කඩයකට ගිහිල්ලා ඒ කඩය පිරිසිදුව තියන්න කියලා කිව්වාම, එතුමාට මරණ තර්ජන ආවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ නිසා මේක ඉතාමත් වැදගත් මාතෘකාවක්. නමුත් ක්‍රියාත්මක කිරීමේ දී යම්කිසි ගැටලු තිබෙනවා. ඒ නිසා මේක කෙරෙන්න ඕනෑ කොයි ආකාරයෙන්ද කියන එක ගැන ලොකු අධීක්ෂණයක් කරන්න ඕනෑ. මේ සඳහා ක්‍රමවේදයක් නැතිවා නොවෙයි. මේ ක්‍රමවේදය ක්‍රියාත්මක කරන්න තිබෙන පහසුකම් ප්‍රමාණවත් නැහැ. ඒ වාගේම අයුතු බලපෑම් එල්ල වෙනවා. මම දන්න තරමට, අපේ ගරු සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා දන්නවා ඇති, මේ වන විට සෑම ප්‍රදේශයකම ඉන්න වෛද්‍යවරු හඳුනා ගැනීමේ ක්‍රමවේදයක් සෞඛ්‍ය අමාත්‍යාංශය ක්‍රියාත්මක කර තිබෙන බව. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මම නිවැරදි නම්, ඒ සඳහා ආවේ පොලිස් නිලධාරින්. මෙයට මාස දෙක තුනකට ඉස්සර වෙලා එවැනි වැඩ සටහන් ක්‍රියාත්මක වුණා. මේක ඉතාමත් වැදගත් ක්‍රියාවන් විධියට මම දකිනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු වෛද්‍ය සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ මන්ත්‍රීතුමිය කථා කළා prednisolone කියන ඖෂධය ගැන. ඇඟ මහත් කර ගන්න ඕනෑ නම් ඒ සඳහා කොළඹ ප්‍රදේශයේ විශේෂඥ වෛද්‍යවරයෙක් හිටියා. ඒ ගැන ගරු මන්ත්‍රීතුමියත් දන්නවා ඇති. ඒ ඇඟ මහත් කරන්න දෙන බෙහෙත්වලත් තිබුණේ prednisolone කියන ඖෂධයයි. Prednisolone දිගටම පාවිච්චි කරන කොට puffiness, ඒ කියන්නේ ඇඟ මහත්වීමක් නොවෙයි, ඇඟ ඉදිමීමක් සිදු වනවා. මම හිතන්නේ මේක පුවත් පත්වලත් පළ වුණා. මෙවැනි වෛද්‍යවරු ඉන්නවා. ඒ නිසා වෘත්තීයමය වෛද්‍යවරුන්ගේ වෘත්තීය වටිනාකම වාගේම, මේ රටේ ජීවත් වන අහිංසක දුප්පත් ජනතාවගේ සෞඛ්‍ය ආරක්ෂා කිරීම සඳහා මේ යෝජනාව ඉතාමත්ම වැදගත් වනවා කියන එක අමුතුවෙන් කියන්න අවශ්‍යතාවක් නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ ක්‍රමවේදය සකස් කිරීමේ දී ඇති වන ප්‍රායෝගික ගැටලු අපි දකිනවා. ඒ නිසා ගරු සෞඛ්‍ය අමාත්‍යතුමා, ගරු සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා ඇතුළු රජය මේ ක්‍රමවේදය නිවැරදි ආකාරයට සකස් කළොත් නොමිලයේ දෙන සෞඛ්‍ය පහසුකම් හරහා රටේ ජනතාවට ලබා දෙන සේවාව මීට වඩා ඇගයීමක් වන අතර, රෝගීන්ට බාධාවක් නොවන ආකාරයට, අකටයුත්තක් නොවන ආකාරයට සකස් කර ගන්න හැකියාවක් තිබෙනවාය කියන එක ප්‍රකාශ කරමින්, මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාටත්, විශේෂයෙන්ම මෙම යෝජනාව ගෙන ඒම සම්බන්ධයෙන් අපේ ගරු තිලංග සුමතිපාල මන්ත්‍රීතුමාටත් මගේ ස්තුතිය පුද කරනවා.

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, මේ රටේ පැවති යුද්ධය අවසන් කරලා රට සංවර්ධනය කරනවා වාගේම, සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ඉතාම වැදගත් විෂයයක් විධියට සලකලා මේ කටයුත්ත ක්‍රියාත්මක කිරීම සඳහා යම්කිසි ක්‍රියා මාර්ගයක් සකස් කරන්න. වෛද්‍යවරු විධියටත්, මන්ත්‍රීවරු විධියටත් ඒ සඳහා අපි නිරන්තරයෙන්ම ඔබතුමන්ලාත් එක්ක ඉන්නවාය කියන එක මතක් කරමින්, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව නැවත වරක් ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වනවා.

[අ.භා. 3.40]

**ගරු ලලිත් දිසානායක මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு லலித் திசாநாயக்க - சுகாதார பிரதி அமைச்சர்)

(The Hon. Lalith Dissanayake - Deputy Minister of Health)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් විධියට ගරු තිලංග සුමතිපාල මන්ත්‍රීතුමා වෛද්‍ය ක්ෂේත්‍රයට සම්බන්ධ යෝජනාවක් ඉදිරිපත් කළා.

ඇත්තෙන්ම වෛද්‍ය වෘත්තිය කියලා කියන්නේ වෘත්තීන් අතරින් උතුම් වෘත්තියක්. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ හැම වෘත්තියකටම මේ සමාජ ක්‍රමය තුළ duplicate එකක් තිබෙනවා. ඒක සාමාන්‍යයෙන් ඉතිහාසයේ -රජ කාලයේ- ඉඳලා එන දෙයක්. ඕනෑ එකකට duplicate එකක් තියෙනවා. ඒ කියන්නේ original එකත් එක්කම duplicate එකක් තියෙනවා. ඒක සාමාන්‍ය දෙයක්. වෛද්‍ය වෘත්තියටත් original, duplicate කියලා දෙකක් සම්බන්ධ වීම තමයි මම හිතන්නේ තිලංග සුමතිපාල ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාවට මූලික හේතුව වෙලා තියෙන්නේ.

ඇත්තෙන්ම අද ලංකාව ගත්තාම අපි සතුටු වන්න ඕනෑ, නියම - original - වෛද්‍යවරයා ගැන. මේ නියම වෛද්‍යවරයා අපි බිහි කරන්නේ නිදහස් අධ්‍යාපනය තුළින්. ඒ කියන්නේ මේ රටේ අධ්‍යාපන ක්‍රමය තුළ වෛද්‍යවරයෙක් වීම සඳහා තඹ ශතයක්වත් ගෙවන්න අවශ්‍යතාවක් නැහැ. ඒ වාගේම නියම ප්‍රමිතියට ගුණාත්මක හොඳ වෛද්‍යවරයෙක් බිහි වෙන්න අද තියෙන විශ්වවිද්‍යාල පද්ධතිය හේතු වනවා කියන එක අපි කියන්න ඕනෑ. අපේ වෛද්‍යවරුන්ගේ ගුණාත්මක භාවය රැඳිලා තියෙන්නේ එතැනයි. උගත් විද්වත් මණ්ඩලයක් සහ විශ්වවිද්‍යාල පද්ධතිය මේ සඳහා යොමු වනවාය කියන එක මා කියන්න ඕනෑ. ඒ වාගේම රජයට අපි ස්තුතිවන්ත වන්න ඕනෑ. නිදහස් අධ්‍යාපනයෙන් බිහි වන වෛද්‍යවරයා අනිවාර්යයෙන් රජයට සේවය කරන්න ඕනෑ කියලා කලින් නීති තිබුණා. නමුත් ඒ නීති දැන් නැති වෙලා ගිහිල්ලා ස්වාධීනත්වයක් ඇති වෙලා තියෙනවා. නිකම් ඉගැන්වුවා කියලා කිසිම වෛද්‍යවරයෙක් මේ රටේ රාජ්‍ය සේවය තුළම තියා ගන්න නීතියක් නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම "වෛද්‍ය ක්ෂේත්‍රයේ වෘත්තීමය වටිනාකම සුරැකීම" නමැති යෝජනාවේ නීතිමය පැත්ත සම්බන්ධයෙන් පොඩි ප්‍රශ්නයක් තියෙනවා. බටහිර වෛද්‍ය ක්‍රමය නොමැති කාලයේ ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපට ප්‍රතිකාර කළේ ගමේ වෛද්‍යවරු; ආයුර්වේද වෛද්‍යවරු. මේ ආයුර්වේද වෛද්‍ය ක්‍රමය අද වෛද්‍ය ක්ෂේත්‍රය තුළ තියෙනවා. හැබැයි ගරු තිලංග සුමතිපාල මන්ත්‍රීතුමා මෙතැනදී අදහස් කරන්නේ බටහිර වෛද්‍ය ක්‍රමය විතරයි කියන එකයි මම දකින්නේ. මොකද මේ යෝජනාවේ තියෙන්නේ වෛද්‍ය ක්ෂේත්‍රයේ වෘත්තීමය වටිනාකම සුරැකීම පිළිබඳවයි. ගමේ වෙද මහත්තයා ගාවට යන්නේ බෙහෙත් ගන්න. මම පුංචි කාලයේ ගෙදර හිටපු සුරතල් බල්ලා මගේ වම් අත හපා කෑවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මගේ දෙමවුපියෝ බටහිර වෛද්‍යවරයෙක් ගාවට මාව එක්ක ගෙන ගියේ නැහැ. මගේම ගෙට උඩින් හිටිය සීයා කෙනෙකුගෙන් තමයි ප්‍රතිකාර ගත්තේ. මට සුව වුණා. දෙවියන්ගේ පිහිටෙන් අදටත් මට පුහුල් කන්න පුළුවන්. ඕනෑ දෙයක් කන්න පුළුවන්. පිස්සු හැදෙන්නේ නැහැ. ඒ සිංහල බෙහෙත් ක්‍රමය. පුංචි කාලයේ ඇඟේ සුදක්, නගනයක් ආවාම වද නැට්ටකින් කපලා සුව කරන්න තරම් අපේ දේශීය වෛද්‍ය ක්‍රමය දියුණු වෙලා තිබුණා. ඒක දේශීය වෛද්‍ය ක්‍රමය. හැබැයි නීතියක් තිබුණේ නැහැ. මට ප්‍රතිකාර කළ අපේ සීයා ලියා පදිංචි වෙලා තිබුණේ නැහැ.

අපේ ගමේ කාට හරි සර්පයෙක් කෑවොත් එක්ක යන්නේ දේශීය වෛද්‍යවරයෙක් ළඟටයි. මේ රටේ තවම ඒ ක්‍රමය තියෙනවා. එතකොට ඒ වෛද්‍යවරයා එන පුද්ගලයාගේ ස්වභාවය බලලා කාපු සතා පිළිබඳ නිගමනයකට එනවා. මේක බටහිර වෛද්‍ය ක්‍රමයට ගියාමත් අවශ්‍ය වනවා. සර්පයෙක් කෑවාම අද බටහිර වෛද්‍ය ක්‍රමයට අනුව anti-venom කියන බෙහෙත තමයි දෙන්නේ. හැබැයි anti-venom එක දෙන්න අනිවාර්යයෙන්ම සර්පයා හරියට හඳුනා ගන්න ඕනෑ. මොකද විසෙන් විස නසන ප්‍රතිපත්තියේදී අනිවාර්යයෙන්ම ඒ සර්පයා හඳුනා ගන්න ඕනෑ. එහෙම නැති වුණොත් මම හිතන හැටියට ඒ බටහිර ප්‍රතිකාරය සාර්ථක වෙන්නේ නැහැ. සර්පයෙක් කෑවාම ප්‍රතිකාර කිරීමට යෝග්‍ය පිට රට නිෂ්පාදනය කරන anti-venomවලට වඩා අපේ රටේ නිෂ්පාදනය කර ගත්ත anti-venom වාගේ ඖෂධයක් කියා මම හිතනවා. මේක මම කියන අදහසක්. හේතුව, ඒ ප්‍රතිකාරය අපේ රටට ගැළපෙන්න ඕනෑ.

වෛද්‍යවරු හඳුනා ගැනීමේදී දේශීය වෛද්‍ය ක්‍රමය හා බටහිර වෛද්‍ය ක්‍රමය කියන එක අපට හඳුනා ගන්න වනවා. ඒ වාගේම යම් යම් රීතින් ගෙන ඒමේදීත් මෙන්න මේක ප්‍රශ්නයක් වනවා.

"හෝමියෝපති" ක්‍රමය තියෙනවා. එයත් අද අපි පිළිගත්ත වෛද්‍ය ක්‍රමයක් හැටියට සලකනවා. ඒ නිසා යම් පුද්ගලයෙක් ප්‍රතිකාර ගන්න තමන් කැමැති වෛදවරයකු වෙත යාම අපට වළක්වන්න බැහැ. ඒක ස්වාධීන අයිතියත්. යා යුත්තේ බටහිර වෛද්‍ය ක්‍රමයටද, දේශීය වෛද්‍ය ක්‍රමයටද කියන එක පුද්ගලයකුගේ ස්වාධීන අයිතියක්.

ජනාධිපතිතුමා ළඟ වෛද්‍යවරයෙක් ඉන්නවා. ඒ වෛද්‍යවරයා ලියා පදිංචි වෙලා නැහැ කියලා පසු ගිය කාලයේ විවිධ කථා තිබුණා. නමුත් මේ සභාවේම ඉන්න ගරු චම්පික ප්‍රේමදාස මන්ත්‍රීතුමා එතුමා ගැන මට යම් කාරණයක් කිව්වා. මම ඒක මේ වෙලාවේ කියනවා. ගරු චම්පික ප්‍රේමදාස මන්ත්‍රීතුමා එක්සත් ජාතික පක්ෂයේ කෙනෙක්. එතුමා මගේ කෑගල්ල දිස්ත්‍රික්කය නියෝජනය කරන්නේ.

මේ වෛද්‍යවරයා හොර වෛද්‍යවරයෙක්ය, වංචා කරනවාය කියා මාධ්‍යයේ ගොඩාක් කථා වෙනවා, නමුත් එම වෛද්‍යවරයා දක්ෂයෙක්ය කියා එතුමා මා සමඟ කිව්වාම ඒ ගැන එතුමාට තිබෙන අත් දැකීම් මොනවාද කියලා මම එතුමාගෙන් ඇහුවා. එතුමා මට කිව්වා, "මගේ දියණියට තදබල චර්ම රෝගයක් තිබුණා. ඒ චර්ම රෝගයට බෙහෙත් සොයා ගෙන මම හැම තැනම ගියා. සුව කර ගන්න බැරි වුණා. නමුත් මේ වෛද්‍යවරයාව මට මුණ ගැස්සුවා. මේ වෛද්‍යවරයාගේ ප්‍රතිකාර තුළින් මගේ දියණිය නිට්ඨාවටම සුව වුණා. ඔබතුමා මේ කථාව ඕනෑ තැනක කියන්න. පාර්ලිමේන්තුවෙත් කියන්න. මම ඒ වෛද්‍යවරයා වෙනුවෙන් ඉන්නවා" කියලා. මෙන්න මේකයි තිබෙන වෙනස ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ඒ වෛද්‍යවරයා ගැන පසු ගිය කාලයේදී මාධ්‍ය තුළින් පැය ගණන් කථා වුණා. නමුත් චම්පික ප්‍රේමදාස මන්ත්‍රීතුමා කියනවා, එතුමාගේ දියණියගේ සුව කර ගන්නට නොහැකිව සිටි චර්ම රෝගය මේ වෛද්‍යවරයාගෙන් සුව කර ගත්තා කියලා. මම මෙය වගකීමෙන් මේ පාර්ලිමේන්තුවේදී කියනවා. ඕනෑ වෙලාවක ඒ මන්ත්‍රීතුමා නැඟිටලා කියයි, මම කියන එක හරියි කියලා. මේ වෛද්‍ය ක්‍රමය තුළ මෙවැනි දේවල් තිබෙනවා. සේවා දායකයෙක් ඒ වෛද්‍ය ක්‍රමය තුළින් ප්‍රතිකාර ලබා ගන්න යනවා නම් අපට එය නවත්වන්න බැහැ.

දැන් අපි බලමු, බටහිර වෛද්‍ය ක්‍රමය. සාම්ප්‍රදායික වෛද්‍යවරයාට බටහිර වෛද්‍ය ක්‍රමය ක්‍රියාත්මක කරන්න බැහැ. අද අපේ රටේ බටහිර වෛද්‍යවරු සම්බන්ධයෙන් පෞද්ගලික වෛද්‍ය ආයතන (ලියාලිදිංචි කිරීමේ) පනත බලපානවා. ඒ වාගේම මේ රටේ හැම බටහිර වෛද්‍යවරයෙක්ම වෛද්‍ය සභාවේ ලියා පදිංචි විය යුතුයි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ රටේ 50,000ක් විතර ලියා පදිංචි නැති වෛද්‍යවරු ඉන්නවා කියලා පසු ගිය දවස්වල පුවත් පත්වල තිබෙනවා මම දැක්කා. ඒ වාගේම අපේ ගරු තිලංග සුමතිපාල මන්ත්‍රීතුමා කිව්වා, ලියා පදිංචි නැති වෛද්‍යවරු 10,000ක් විතර ඉන්නවා කියලා. සමහර විට ඒක වෙන්න පුළුවන්. මේ සඳහා අපි නීතිරීති ගෙන ආවා. ඒවා ක්‍රියාත්මක කිරීමට යෑමේදී වෛද්‍ය ආයතනය ලියා පදිංචි කළ යුතු වනවා. පනතට අනුව එසේ ලියා පදිංචි කිරීමේදී අපිට යම් යම් ප්‍රශ්න ආවා. වෛද්‍ය වෘත්තිකයන්ගෙන්ම ප්‍රශ්න ආවා, "අපේ පෞද්ගලික අංශයට හිංසා කරන්න එපා" කියලා. මොකද, ඒකේ විවිධ බලපෑම් තිබෙනවා. වෛද්‍ය ආයතන ලියා පදිංචි වීම තුළින් ඔවුන්ගේ ආදායම පිළිබඳ ප්‍රශ්නත් එනවා. ඒ නිසා මෙන්න මෙවැනි කරුණු කාරණාත් මෙම ප්‍රශ්නයේදී මතු වෙනවා.

අමාත්‍යාංශයෙන් යම් වැටලීම් කරනවා. ඒ සඳහා පැමිණිලි එන්නේ මහ ජනතාවගෙන්. මොකද, නීති විරෝධීව ප්‍රතිකාර කරන පුද්ගලයන් සම්බන්ධයෙන් මහ ජනතාවගෙන් අමාත්‍යාංශයට පැමිණිල්ලක් එනවා නම් අපිට ඒ සම්බන්ධයෙන් කටයුතු කරන්න ලෙහෙසි වනවා. එය ලැබෙන්නේ පොලීසියට වෙන්නත් පුළුවන්. නමුත් ජනතාව කියන්නේ ඒක නොවෙයි. ඔවුන් බොහෝ දුරට ප්‍රතිකාර ලබා ගන්න යනවා. හොඳ වුණොත් හොඳයි. වැරදුණොත් තමයි පැමිණිලි කරන්නේ. මෙවැනි

[ගරු ලලිත් දිසානායක මහතා]

ක්‍රමවේදයන් මේ තුළ තිබෙනවා. ඒ නිසා මේ කටයුතු ක්‍රමානුකූලව ක්‍රියාත්මක කරන්න ඕනෑ. ඒ සඳහා නීතිරීති පද්ධතියක් අද තිබෙනවා. මේ නීතිරීති පද්ධතිය තවත් සංශෝධනවලට භාජනය කරන්න අපේ අමාත්‍යාංශයෙන් සාකච්ඡා කර ගෙන යනවා. ඉදිරියේදී ව්‍යාජ ලෙස කටයුතු කරන වෛද්‍යවරුන්ට ලබා දෙන දඬුවම් ප්‍රමාණය වැඩි කිරීම, ඒ වාගේම කාලයට ගැළපෙන ආකාරයෙන් අවශ්‍ය ක්‍රමවේදයන් සකස් කිරීම වාගේ දේවල් කරන්න ඕනෑ. ඒ නිසා ගරු තිලංග සුමතිපාල මන්ත්‍රීතුමාගේ මේ යෝජනාව ඉතාම හොඳ යෝජනාවක්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විදේශ පුහුණුව ලද වෛද්‍යවරු සම්බන්ධ කාරණය ඉතාම වැදගත් දෙයක්. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමෙන් අපේ ළමයිනට කියනවා, "පිට රට ගිහිල්ලා උසස් අධ්‍යාපනය ලබා ගන්න මෙන්න මේ විශ්වවිද්‍යාල හොඳයි" කියලා. එතකොට මේ රටේ විශ්වවිද්‍යාලවල ඉඩකඩ මදි නිසා අපේ රටේ සමහර දරුවන්, පිට රට පිළිගත් විශ්වවිද්‍යාලවලට ගිහින් අධ්‍යාපනය ලබනවා. අධ්‍යාපනය ලබලා ඔවුන් මේ රටට ආවාම තවත් විශාල මුදලක් වියදම් කරලා ඒ රැකියාව කරන්න අවශ්‍ය වෛද්‍ය වෘත්තියේ පුහුණුව ලබන්න අමාරුයි. අපි මේ ගැන මානුෂිකව හිතන්න ඕනෑ. වෛද්‍ය වෘත්තියේ ගරුත්වය රැකෙන්න ඕනෑ. රජයේ ප්‍රතිපත්තිය අනුව, ලෝකයේ පිළිගත් විශ්වවිද්‍යාලවලට ගිහින් උසස් අධ්‍යාපනයක් ලබන්න උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් අනුමැතිය දීලා තිබෙනවා නම් එසේ අධ්‍යාපනය ලබලා මේ රටට ආවාට පස්සේ ඒ අයට වෙනත් බාහිර බලපෑමක් ඇති කරන්නේ ඇයි? මෙය අපි යුක්ති සහගතව හිතන්න වටිනා කාරණයක්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද 1,000ක් විතර දෙනා පිට රට ගිහින් වෛද්‍ය විභාග සමත් වෙලා ඇවිත් මේ රටේ වෛද්‍ය වෘත්තියට ඇතුළත් වන්නට බැරිව කඳුළු හෙළනවා. අම්මලා තාත්තලා බොහොම අමාරුවෙන් මුදල් උපයා ගෙන තමයි තමන්ගේ දරුවන් වෛද්‍යවරුන් කරන්න පිට රටකට යවන්නේ. ඔවුන් මේ රටට ඇවිල්ලා Act 16 කියන විභාගයට පෙනී සිට එය සමත් වන්න ඕනෑ. ඊයේ පෙරේදාත් පත්තරේ තිබුණා, මේ විභාගයට විවිධ බලපෑම් තිබෙනවායි කියලා. යම් අයට දහ පහළොස් වතාවක් මේ විභාගය ලියලාත් සමත් වන්න බැරි තත්ත්වයන් තිබෙනවා; පළිගැනීම් තිබෙනවා කියලා පැහැදිලිව කියා තිබුණා.

අන්න එම නිසා යම් ක්‍රමවේදයක් තිබෙන්න ඕනෑ. මම දකින හැටියට මේ රටේ විභාග පවත්වන්නේ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ නම් මේ විභාගත් ඒ අමාත්‍යාංශය යටතේ පවත්වන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, රුසියාවේ වෛද්‍ය විද්‍යාලයක අධ්‍යාපනය හදාරන දරුවෙකුට clinical section එකේ අත් දැකීම් අඩුයි කියා අපට කියන්න අමාරුයි. මෙවැනි අධ්‍යාපනයක් ලබා මෙරටට එන දරුවන් සම්බන්ධව විශේෂිත විභාගයක් නැතුව ඒ අත් දැකීම් ප්‍රමාණය -clinical practice - ලබා දීලා ඔවුන් මේ රටේ වෛද්‍ය සේවයට බඳවා ගන්න අපි කටයුතු කරන්න ඕනෑ. මොකද, අද අපට වෛද්‍යවරුන්ගේ හිඟයක් තිබෙනවා. වෛද්‍යවරුන්ගේ ප්‍රමාණය ගත්තාම පුද්ගලයන් 1,550කට එක වෛද්‍යවරයෙක් වාගේ තමයි අද ඉන්නේ. මෙන්න මේ තත්ත්වය නැති කර ගන්න, ඒ 1,000ක් පමණ සිටින වෛද්‍යවරුන්ගේ සේවයත් අපට ලබා ගන්න වෛද්‍ය වෘත්තියේ වෘත්තිමය තත්ත්වයන් පහළ දමන්නේ නැතුව යම් ක්‍රමවේදයක් අපි සකසන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශේෂඥ වෛද්‍ය සේවාව ගත්තොත් special medical officersලා 1,006ක් පමණ ඉන්නවා. ඇත්තටම මේ සංඛ්‍යාව ප්‍රමාණවත් මදි. මේ රටේ අද තිබෙන රෝග ගත්තාම හෘදය රෝග තිබෙනවා. හෘදය රෝග සැත්කම් සඳහා අද මාස පහක් පමණ පෝලිමේ ඉන්න ඕනෑ. එහෙම නැත්නම් පෞද්ගලිකව මුදල් වියදම් කරලා ඒ ශල්‍යකර්මය කර ගන්න ඕනෑ. ඒකට හේතුව මේ සම්බන්ධ වෛද්‍යවරුන්ගේ හිඟකම සහ අවශ්‍ය පහසුකම් අඩුකමයි. මෙන්න මේ නිසා පශ්චාත් උපාධිය ලබා ගැනීමේදී ඒ අංශයටත් ඒ අය යොමු කරවන්න ඕනෑ. නීත්‍යනුකූල නොවන වෛද්‍යවරුන් නීත්‍යනුකූල තත්ත්වයට පත් කරනවා වාගේම වෛද්‍ය වෘත්තියේ තිබෙන වෘත්තීයමයභාවය රැක ගන්න ඕනෑ. විශේෂයෙන්ම රජයේ වෛද්‍යවරයාට ඒ වගකීම තිබෙනවාය කියන එක ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා කියන්න ඕනෑ.

අපේ සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මැතිනිය එතුමියගේ කථාවේදී දර්ශකයන් සමඟ අදහස් පළ කළා. ඒ අනුව මමත් කියනවා, අද මාතෘ මරණ සංඛ්‍යාව ගත්තොත් මේ රටේ 1,00,000කට 44.5යි කියා. ඒ වාගේම ළදරු මරණ සංඛ්‍යාව ගත්තොත් 1,000කට 7.4යි. ඒ වාගේම නව ජන්ම ළදරු මරණ සංඛ්‍යාව -ඉපදිලා දවස් 28ක් තුළ සිදු වන මරණ සංඛ්‍යාව- ගත්තොත් සියයට 5.9යි. ආසියානු කලාපයේත් ඉතාම හොඳ තත්ත්වයක් අපි පවත්වාගෙන ඇවිල්ලා තිබෙන්නේ අපේ වෛද්‍ය ක්ෂේත්‍රයේ මාතෘ වෛද්‍ය අංශයේ තිබෙන හොඳ තත්ත්වයන් නිසායි. ඒ වාගේම සෞඛ්‍ය අමාත්‍යාංශය ගත්තාම අද සෑම පුද්ගලයෙක්ම එන්නත් ක්‍රම 12කින් ආරක්ෂා කරන්න කටයුතු කර තිබෙනවා.

ඉතාම හොඳ -අනර්ඝ- සෞඛ්‍ය තත්ත්වයක් අද අපි පවත්වාගෙන යන්නේ වෛද්‍යවරුන්ගේ ගුණාත්මකභාවය නිසායි; කැපවීම නිසායි. සමහර පුද්ගලයන්ගේ වග කීමෙන් තොර ප්‍රකාශ නිසා ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සිදු වන විනාශය අපි වළක්වා ගන්න ඕනෑ. ඊයේ පෙරේදා එක්තරා දිනපතා පුවත් පතක මෙන්න මේ වාගේ ප්‍රකාශයක් පළ වී තිබුණා:

> "එක් දරු මව මිය ගියේ රෝහලෙන් දුන් බෙහෙත් තත්ත්වයෙන් බාල නිසායි. ද සොයිසා රෝහලේ විශේෂඥ ශල්‍ය වෛද්‍යවරයෙක් මරණ පරීක්ෂණයේදී කියයි."

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, බෙහෙතක් සම්බන්ධයෙන් නිගමනයක් දෙන්න වෛද්‍යවරයෙකුට බැහැ. ඒ නිගමනය දීමට බෙහෙත් සම්බන්ධව පරීක්ෂා කරන ආයතනයක් තිබෙනවා. ඒ වෛද්‍යවරයා රජයෙන් පඩි ගන්නා වෛද්‍යවරයෙක්; වගකීමක් තිබෙන වෛද්‍යවරයෙක්. ඒ වෛද්‍යවරයාගේ ප්‍රකාශය නිසා මොකක්ද සිද්ධ වන්නේ? එක පැත්තකින් සමස්ත වෛද්‍යවරු කරන සේවාව හෑල්ලුවකට ලක් වනවා. තවත් පැත්තකින් සෞඛ්‍ය අමාත්‍යාංශය හෑල්ලුවකට ලක් වනවා. මේ ප්‍රකාශයෙන් දවස් කිහිපයකට පසුව කියනවා, -මේක ඉතාම වැදගත්. මොකද, පසු ගිය කාලයේ මේක කොතැනදීත් කථා වුණා.- "ද සොයිසා රෝහලේදී එක් දරු මව මිය යාම සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ පරීක්ෂණ" කියා. මේ සම්බන්ධයෙන් පරීක්ෂණයක් කරන්න කලින් අර විධියේ ප්‍රකාශ මාධ්‍ය තුළට ලබා දීම ඉතාම ඉහළ තත්ත්වයක තිබෙන සෞඛ්‍ය සේවාව පහළ තත්ත්වයකට ගෙන ඒමක් සිදු වන බව කියන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගාල්ල මහ මෝදර නොමේරු ළදරු ඒකකය සම්බන්ධයෙන් පසු ගිය කාලයේ කථා වුණා. ඒ සිද්ධියත් එහෙමයි. ළදරු මරණ සංඛ්‍යාව සම්බන්ධයෙන් විවිධ ගණන් කිව්වා. නමුත් අවසානයේදී ඒ සම්බන්ධයෙනුත් එක් කෙනෙක් කියනවා, "වාට්ටුවට විෂ බීජයක් ඇතුළු වීමක්" කියා. "දහතුන් දෙනාගෙන් බැක්ටීරියා ආසාදනයෙන් මිය ගියේ එක් දරුවකු පමණයි" කියා සෞඛ්‍ය ඇමතිතුමාට වාර්තාවක් ලබා දී තිබෙනවා. ඒ වාගේම 12 දෙනෙක් මිය ගියා; 6 දෙනෙක් මිය ගියා

කියලා කියනවා. බැක්ටීරියාවක් වාට්ටුවට ඇතුළු වීම නිසායි මරණ සිද්ධ වුණේ කියා තව කොටසක් කියනවා.

මේ නිගමන මාධ්‍ය තුළට දෙන්න කලින් වෛද්‍ය වෘත්තිකයන් හැටියට ඔවුන් තමන්ගේ වග කීම සැලකිල්ලට ගන්න ඕනෑ. තමන් පරීක්ෂණයක් කරන්නේ නැතිව, ඒ පරීක්ෂණය අවසානයේ නිගමනයට එන පුද්ගලයා තමන් බව නොදැන, ඒ සුදුසුකම් තමාට නොමැතිව මෙවැනි ප්‍රකාශ ප්‍රසිද්ධියට පත් කිරීම තුළින් වෘත්තියක් හැටියට ඉතාම ඉහළට ගෙන එන සෞඛ්‍ය ක්ෂේත්‍රය පහළට දමන්න කටයුතු කරනවා වාගේම තමන්ගේ වෘත්තීය ආචාර ධර්ම සම්බන්ධවත් යම් ප්‍රශ්නයක් මතු වෙනවා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Minister, please wind up now.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
I will wind up.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු තිලංග සුමතිපාල මන්ත්‍රීතුමා අද දින ඉදිරිපත් කරන ලද මේ යෝජනාව ඉතාම කාලෝචිත යෝජනාවක්. සුදුසුකම් නැති වෛද්‍යවරු සම්බන්ධයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශය පැත්තෙන් තවත් නීතිරීති පනවලා කටයුතු කරන්න අප බලාපොරොත්තු වෙනවා. දැනට මේ වෛද්‍යවරු සම්බන්ධයෙන් අප ක්‍රියාත්මක කරනු ලබන නීතිරීති පද්ධතිය සංකීර්ණ කරලා, විශේෂයෙන්ම පෞද්ගලික වෛද්‍ය ආයතන (ලියාපදිංචි කිරීමේ) පනතේ සංශෝධන ඇති කරලා කටයුතු කරන්න අප අදහස් කරනවා.

අපේ ගරු සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මන්ත්‍රීතුමිය කිව්ව ආකාරයට මෙහිදී වෛද්‍යවරුන්ගේ පැත්තෙන් සහයෝගයත් අවශ්‍ය වෙනවා. මේ දෙගොල්ලන්ම සහයෝගය දුන්නොත් මෙය සාර්ථකව ක්‍රියාත්මක කරලා බටහිර වෛද්‍ය ක්‍රමවේදය තුළත්, වෙනත් වෛද්‍ය ක්‍රම තුළත් ඉන්න සුදුසුකම් හා අත් දැකීම් නොමැති වෛද්‍යවරුන් ඒ වෛද්‍ය ක්‍රම තුළින් අයින් කරලා ජනතාව ආරක්ෂා කර ගන්න අපට හැකියාව, ශක්තිය ලැබෙනවා කියන එක ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා. ස්තුතියි.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Finally, I call upon the mover of the Motion to speak. You can speak for two or three minutes.

[අ.භා. 3.57]

**ගරු තිලංග සුමතිපාල මහතා**
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මන්ත්‍රීතුමිය මෙම විවාදයට සහභාගි වෙලා අදහස් ඉදිරිපත් කිරීම ගැන මා සන්තෝෂ වෙනවා. එතුමියගේ අත් දැකීම්, මේ වෘත්තියේ තිබෙන ගෞරවය යන සියල්ල එතුමිය පැහැදිලි කළා. අනාගතයේදී අපේ වෛද්‍ය වෘත්තිය ආරක්ෂා කර ගැනීම සඳහා එතුමිය ඉදිරිපත් කරපු අදහස් ඉතාම යෝග්‍යයි කියලා මා හිතනවා. ඒ වාගේම අපේ ගරු (වෛද්‍ය) රෝහණ පුෂ්පකුමාර මන්ත්‍රීතුමා එතුමාගේ අත් දැකීම් අනුව යම් යම් කරුණු ඉදිරිපත් කළා. දුෂ්කරතාවන් තිබෙන ප්‍රදේශවලට වෛද්‍ය වෘත්තිය අවශ්‍ය වුණත්, ප්‍රමාණවත් සුදුසුකම් ඇති වෛද්‍යවරු නැති අවස්ථාවල කරපු දේවල් ගැනත් එතුමා සඳහන් කළා.

විශේෂයෙන්ම එතුමා estate medical assitantsලා ගැන කිව්වා. ඒ කියන්නේ වතු යායන්වල ඉන්න අය මුහුණ පාන ප්‍රශ්න පිළිබඳව. අපේ සෞඛ්‍ය නියෝජ්‍ය ඇමතිතුමා අවසාන වශයෙන් කරපු කථාව ගැන මම සන්තෝෂ වෙනවා. එතුමාගේ විශේෂ අවධානය, ඒ වාගේම ගරු ඇමතිතුමාගේ විශේෂ අවධානය යොමු කරලා මේ වෘත්තියේ ගෞරවය රැක ගන්න අලුත් නීති පද්ධති සකස් කිරීම සඳහා දැනටමත් ක්‍රියාත්මක වෙමින් පවතින දේ කඩිනම් කරන බව එතුමා ප්‍රකාශ කළා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම මෙහි අරමුණ මා කියන්න ඕනෑ. අපේ ලංකාවේ වෛද්‍ය වෘත්තිය ඉතාම ශ්‍රේෂ්ඨ, ගෞරවණීය දෙයක්. අපට මතක හැටියට යුද්ධය පැවතුණු කාලයේ කෙටි කාලයක් ඇතුළත හිසේ සැත්කම් - operations - වැඩිම ප්‍රමාණයක් කරලා තිබෙන්නේ අනුරාධපුරය රෝහලේයි. ඒ කියන්නේ අවුරුදු 10ක් වාගේ කාලයක් ඇතුළත ලෝකයේ වැඩිම ශල්‍යකර්ම ප්‍රමාණයක් කරපු ආරෝග්‍ය ශාලාවක් හැටියට තිබෙන්නේ අනුරාධපුර ඉස්පිරිතාලයයි. මොකද යුද්ධය නිසා වෙච්ච දරුණු ප්‍රශ්නවලදී, තුවාල වෙච්ච අවස්ථාවලදී අපේ වෛද්‍ය කණ්ඩායම් දිගින් දිගටම ඒ වාගේ සජීව වැඩ කරන්න පුළුවන් තත්ත්වයකට පත් කර ගන්න ලෙහෙසි වන්නේ නැහැ. යුද්ධයක් පවතින්න ඕනෑ; ආරෝග්‍ය ශාලාවක් තිබෙන්න ඕනෑ; දහස් ගණනක් එන්න ඕනෑ. ඒ අත් දැකීම තිබෙන, අද ලෝකයේ වැඩිම ප්‍රමාණයක් ඒ සඳහා ක්‍රියාත්මක වෙච්ච ඉස්පිරිතාලය තිබෙන, දක්ෂ වෛද්‍යවරුන් ඉන්න රටක අපි ජීවත් වෙනවා. ඒ ගැන කිසිම තර්කයක් නැහැ. ඒ, අපේ අයගේ හැකියාව, දක්ෂතාව සහ දැනුම ගැන.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, නමුත් යුද්ධයෙන් පස්සේ මේ රටේ වර්තමානයේ ඇති වෙලා තිබෙන තත්ත්වය මත, නිදහස මත, අලුත් අවස්ථා මත රට පුරා විසිරිච්ච වෛද්‍ය වෘත්තිය නිසා අපේ ජනතාව යන නොයෙකුත් ස්ථානවලට මේ වෛද්‍යවරුන්ගේ අවශ්‍යතාව වැඩි වෙලා තිබෙනවා. ඒ අවශ්‍යතාවට සාපේක්ෂිතව වෛද්‍යවරු ප්‍රමාණය අඩුයි කියලා අප හැමෝම දන්නවා. මේ නීති විරෝධී පුද්ගලයන් ඒ අවස්ථාවෙන් ප්‍රයෝජනය ගන්නවා. ඒ නිසා මම නැවතත් ඔබතුමාට සඳහන් කරන්නේ මේ කාරණයයි. "අපේ නීතිය අනුව සෑම වෛද්‍ය නිලධාරියෙකුටම වෛද්‍ය සභාව විසින් නිර්දේශිත වර්ණ ලාංඡනයක් ඇත. එනම් බටහිර වෛද්‍යවරයකු සඳහා රතු පැහැයද, ආයුර්වේද වෛද්‍යවරුන් සඳහා කොළ පැහැති ලාංඡනයක්ද, හෝමියෝපති වෛද්‍යවරු සඳහා නිල් පැහැති ලාංඡනයක්ද නියම කර ඇත. යම් කිසි වෛද්‍යවරයකු හට ඉහත කී වර්ණයකින් යුත් ලාංඡනයක් නොමැති නම් ඔහු නීති විරෝධී වෛද්‍යවරයකු ලෙස සැලකේ." මේ වාගේ නීති පද්ධති හැම තැනම තිබෙනවා. නමුත් ඒවා ක්‍රියාත්මක වන්නේ නැහැ ගරු සෞඛ්‍ය නියෝජ්‍ය ඇමතිතුමනි. "මම මෙවැනි සුදුසුකමක් තිබෙන, මෙවැනි කෙනෙක්" කියලා ඔහු ප්‍රතිකාර දෙන තැන ප්‍රසිද්ධියේ ප්‍රචාරය කර තිබෙනවා නම් අපට ප්‍රශ්නයක් නැහැ. එහෙම ප්‍රචාරය කරලා තිබෙනවා නම්, සේවාදායකයකු එම වෛද්‍යවරයා ළඟට යන්නේ එම වෛද්‍යවරයා ගැන දැනුමක්, අවබෝධයක් ඇතිවයි. නමුත් "වෛද්‍යවරුන්" යයි කියා ගෙන වෛද්‍ය වෘත්තිය ජනතාව නොමඟ යවන කූට ව්‍යාපාරයක් කර ගෙන වංචනික ලෙස කටයුතු කරන වෛද්‍යවරුන්ගෙන් අප නිදහස් විය යුතුයි කියන හුදු මතයේ සියලුම ගරු මන්ත්‍රීතුමන්ලා සිටීම ගැන අපි සතුටු වනවා.

මෙම යෝජනාව සම්බන්ධයෙන් සහයෝගය දක්වමින් කථා කළ සියලු දෙනාටමත්, නියෝජ්‍ය අමාත්‍යතුමාටත් මා ස්තුතිවන්ත වනවා. අපේ මේ දැහැමි රටේ අප බලාපොරොත්තු වන

[ගරු තිලංග සුමතිපාල මහතා]

සංවර්ධනය ඇති කිරීමේ කාර්යයේ යෙදී සිටින, අනාගතයේ දී වෛද්‍ය වෘත්තියට බැඳෙන දහස් ගණන්, ලක්ෂ ගණන් දරුවන්ට මෙම වෘත්තියේ ගෞරවය රැක ගනිමින් කටයුතු කරන්නට පුළුවන් ආකාරයට ඒ සඳහා අවශ්‍ය පසුබිම - සුදුසු වාතාවරණය - හදන්න ක්‍රියාත්මක වන්න කියන ඉල්ලීම කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, තව එක කාරණයක් ගැන මා නැවත වරක් සඳහන් කරන්නට කැමැතියි. ඒ තමයි ලංකාවෙන් වෙනත් රටවලට ගොස් වෛද්‍ය විභාගය සමත් වී එම රටවලම වෛද්‍යවරුන් විධියට කටයුතු කරන අය සිටිනවා කියන එක. ඒ අයට විභාග සමත් වුණාට පසුව නැවතත් ඉක්මනින් ලංකාවට එන්න හැකියාවක් නැහැ. ඒ ගැන මට අවබෝධයක් තිබෙනවා. ඒ කාරණය ඇත්ත. ඒ නිසා ඒ අයට තාවකාලික පදනමෙන් හරි යම් කිසි සහතිකයක් දීලා ලංකාවේ මෙම වෘත්තිය සඳහා යොදවා ගැනීමේ හැකියාවක් තිබෙනවා නම් හොඳයි. මොකද, මෙම වෘත්තිය සඳහා ඒ තරම් විශාල ඉල්ලුමක් තිබෙනවා. ගරු ඇමතිතුමා ඒ ගැන යම් ක්‍රමවේදයක් අනුගමනය කරනවා නම් හොඳයි. උගතුන් එක්ක වැඩ කරනකොට ඔබතුමන්ලාට ඇති වන ප්‍රශ්න ගැනත් මා දන්නවා. ඒ සඳහා යම් විසඳුමක් සොයා ගන්න කියන කාරණය නැවතත් සඳහන් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## කාදි අධිකරණ පද්ධතියට නිසි ස්ථානය ලබා දීම
## காதி நீதிமன்ற முறைமைக்கு உயர்ந்த இடத்தைப் பெற்றுக்கொடுத்தல்
## GRANTING A HIGHER POSITION TO THE QUAZI COURT SYSTEM

[4.03 p.m.]

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Bismillahir Rahmanir Raheem.

Mr. Deputy Chairman, I move:

"That this Parliament is of the opinion that the Quazi Court System that was established in Sri Lanka under the Muslim Marriage and Divorce Ordinance of 1929 and subsequently amended under the Muslim Marriage and Divorce Act in 1951 must be upgraded with powers vested with the Quazi judges to adjudicate upon all matters concerned with disputes arising in Muslim families and also the status of the Quazi Court System must be upgraded in such a manner where sittings be held in premises congenial to the dignity of the system and as the Quazi judges are appointed by the Judicial Service Commission they should be placed on a respectable and an acceptable salary structure payable to other judicial officers."

Sir, the Sri Lankan State is very unique in that the religious injunctions of the Holy Quran practised by the Muslims throughout the world and even in Sri Lanka are embodied in our Constitution. They are part of our Constitution. This, evidently, is not there to be seen in certain other countries. That is why we call Sri Lanka a unique State in the entire world.

The atmosphere of tolerance and co-existence that prevails in Sri Lanka is symbolized by the Quazi Court System that was established in the 1930s. The Quazi Court System has helped to preserve in Sri Lanka, the religious laws and customs of the Muslims, which had been protected and applied by the Sinhalese Kings and even the Dutch and the British rulers after they took control of certain parts of Sri Lanka in the 18th, 19th and 20th Centuries.

It was the decision of the Supreme Court in The King versus Miskin Ummah NLR - Vol. 26 P.330, holding that a Muslim marriage can only be terminated at the instance of the wife by the District Court, and that the practice of a married woman or her father appointing a Quazi for this purpose had no legal effect, that first led to agitation by the Muslims for the reform of the law. This agitation resulted in the appointment of a Select Committee by the British in the Legislative Council to make suggestions with regard to the reform of the existing law. The Committee chaired by Justice M.T. Akbar, the then Acting Attorney-General, also included the Mr. N.H.M. Abdul Cader, Member, State Council, Mr. H.M. Macan Markar, later Sir Mohamed Macan Markar, Member of the Legislative Council and also Dr. T.B. Jayah, that great educationist and national leader, and five others who were non-Muslims.

The Committee recommended the establishment of Quazi Courts with original jurisdiction, and a Board of Quazis with appellate jurisdiction to deal with matrimonial disputes among the Muslims of Sri Lanka, and the enactment of the Muslim Marriage and Divorce Registration Ordinance of 1929. Since the system established by the above-mentioned legislation did not work smoothly, the then Governor appointed a Committee in 1939 to consider further amendments to the law. This Committee consisted of the Registrar-General, who was its ex-officio Chairman, and leading Muslims such as Justice M.T. Akbar, then a retired puisne Judge, Dr. T.B. Jayah and Advocate M.I.M. Haniffa, an Islamic scholar of fame, who has written several books to his credit. The book written by him, "A Short Catechism of the First Teachings of Islam", which we also used as a text book in college, was co-authored by Allama Abdul Aleem Siddique Al-Qadiri, who was world famous, and was called a "Rowing Ambassador of Islam". This Committee made far-reaching recommendations, which resulted in the enactment of the Muslim Marriage and Divorce Act, No. 13 of 1951. The present Quazi Court System is governed by this legislation.

The decision of the Supreme Court in Jailabdeen versus Danina Ummah, NLR - Vol. 64 P.419, the Hon. Minister of Justice knows very well, which held that the

provisions of the Act dealing with the appointment of Quazis and Members of the Board of Quazis, was inconsistent with the Constitution and made it necessary to amend the Act in 1965, to vest the power of appointment in the Judicial Service Commission.

Although several other amendments were made to the Act in the 1950s and 1960s, and one further amendment was made in 1975, there was much agitation for further reform to deal with the issues and challenges faced by the litigants, in particular the women who had to undergo untold sufferings due to deficiencies in the law.

Sir, yesterday was the International Women's Day and our First Lady graced the occasion. The Attorney-General, Hon. (Mrs.) Eva Wanasundera made a very illuminating speech at this International Women's Day Celebration held at "Temple Trees" She said: "මෙම වසරේ කාන්තා දිනය ලොව අන් රටවලට සැමරුම් දිනයක් ලෙස පමණක් විශේෂ වූවාට, ඊට අමතරව මෙම වසර ශ්‍රී ලංකාවට ඉතාමත් තීරණාත්මක ලෙස වැදගත් වනවා. විශේෂයෙන්ම ශ්‍රී ලංකා ඉතිහාසයේ ප්‍රථම වතාවට සමස්ත නීති ක්ෂේත්‍රයේම කාන්තාවන් විසින් පදවනු ලබන තොටිල්ලක් යැයි මා කිවහොත් එය අතිශයෝක්තියක් නොවේ. නීති ක්ෂේත්‍රයේ අග්‍රම කිරුළ වන අග්‍ර විනිශ්චයකාර තානාන්තරයත්, රජයේ ප්‍රධාන නීති දරන නීතිපති ධුරයත්, නීතිය කෙටුම්පත් කරන නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවේ කෙටුම්පත් ධුරයත් සහ අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් ධුරයත් යන සියලුම වගකීම් භාරව අද කටයුතු කරන්නේ කාන්තාවන්ය. අද කාන්තාවක් ලෙස මා ඔබ වෙතට මේ රටේ නීතිපති ලෙස පැමිණ ආමන්ත්‍රණය කරන්නේ හදපිරි සතුටින්."

It was a very enlightened and very fine speech. I also take pride in the fact that I was one of the signatories as a Member of the Parliamentary Council in appointing her as the Attorney-General and the Chief Justice as well as other respective officers.

Here, I must point out that even Muslim women, due to certain circumstances, suffer when they go to the Quazi Courts. That must be looked into deeply. Even a Muslim country like Albania has inquired from us as to how we are dealing with such situations. I, as the Hon. Minister, told the Speaker of the Albanian Parliament, Jozefina Topalli how we are dealing with this aspect of Islamic law.

